# වාර්ෂික වාර්තාව - 2012

50

Ceylon Petroleum Corporation - 50th Anniversary

1962 - 2012











## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# 2011

# වාර්ෂික වාර්තාව

# පටුන


| විස්තරය | පිටුව |
|---|---|
| අපගේ දැක්ම | 01 |
| සංස්ථාපිත තොරතුරු | 02 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර මණ්ඩලය | 03 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 04 - 09 |
| කළමනාකාර අධ්‍යක්ෂක සමාලෝචනය | 10 - 16 |
| ආකලිත වටිනාකම් ප්‍රකාශය | 17 |
| මූලික කරුණු | 18 |
| සංස්ථාපිත යහපාලනය | 19 - 23 |
| මූල්‍ය ප්‍රකාශන | 24 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 25 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 26 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 27 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 28 |
| වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 29 - 45 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 46 - 58 |
| වසර 10 ක සංක්ෂිප්තය | 59 - 60 |
| විගණකාධිපති වාර්තාව | 61 - 85 |
| කෙටි යෙදුම් | 86 |

## අපගේ දර්ශනය

පාරිභෝගිකයාට මුල් තැන ලැබෙන්නා වූද පාරිසරික හිතකාමී වූද, කලාපයේ ඛනිජ තෙල් හා ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ ව්‍යාපාරය බවට පත්වීම හා ඒ අතරම අපගේ ජාතියේ සෞභාග්‍ය උදෙසා දායකත්වය සැපයීම.

## අපගේ මෙහෙවර

ඛනිජ තෙල් පිරිපහදු කිරිම හා උසස්ම තත්වයේ නිෂ්පාදන අලෙවි කිරිම පිළිබඳ විශිෂ්ඨත්වය කරා ලඟාවීමේ අභිලාශය මුදුන්පත් කර ගැනීම සඳහා කැපවුන එම ක්ෂේත්‍රයේ නිපුණතා ඇති වෘත්තිකයන් කණ්ඩායමක් හා පක්ෂපාති, කාර්යක්ෂම බෙදාහරින්නන් ජාලයක මාර්ගයෙන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉහළින්ම ඉටුකෙරෙන පූර්ණ විසඳුම් හා සේවාවන් සැලසීම සම්බන්ධයෙන් විශිෂ්ඨත්වය සාක්ෂාත්කර ගැනීම මෙන්ම සේවක සහභාගිත්වය හා උසස් තාක්ෂණය උපයෝගි කර ගනිමින් ව්‍යාපාරයේ සංවර්ධනය උදෙසා උසස්ම ආචාරධර්ම වලට අනුකූලව සෞඛ්‍ය, ප්‍රවේශම හා පාරිසරික යන අංශ කෙරෙහි ඉහළින්ම සැළකිලිමත් වෙමින් ව්‍යාපාරික හවුල් කරුවන්ගේ අභිමතාර්ථයන් මුදුන්පත් කිරිම.

# සංස්ථාපිත තොරතුරු

## අධ්‍යක්‍ෂ මණ්ඩලය

### සභාපති සහ කළමනාකාර අධ්‍යක්‍ෂ

දේශමාන්‍ය ඩී.එච්.එස්. ජයවර්ධන මයා (2012.01.13 දක්වා)
වසන්ත ඒකනායක මයා (2012.01.14 - 2012.02.23) - (වැඩබලන)
ඩී. විදානගමච්චි මයා (2012.02.24 - 2012.08.09) - (වැඩබලන)
තිලක් කොල්ලුරේ මයා (2012.08.10 සිට) - සභාපති

### කළමනාකාර අධ්‍යක්‍ෂ

එල්.ඊ. සුසන්ත සිල්වා මයා - අධ්‍යක්‍ෂ (2012.04.11 සිට)
කළමනාකාර අධ්‍යක්‍ෂ (2012.06.01 සිට)

### අධ්‍යක්‍ෂවරු

සන්ධ්‍යා විජයබණ්ඩාර මිය
ආචාර්ය හාන්ස් විජේසූරිය මයා (2012.08.10 සිට)
එස්. පුෂ්පා වෙල්ලප්පිලි මිය (2012.08.10 සිට)
මෙත්සිරි විජේගුණවර්ධන මයා (2012.01.01 - 2012.08.09)
චම්පිකා දිල්හාරා අමරසේකර මිය (2012.01.01 - 2012.08.09)
ලක්ෂ්මන් ගුණවර්ධන මයා (2012.01.01 - 2012.08.09)
එච්.ඩී.බී. සමන් කුමාර මයා

### විගණකවරු

විගණකාධිපති

### ලියාපදිංචි කාර්යාලය

අංක. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09

| | | |
|---|---|---|
| දුරකථන | : | 011 - 5455455 (මාර්ග 10) |
| විදුලි පුවත් | : | "ලංකා ඔයිල්" |
| විදේශ විදුලි පුවත් | : | "සිපෙට්කෝ" |
| ටෙලෙක්ස් | : | 221235 සිපෙට්කෝ - සීඊ |
| ෆැක්ස් | : | 011 - 5455400 |
| ඊ මේල් | : | cpcsec@ceypetco.gov.lk |
| වෙබ්සයිට් | : | www.ceypetco.gov.lk |

### බැංකුකරුවෝ

මහජන බැංකුව
ලංකා බැංකුව
සේෂන්ස් ට්‍රස්ට් බැංකුව
කොමර්ෂල් බැංකුව
හැටන් නැෂනල් බැංකුව

## ජ්‍යෙෂ්ඨ කළමනාකාර මණ්ඩලය

**තිලක් කොල්ලුරේ**
සභාපති

**එල්.ජී. සුසන්ත සිල්වා**
කළමනාකාර අධ්‍යක්ෂ

**එන්.ආර්.ආර්. ජයසේකර**
පිරිපහදු කළමනාකාර

**ඒ.ආර්. ඒබල්**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි)

**ඩබ්. සරත් පෙරේරා**
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

**එන්.ආර්. අමරසිංහ**
නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර
(නිෂ්පාදන සහ මෙහෙයුම්)

**ආර්.ටී.ඒ. දාබරේ**
මුදල් කළමනාකාර

**සී.පී. සමරවීර**
වානිජ කළමනාකාර

**මේජර් එම්.ආර්.එස්.පී. සමරසිංහ**
කළමනාකාර (ආරක්ෂක)

**ඩබ්.එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ**
කළමනාකාර අලෙවි
(ලිහිසි තෙල් හා සම්පීඩිත දියර වායු)

**එස්.එම්.සී.පී. සමරකෝන්**
කළමනාකාර අලෙවි (සිල්ලර)

**එම්.ඒ.ඩී. මල්ලිකාරච්චි**
ක්‍රියාකරවුම් කළමනාකාර (ගුවන් තෙල්)

**එස්. මැදිගොඩැල්ල**
වැඩබලන කළමනාකාර (කෘෂි රසායන)

**එස්.ඩබ්. ගමගේ**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මානව සම්පත් හා පාලන)

**පී.ඒ.එස්.පී. ගුණවර්ධන**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(සැලසුම් හා සංවර්ධන)

**එන්.එන්.අයි.ආර්. ප්‍රනාන්දු**
නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර
(තාක්ෂණික සේවා)

**බී.එච්.ටී. කුලසේකර**
නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර
(නඩත්තු හා ව්‍යාපෘති)

**ආර්.ඒ.කේ.සී. ආරියරත්න**
ප්‍රධාන නීති නිලධාරි

**සමන්ත පුෂ්පලාල් විතාන**
මානව සම්පත් කළමනාකාර

**එම්.කේ. ගරුසිංහ**
කළමනාකාර (සංවර්ධන)

**එම්.එස්.කේ. ප්‍රනාන්දු**
කළමනාකාර (තොරතුරු තාක්ෂණ)

**එස්.ඩී.එස්. රාජපක්ෂ**
කළමනාකාර (සැපයීම්)

**පී.පී.කේ. විජේකෝන්**
කළමනාකාර (ඉංජිනේරු හා පාරිශ්‍ර)

**වයි.එම්. තිලකරත්න**
නියෝජ්‍ය කළමනාකාර (අභ්‍යන්තර විගණන)

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වන වගන්තිය ප්‍රකාර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්තාව සතුටින් යුතුව ඉදිරිපත් කරනු ලැබේ.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස ඛනිජ තෙල් (බොරතෙල්) ආනයනය, පිරිපහදු කිරීම, ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ශ්‍රී ලංකාව තුල අලෙවි කිරීම හා බෙදාහැරීම ආදිය හැඳින්විය හැකිය.

## ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගමක් වන ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මගින් (CPSTL) ඛනිජ තෙල් ගබඩා කිරීම හා බෙදාහැරීමේ පහසුකම් සැලසීම හා තොරතුරු තාක්‍ෂණ සේවා සැපයීම් ආදි ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 2/3 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු නවදෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් අධ්‍යක්ෂවරු හයදෙනෙක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලබයි.

## වසරේ කාර්ය සාධනය සමාලෝචනය

සංස්ථාවේ කාර්ය සාධනය හා ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධයෙන් සිදුකරන ලද විස්තර පිටු අංක. 10 සිට 16 දක්වා ඇති කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනයේ සඳහන් වේ.

## අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

අවදානම් කළමනාකරණය සංස්ථාපිත වගකීමක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සලකයි. මෙම අරමුණින් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඵලදායි හා විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සංස්ථාව තුළ පිහිටුවා එය ක්‍රියාවේ යොදවා ඇත. සංස්ථාව නිරාවරණය විය හැකි අවදානම් ලිහිල් කිරීම සහ භෞතික සම්පත් සාවද්‍ය ලෙස වාර්තා කිරීම හෝ අස්ථානගත වීමට එරෙහිව නිශ්චිත නොවුනද සාධාරණ සුරක්ෂිතභාවයක් ලබාදීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කර නැවත ස්ථාපිත කර තිබේ.

අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් සංස්ථාවේ වත්කම් ආරක්‍ෂා සහිත බවටත්, සමස්ථ ගණුදෙනු අධිකාරි බලයකින් යුතුව නිවැරදි ලෙස වාර්තාගත කොට ඇති බවටත් සහ ප්‍රමාණාත්මක වැරදි හා අක්‍රමිකතා වළක්වා ඇති බවට හෝ සාධාරණ කාල සීමාවක් තුළ අනාවරණය කර ගත හැකි වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සාධාරණ සහතික වීමක් ලබාදෙනු ඇත. ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් සංස්ථාව තුළ පවත්නා බවටත්, සංස්ථාවේ වත්කම් ආරක්‍ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ඵලදායි බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සැහීමකට පත්ව සිටියි.

**සංස්ථාපිත යහපාලනය**

අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායි සංස්ථාපිත යහපාලන ව්‍යුහයක් හා ක්‍රියාවලියක් පවත්වාගෙන යාමට කැපවී සිටියි. සංස්ථාවේ මූල්‍යමය, මෙහෙයුම්ගත හා අනුකූල කාර්යයන් සංස්ථාපිත යහපාලන භාවිතයන් තුළ පිහිටා ඵලදායි ලෙස හසුරුවමින් පාලනය කරනු ඇත. විවිධ නියාමන ආයතනයන් මගින් නිකුත් කොට ඇති සංස්ථාපිත යහපාලන නීති හා රෙගුලාසි වලට සංස්ථාවේ පරිපාටින් හා භාවිතයන් අනුකූල බවට මෙම වාර්තාවේ පිටු අංක. 19 සිට 23 දක්වා ඇති ආයතනික යහපාලන වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇත.

**මානව සම්පත්**

ව්‍යාපාරික දර්ශනය හා මෙහෙවර යථාර්ථයක් බවට පත්කළ හැකි ආකාරයේ මානව සම්පතෙහි වටිනා දායකත්වය සංස්ථාව හඳුනාගෙන තිබේ. සංස්ථාපිත ඉලක්ක සහ අරමුණු ලඟාකර ගැනීම වෙනුවෙන් තම දායකත්වය ඉහලම ආකාරයෙන් ලබා දීම පිණිස අගනා මානව ප්‍රාග්ධනයක් ශක්තිමත් කිරීම සඳහා විවිධ පියවර ගෙන තිබේ.

දේශීය හා විදේශීය පුහුණුව මඟින් සේවකයන්ගේ දැනුම සහ නිපුණතා අඛණ්ඩ වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් අවස්ථා සෑම කාණ්ඩයකම සේවකයින්ට ලබා දීම අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය මඟින් අවධාරණය කරයි.

**විගණන කමිටුව**

විගණන කමිටුව එහි සභාපතිවරයා ද ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2000 මාර්තු 15 වන දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක. PF/PE 7 මගින් පැහැදිලිව අර්ථ දක්වා ඇති විෂය ක්ෂේත්‍රය ඇතුලත (Term of Reference) විගණන කමිටුවේ විෂය පථය ක්‍රියාත්මක වේ.

**උප කමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරි ක්‍රමවත් ආකෘතියකට අනුව ඉටුකිරීම සඳහා ප්‍රධාන උපකමිටු 5 ක් ක්‍රියාත්මක වේ. සංස්ථාවේ ප්‍රධාන කටයුතු සඳහා ප්‍රධාන මාර්ගෝපදේශක සේවා ලබාදීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන උපකමිටු වන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව, විගණන කමිටුව, තාක්‍ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුවයි. මෙම වාර්තාවේ පිටු අංක. 19 සිට 23 දක්වා ඇති සංස්ථාපිත යහපාලන වාර්තාවේ මෙම උපකමිටු පිළිබඳ සවිස්තරාත්මකව කරුණු දක්වා ඇත.

**ගණකාධිකරණ ප්‍රතිපත්තීන්**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මෙම වාර්තාවේ පිටු අංක. 29 සිට 45 දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනස් වීමක් සිදුවී නොමැත.

**මූල්‍ය කාර්යසාධනය**

සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන්නේ ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් හා ගුවන්යානා තෙල් යනාදී ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පදනයන් අලෙවියෙන් ජනනය වන ආදායමයි. ආශ්‍රිත සමාගමේ ප්‍රධාන ආදායම වන්නේ අලෙවි සමාගම් වෙත ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිතයන් සැපයීමෙන් ලබාගන්නා මෙහෙයුම් ආදායම (Throughput) හා ප්‍රවාහන ආදායමයි. පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 350,442 සමඟ සැසඳීමේදී 2012 වර්ෂයේ සංස්ථාවේ දළ ආදායම රු. මිලියන 512,910 ක් විය.

**පිරිවැටුම**

පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 356,442 ට සාපේක්ෂව මෙම වර්ෂයේ පිරිවැටුම රු. බිලියන 512.910 ක් වූ අතර, එය 43% ක වර්ධනයක් පිළිබිඹු කරයි. වර්ෂය තුළ මුළු පිරිවැටුම දේශීය විකුණුම් වලින් 97.31% ක් හා වක්‍ර අපනයනයන් ගෙන් 2.69% ක් ලෙස වාර්තා වේ. දේශීය පිරිවැටුමෙහි ප්‍රධාන සංරචකයන් ලෙස ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් හා දැවිතෙල් අලෙවියෙන් ලද දායකත්වය දැක්විය හැක.

**ලාභ/ ආලභ**

පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 94,503 ක අලාභය හා සැසඳීමේදී 5.13% ක පහළ යාමක් පිළිබිඹු කරමින් 2012 වර්ෂයේ රු. මිලියන 97,308 ක අලාභයක් වාර්තා කරන ලදී. කෙසේ වෙතත් ලෝක වෙළඳපළේ ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල වෙනස් වීම් වලට අනුරූපීව දේශීය වෙළඳපළේ ඛනිජ තෙල් නිෂ්පාදන වල මිල ගණන් සංශෝධනය නොකිරීම හේතුවෙන් අලාභය අඛණ්ඩව ඉහළ මට්ටමක පවතී. ලෝක වෙළඳපළේ පැවති ඉහළ ඛනිජ තෙල් මිල ගණන් හේතුවෙන් 2012 වර්ෂයේ දේශීය වෙළඳපළේ ඛනිජ තෙල් නිෂ්පාදන වල මිල සංශෝධනය කිරීමට සිදුවිය. 2012 පෙබරවාරි 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය වෙළඳපළ තුළ පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් මිල ගණන් පිළිවෙලින් ලීටරයකට රු.12/-, රු.31/- සහ රු.35/- බැගින් ඉහළ නංවන ලදී. 2012 දෙසැම්බර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි, දේශීය වෙළඳපළේ පෙට්‍රල් සිල්ලර මිල ලීටරයට රු.10/- ලෙස නැවත වැඩි කරන ලදී. 2012 වර්ෂය සඳහා වන මුළු කාණ්ඩගත අලාභය සමඟ සැසඳීමේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දරන ලද ඉතා විශාල අලාභයට හේතු වුයේ, විදුලි උත්පාදනය සඳහා සහනාධාර මිල ගණන් යටතේ ඔටෝ ඩීසල්, දැවි තෙල් සහ නැප්තා අලෙවි කිරීමයි.

2012 වර්ෂයේ දී ඛණ්ඩගත අලාභය පහත පරිදි වේ.

| **ඛණ්ඩය** | **අලාභය රු. මිලියන** |
|---|---|
| **ප්‍රවාහන** - සහනාධාර මිලට ඩීසල් සැපයීම | (32,506.926) |
| **විදුලිබල උත්පාදනය** - සහනාධාර මිලට නැප්තා හා දැවිතෙල් සැපයීම | (53,756.765) |
| **ගුවන් ගමන් කටයුතු** - ඉහළ සහනාධාර මිලකට JET A - 1 සැපයීම | (336.109) |
| **කර්මාන්ත** - දැවිතෙල් හා කාර්මික භූමිතෙල් සැපයීම | (3,270.729) |
| **දේශීය** - LPG හා භූමිතෙල් සහනාධාර මිලකට සැපයීම | (3,901.812) |
| **ගොවිතැන්** - කෘෂි රසායන සැපයීම | (2.289) |
| **අපනයන** - නැප්තා හා දැවිතෙල් | (113.560) |

ඉහත සඳහන් හේතු ප්‍රකාරව ඉහල අලාභයක් තිබියදීත් සුපර් පෙට්‍රල්, සුපර් ඩීසල්, ඇව්ගෑස්, ලිහිසි තෙල්, තාර අලෙවියෙන් ලැබූ ලාභය රු. මිලියන 1,770 ක් වූ අතර, එය ඉහතින් සඳහන් අලාභයට අනුව ගැලපීමෙන් සමුච්චිත අලාභය අඩුවීම කෙරෙහි ධනාත්මක ලෙස දායකවී තිබේ. රු. මිලියන 2,794 ක් දක්වා ලැබූ ආදායම සමඟ සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ මුළු අලාභය රු. මිලියන 97,303 ක් දක්වා සීමා කිරීමට හැකියාව ලැබිණි.

ජාත්‍යන්තර වෙළඳපළේ බොරතෙල් මිල ගණන් 2012 වර්ෂයේදී ඉහළ ගියේය. 2011 වර්ෂය සමඟ සසඳන කළ බොරතෙල් මිල ගණන් බැරලයකට ඇ.එ.ජ. ඩොලර් 109 දක්වා ගිය අතර, එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2.5% ක ඉහළ යාමකි. තෙල් නිෂ්පාදනය කරන රටවල හා උතුරු අප්‍රිකානු රටවල පවතින දේශපාලන සහ ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් තෙල් සැපයීමට සහ ජාත්‍යන්තර ඛනිජ තෙල් සහ බොරතෙල් මිල ඉහළ යාම කෙරේ බලපාන්නට විය. 2012 වර්ෂය තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කළ බොරතෙල් සඳහා සාමාන්‍ය මිල 5.6% න් ඉහළ ගිය අතර, එය බැරලයකට ඇ.එ.ජ. ඩොලර් 115 ක් විය.

ප්‍රවාහන හා විදුලිබල උත්පාදන අංශයන්ගේ පැවති ඉහළ ඉල්ලුම හේතුවෙන් 2012 වර්ෂයේ දී ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදිතයන්හි පාරිභෝජනය ඉහළ ගියේය. පෙර වර්ෂය හා සැසඳීමේ දී 10% න්, 4% න් සහ 57% කින් පෙට්‍රල්, ඔටෝ ඩීසල් හා සුපර් ඩීසල් විකුණුම් ප්‍රමාණයන්ගේ අලෙවිය වැඩි වන්නට විය. මේ හා සම්බන්ධ විශ්ලේෂණය 2012 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ සටහන 01 ලෙස දක්වා ඇත.

*ලාභ/ අලාභ පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශනයක් පහත පරිද වේ.*

| | 2012<br>රු. මිලියන | 2011<br>රු. මිලියන |
|---|---|---|
| ආදායම | 512,910.308 | 356,442.364 |
| විකුණුම් පිරිවැය | (568,572.793) | (428,070.572) |
| දළ ලාභය/ (අලාභය) | (55,662.485) | (71,628.208) |
| මෙහෙයුම් ආදායම | 434.700 | 230.413 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | (12,633.096) | (10,861.465) |
| පරිපාලන වියදම් | (5,800.737) | (3,425.924) |
| මූල්‍ය වියදම් | (18,359.678) | (9,000.571) |
| මූල්‍ය ආදායම් | 2,413.145 | 304.455 |
| ආයෝජන දේපළ මත ආදායම | 38.976 | 24.657 |
| **බදු පෙර ලාභය/ අලාභය** | **(89,569.175)** | **(94,356.643)** |
| හෙජින් වියදම් | (7,611.600) | -- |
| වෙනත් විස්තීරණ ආදායම | (127.598) | (146.803) |
| **වර්ෂය සඳහා අලාභය** | **(97,308.373)** | **(94,503.446)** |

*රජය වෙනුවෙන් කරන ලද දායකත්වය*

| | 2012<br>රු. මිලියන | 2011<br>රු. මිලියන |
|---|---|---|
| අගය එකතු කිරීමේ බදු | 1,538 | 1,337 |
| නිෂ්පාදන බදු | 26,089 | 23,935 |
| ගුවන් තොටුපල හා වරාය බද්ද | 20,810 | 14,537 |
| රේගු බදු | 9,735 | 440 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 3,147 | 1,897 |
| **එකතුව** | **61,319** | **42,146** |

**මෙහෙයුම් වියදම්**

සමාලෝචිත වර්ෂ තුළ මුළු මෙහෙයුම් වියදම් රු. මිලියන 36,793.511 දක්වා වර්ධනය විය. පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 23,287.96 ක මෙහෙයුම් වියදම සමග සසඳා බලන කළ මෙය 51% ක ඉහළ යාමකි.

**ප්‍රාග්ධන වියදම්**

මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 1,280.428 ක් ලෙස වාර්තා විය. මෙය 2011 වර්ෂයේ වාර්තා වන්නේ රු. මිලියන 989.091 ක් වශයෙනි.

**දේපළ පිරියත හා උපකරණ**

සංස්ථාවේ දේපළ පිරියත හා උපකරණ වල විස්තරයන් හා චලනයන් පිළිබඳව විස්තරයන් මූල්‍ය ප්‍රකාශන සඳහා වන, සටහන් අංක 4 යටතේ දක්වා ඇත.

**සංචිත**

2012.12.31 දිනට රු. මිලියන 131,324 ක් දක්වා ඍණ ස්කන්ධ තත්වය තවදුරටත් පැවතුණි. මේවායේ වෙනස්වීම් පිළිබඳව පිටු අංක 27 හි ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයෙහි විස්තරාත්මකව දක්වා ඇත.

**දායක ප්‍රාග්ධනය**

2012 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ දායක ප්‍රාග්ධනය රු. මිලියන 3500 ක් විය.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

සභාපතිතුමාද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 6 දෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අධ්‍යක්ෂකවරු පහත සඳහන් වේ.

- ඩී.එච්.එස්. ජයවර්ධන මහතා (2012.01.13 දක්වා) - සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ
- වසන්ත ඒකනායක මහතා (2012.01.14 - 2012.02.23) - වැඩබලන සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ
- ඩී. විදානගමච්චි මහතා (2012.02.24 - 2012.08.09) - වැඩබලන සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ
- තිලක් කොල්ලුරේ මහතා (2012.08.10 සිට) - සභාපති
- එල්.ඊ. සුසන්ත සිල්වා මහතා (2012.06.01 සිට) - කළමනාකාර අධ්‍යක්ෂ
- ආචාර්ය හාන්ස් විජේසූරිය මහතා - අධ්‍යක්ෂ
- එස්. පුෂ්පා වෙල්ලප්පිලි මහත්මිය - අධ්‍යක්ෂ
- එච්.ඩී.බී. සමන් කුමාර මහතා - අධ්‍යක්ෂ

**කොන්ත්‍රාත් සහ ඊට අදාළ පාර්ශව සමඟ වන ගනුදෙනු පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ සැලකිල්ල**

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ, එල්.ඊ. සුසන්ත සිල්වා මහතා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සහ නිවාස සංවර්ධන මූලය සංස්ථාවේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කළ අතර, එච්.ඩී.බී. සමන් කුමාර මහතා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ ලෙසද කටයුතු කරන ලදී.

**නීති හා රෙගුලාසි සමග අනුකූලත්වය**

නීති හා රෙගුලාසි උල්ලංඝනය වන කිසිදු ආකාරයක ක්‍රියාකාරකමක සංස්ථාව යෙදී නොමැත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

අධ්‍යක්ෂවරුන්ගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ශ්‍රී ලංකාණ්ඩුව හා සේවකයන් වෙනුවෙන් වන ව්‍යවස්ථාපිත ගෙවීම් සියල්ල නියමිත වේලාවට පියවා තිබේ.

**අඛණ්ඩ පැවැත්ම**

අනාගතය සඳහා වානිජ ශක්‍යතාවය ශක්තිමත් කිරීම තහවුරු කිරීම සඳහා සංස්ථාවේ දර්ශනය දියුණු කිරීමේ අරමුණින් සංස්ථාවේ ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කරන ලදී. ඒ අනුව, අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන මූලය ප්‍රකාශ පිළියෙල කරන ලදී.

**විගණකයන් පත් කිරීම**

සංස්ථාවේ විගණකයා වන්නේ විගණකාධිපතිවරයායි. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ ප්‍රතිපාදනයන්ට යටත්ව ඔහු පත්කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

**තිලක් කොල්ලුරේ**
සභාපති
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**හැඳින්වීම**

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2012 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතය 6.4% ක වර්ධනයක් වාර්තා කරයි.

2012 වර්ෂය පුරාවට අන්තර් ජාතික බොරතෙල් මිල ගණන් ඉතා ඉහළ අගයක පැවතිණි. 2012 වර්ෂයේදී, අන්තර්ජාතික බොරතෙල් මිල ගණන් හි සාමාන්‍ය අගය බැරලයක් ඇ.එ.ජ. ඩොලර් 109 ක් විය. 2011 වර්ෂයට සාපේක්ෂව මෙය 2.5% ක වැඩි වීමකි. තෙල් නිෂ්පාදනය කරනු ලබන රටවල හා උතුරු අප්‍රිකානු රටවල පවතින දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් ඉතා ඉහළ පීඩනයක් අන්තර් ජාතික බොරතෙල් මිල ගණන් සඳහා සිදුවුනු අතර, ලෝක වෙළඳපළේ සැපයුම කෙරේද අවිනිශ්චිතතාවයක් දක්න ලැබිණි. එසේම, ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානය වෙත සම්බාධක පැනවීම හේතුවෙන් දින 120 ක් දක්වා වන සැපයුම්කරුගේ ණයකර ලබා ගැනීමේ අවස්ථාව සංස්ථාවට ගිලිහුණු අතර, එමගින් සංස්ථාව සතු ද්‍රවශීලතාවය ක්ෂය විය.

2012 වර්ෂයේ දී සංස්ථාව මගින් ආනයනය කරන ලද පිරිවැය හා ප්‍රවාහන කුලියෙහි සාමාන්‍ය අගය 5% කින් ඉහළ ගිය අතර, එය බැරලයකට ඇ.එ.ජ. ඩොලර් 109 ක් විය. ලෝක වෙළඳපළේ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් දේශීය වෙළඳපළ තුළ ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ මිල ගණන් 2012 වසර තුළ දෙවරක් සංශෝධනය කරන්නට සිදුවිය.

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ඉහළ දැමීම පිණිස ගනු ලැබූ වැදගත් ක්‍රියාමාර්ග**

- තරඟකාරී ලංසු පදනම යටතේ බෙදාහැරීමේ අයිතිය ලබා දීම.

  සංස්ථාවට කිසිදු ආදායමක් නොමැතිව වෙළඳුන් වෙත ලබාදී තිබූ පිරවුම් පොළවල් මගින් කුලිය අයකර ගැනීම මඟින් සැලකියයුතු ආදායමක් ලබා ගන්නා ලදී.

- සංස්ථාවේ 50 වන සංවත්සරය සමඟ යමින්, අලෙවි කාර්යාංශය විසින් පහත සඳහන් වැඩසටහන් සංවිධානය කරන ලදී.

  - දිවයිනපුරා බහු ආගමික වැඩසටහන්
  - ප්‍රජා සේවයක් ලෙස පහසුකම් අඩු පාසල් අටක් සඳහා ආධාර ලබා දීම.
  - ඉන්ධන පිරවුම්හල් ඇගයීමට ලක්කර ඒවා A, B, C ලෙස ශ්‍රේණිගත කිරීම.

- **පවත්නා පිරවුම්හල් සඳහා පෙට්ට්‍රල් පහසුකම් වැඩි කිරීම.**

  ලංකා භූමිතෙල් හෝ ඩීසල් අලෙවි කරනු ලබන වසර 10 ට වඩා තම වෙළඳාම ක්‍රියාත්මක කරනු ලැබූ වෙළඳුන් 32 ක් සඳහා පෙට්ට්‍රල් ඔක්ටේන් 90 පහසුකම ලබා දෙමින් ඒවා පිරවුම්හල් තත්වයට නංවාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

- **දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය**

  ඔයාමඩුව දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව, ඉතාමත් අඩු පහසුකම් සහිත සියඹලාගස් වැව, අශෝක විද්‍යාලය එම පළාතේ අලෙවි නියෝජිතයන්ගේ දායකත්වයෙන් රු. මිලියන 21 ක් වැයකොට නැවත සකස් කරන ලදී. ජයන්ති මාවත ඔයාමඩුව, අනුරාධපුර නව පිරවුම්හලක් ස්ථාපනය කරන ලදී. එසේම තෝරා ගන්නා ලද සංස්ථාව සතු අලෙවිහල් ප්‍රතිසංස්කරණය කරන ලද අතර, අලෙවි නියෝජිතයන් සතු අලෙවිහල් 14 ක් ඔවුන්ගේ වියදමින් ප්‍රතිසංස්කරණය කරන ලදී. මහජනතාවගේ ප්‍රතිලාභය උදෙසා ලංකා පෙට්‍රල් 90 පහසුකම ලබා දෙමින්, පාමදුව ඩීසල් අංගනනය පිරවුම්හලක තත්වයට උසස් කරන ලදී.

- අඩු ගැටළුකාරී නව ඩිස්පෙන්සර් සහ නවීන උසස් ක්‍රියාකාරීත්වයෙන් යුත් ඉන්ධන ඩිස්පෙන්සර් හඳුන්වා දීමට තිරණය කරන ලදී.

- ඉන්ධන ජලෝද්ගම පද්ධතිය සහ හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ටැංකි අංගනය පැවරීම.

- පසුගිය කාලය තුළ ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් ඉහළ ගියද අලෙවි නියෝජිතයන්ගෙන් ලබාගන්නා කොමිස් මුදල් ඉහළ නැංවීමට කටයුතු නොකළ බැවින්, ඉන්ධන පොම්ප සහ මනු බාල කිරීම වැනි අක්‍රමිකතා අවම කිරීම සඳහා 2011 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අලෙවි නියෝජිත සතු සහ අලෙවි නියෝජිත විසින් මෙහෙයවන ලද කාණ්ඩයේ කොමිස් මුදල 1.75% - 2.5% දක්වා ද සංස්ථාව සතු අලෙවි නියෝජිත විසින් මෙහෙයවන ලද කණ්ඩයේ කොමිස් මුදල 1.5% - 2.5% දක්වා ද ඉහළ දමන ලදී. ඉන්ධන පොම්ප සහ මනු බාල කිරීම මගින් ඇතැම් වෙළඳ නියෝජිතයන් පාරිභෝගිකයන් සූරා කෑමට ලක් කරනු ලැබුයේ, කොමිස් මුදල් ගැනීම දීර්ඝ කාලයක් පුරා සංශෝධනය නොකල හෙයිනි. මෙම ක්‍රමය ඉතාමත් සාර්ථක වූ අතර, මෙම කාලපරිච්ඡේදයේ මනු වෙනස් කිරීම් සහ ඉන්ධන බාල කිරීම පිළිබඳව අවම පැමිණිලි ප්‍රමාණයක් ලැබිණි. මනු වෙනස් කිරීම හා ඉන්ධන බාල කිරීම විමර්ශනය කිරීම සඳහා දිවයිනපුරා පවත්නා ඉන්ධන පිරවුම්හල් ක්ෂණික පරීක්ෂාවට ලක් කිරීමට සංස්ථාව කටයුතු කරන ලදී. බොහෝ අලෙවි නියෝජිතයන්ට මේ සම්බන්ධව දැඩි පීඩනයක් ලබා දෙන ලද අතර, මෙම අඛණ්ඩ පරීක්ෂා කිරීම් හේතුවෙන් මෙකී අක්‍රමිකතා විශාල වශයෙන් අඩු කිරීමට හැකියාව ලැබිණි.

- සමාලෝචිත වර්ෂයේදී දෙවරක් ඉන්ධන මිල වැඩිවිය. මෙම වැඩිවීම් දෙක සිදු නොවුයේ නම්, සංස්ථාව විසින් දැරීමට සිදුවන අලාභය එම වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 89 ට වඩා වැඩිවනු ඇත. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු වෙළඳ ණය අයකර ගැනීමට මහා භාණ්ඩාගාරයේ සහ ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ සහාය ඇතිව කටයුතු කරන ලදී.

- සෑම බැංකුවක් සමඟම සාකච්ඡා කර වෙළඳපළේ අනෙකුත් ගැනුම්කරුවන් සමඟ සමාන වන වෙළඳ මට්ටමක් දක්වා අසාධාරණ පොළී අයකිරීම් අඩුකරන ලදී.

- දිනපතා බැංකු හුවමාරු අනුපාතයන් අධීක්ෂණය කරමින් සහ වෙළඳපළ හැසිරීම අධීක්ෂණය කරමින් වෙළඳපළ අනුපාතයට ඩොලර් මිලදී ගැනීමට ප්‍රථම වරට සංස්ථාව වෙත හඳුන්වා දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම මෙහෙයුමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සංස්ථාව විසින් උපයා ගන්නා ලදී.

- සංස්ථාවේ මෙහෙයුම් සහ මූල්‍ය ශක්‍යතාවය වැඩිදියුණු කිරීම සඳහා වෘත්තියමය දක්ෂතා සහිත කළමනාකරුවන් මූල්‍ය, නීති, පරිපාලන, සිල්ලර අලෙවි යන අංශ සඳහා යෙදවීමෙන් එම අංශ ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

- සමාලෝචිත වර්ෂයේදී, පිරිපහදුව අඩු බිඳවැටීම් සහිතව සතුටුදායක ලෙස ක්‍රියාත්මක විය. බනිජ තෙල් නිෂ්පාදනවල ගබඩා කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමට හැකිවන පරිදි ටැංකි පිරිසිදු කිරීම, නඩත්තු කිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **හම්බන්තොට ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ජලෝද්ගමන පද්ධති සහ ටැංකි අංගන ඉදිකිරීම.**

  හම්බන්තොට ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ඉන්ධන ජලෝද්ගමන පද්ධතිය සහ ටැංකි අංගනයේ ඉදිරි ප්‍රදේශ ඉදිකිරීමේ ප්‍රධානතම ඉදිකිරීම් China Harbour Engineering Co. Ltd විසින් සිදුකරන ලදී.

- **කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පවත්නා ගබඩාකරණ ධාරිතාව විශාල කිරීම.**

  AASL ගුවන්තොටුපල ව්‍යාප්ත කිරීමේ වැඩසටහනේ 2 වන පියවරේ II වන අදියරේ, Apron E තුළ නව ඉන්ධන ජලෝද්ගමන පද්ධතියක් සඳහා ඉංජිනේරු සැලසුමක් නිර්මාණය කිරීම සඳහා උපදේශකවරයෙක් පත් කිරීමට පියවර ගන්නා ලදී. සංස්ථා අරමුදල් ඇ.එ.ජ. ඩොලර් 600,000 ක් වෙන්කර ඇති ඉංජිනේරු සැලැස්ම නිර්මාණය කිරීම සඳහා හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපලේ උපදේශක වන, M/S Hansconsult Ingenieurgsell Schaft Mbh ආයතනයේ සේවය ලබා ගැනීමට කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. මින් පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලංසු කැඳවීමට නියමිතයි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් පිළිබඳව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

- **සපුගස්කන්ද කුඩා ටැංකි පර්යන්තය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය.**

  පෙට්‍රල් ගැන්ට්‍රි පිරවීම සඳහා ටැංකි දෙකක් අනුවර්තනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. බොරතෙල් සම්බන්ධයෙන් පිරිපහදුවේ ඇතිවූ ගැටළු හේතුවෙන්, ඩීසල් ගබඩා කිරීම සඳහා අවශ්‍ය ටැංකි නොමැතිකමින් මෙය තරමක් ප්‍රමාද විය. ගැන්ට්‍රිය සඳහා උපකරණ ඇනවුම් කර ඇත.

- **නව නල මාර්ග ව්‍යාපෘතිය.**

  ජාතික වැදගත්කමක් සහිත බැවින් පහත සඳහන් නල මාර්ග දෙක තෝරා ගන්නා ලද අතර, නල මාර්ග අනුරේඛා වෙන් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මූලික පියවර ගන්නා ලදී.

  i) හම්බන්තොට jet A-1 ටැංකි අංගනයේ නල මාර්ගය මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල දක්වා.

  ii) මුතුරාජවෙල පර්යන්තයේ සිට කොලොන්නාව පර්යන්තය සම්බන්ධ කරමින් නල මාර්ගය

  මුතුරාජවෙල පර්යන්තයේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා නල මාර්ගයේ කොළඹ කටුනායක අධිවේගයේ අනුරේඛාවක් හඳුනා ගන්නා ලදී. ඉතිරි කාර්ය ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මඟින් 2013 වර්ෂයේදී සිදුකරනු ඇත.

- **සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM)**

  2012 වර්ෂය අවසානයේදී ඉඩම් අත්පත් කර ගැනීම හා සම්බන්ධ ආයතනික කාර්යයන් වලින් දළ වශයෙන් 98% ක් සම්පූර්ණ කර ඇත. කෙසේ වෙතත්, ඇතැම් පාර්ශවයන් වෙත වන්දි ගෙවීම ප්‍රමාද විය. මක්නිසාද යත් දේපළ අයිතිය පිළිබඳව ආරවුල් සහ ඉඩම් හිමියන් වෙත ලබාදෙන ලද වන්දි මුදල් ප්‍රමාණවත් නොවේ යැයි ඔවුන් විසින් නගන ලද විරෝධතා හේතුවෙන් අත්පත්කර ගන්නා ලද දේපළ වටා සීමා වැට බැඳීමේ කටයුතු ආරම්භකර ඇති අතර, සතියක් තුළ අවසන් කිරීමට අපේක්ෂිතය. එම කාර්ය අවසන් වීමෙන් අනතුරුව භූමිය ශුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු ආරම්භ කරනු ඇත.

- **ලිහිසි තෙල්**

  මෙම වසර තුළ ලිහිසි තෙල් අලෙවිය වේගයෙන් ඉහළ යන ලදී. පෙර වර්ෂයේ රු. බිලියන 1.571 ක පිරිවැටුම හා සසඳන කළ 2012 වර්ෂයේදී රු. මිලියන 1.980 ක් විය. මෙලෙස ලිහිසි තෙල් ව්‍යාපාරයෙන් රු. බිලියන 46 ක ලාභයක් වාර්තා විය.

- **සපුගස්කන්ද නව පර්යන්ත සංවර්ධන ව්‍යාපෘති**

  - ඩීසල් ටැංකි 02 ක් පෙට්‍රල් ටැංකි බවට පරිවර්තනය කිරීම.
  - ගබඩාකරණ සංකීරණයේ ස්වයංක්‍රිය ටැංකි ට්‍රක් පැටවීමේ පද්ධතිය සහ යටිතල පහසුකම් දියුණු කිරීම.
  - ඇතිවිය හැකි පාරිසරික උවදුරු අවම කිරීම සඳහා අපවහන ජලය සඳහා තෙල් වෙන් කිරීමේ පද්ධතියක් ඉදිකිරීම.
  - ලංකා ඔටෝ ඩීසල් සඳහා මෙට්‍රික් ටොන් 10,000 ක ධාරිතාවයෙන් යුත් ටැංකියක් ඉදිකිරීම මඟින් ගබඩාකරණ සංකීරණය දීර්ඝ කිරීම.

**මූල්‍ය කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාවේ සමස්ථ අලාභය රු. බිලියන 97.3 කි. මෙම අලාභය සඳහා වූ ප්‍රධානම සාධකයන් වන්නේ, ලෝක වෙළඳපළේ ඉන්ධන මිල ගණන් ඉහළ යාමේ මිලට සාපේක්ෂව දේශීය ඉන්ධන මිල සංශෝධනය නොකිරීම, ලංකා විදුලිබල මණ්ඩලයට හා පෞද්ගලික විදුලිබල නිෂ්පාදකයන් වෙත සහන මිලට දැවිතෙල් ලබාදීම හා භූමිතෙල් වෙනුවෙන් සහනාධාර ප්‍රදානය කිරීමයි.

විදුලිබල උත්පාදනය සඳහා දැවිතෙල් හා නැප්තා අලෙවියෙන් ලද අලාභය රු. බිලියන 54 ක් විය. පොදු ප්‍රවාහන කටයුතු සඳහා ඩීසල් සහනාධාර මුදලකට අලෙවි කිරීමෙන් වූ අලාභය රු. බිලියන 4 කි.

**සංස්ථාපිත යහපාලනය**

විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනකුගෙන් සමන්විත විගණන කමිටුව මගින් කාලිනව විධිමත් විගණන කමිටු රැස්වීම් පවත්වා සංස්ථාවේ සියලුම ආයතනික ගැටළු සමාලෝචනය කරනු ලබයි. සංස්ථාපිත යහපාලන ක්‍රියාවලියේ කොටසක් වශයෙන් අභ්‍යන්තර පාලනය, මූල්‍ය හා මෙහෙයුම් විනිවිදභාවය වර්ධනය කිරීමේ අරමුණින් සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කරනු ලැබීය. සංස්ථාවේ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් විගණන කමිටුව මගින් නිරතුරුවම සමාලෝචනය කරනු ලබයි.

**සංස්ථාපිත සමාජ වගකීම**

සංස්ථාපිත සමාජ වගකීම නොකඩවාම ප්‍රධාන වශයෙන් යොමු කරනුයේ සමස්ථ සමාජයේම අවශ්‍යතා පාරිභෝගියකයාට දැරිය හැකි පිරිවැයකින් ලඟාකර දීමටය. එමෙන්ම කුමන තත්වයන් යටතේ වුවද, කුමන පිරිවැයන් යටතේ හෝ රාජ්‍ය ආයතන සඳහා අඛණ්ඩව ඉන්ධන සැපයීමටද අප සහතික වෙමු.

2012 වර්ෂයේ දී රු. බිලියන 61,319 ක අතිවිශාල මුදලක් බදු හා ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට ලබාදී ඇත. ලෝක වෙළඳපළේ ඉන්ධන මිල හැසිරීම් වලින් දේශිය ආර්ථික කටයුතු වලට විය හැකි බලපෑම අවම කිරීමේ අරමුණින් විදුලිබල උත්පාදනය හා ප්‍රවාහන කාර්‍යයන් සඳහා ඉන්ධන ඉතා විශාල සහනදායි මිල ගණන් යටතේ සැපයීම සිදුකෙරිණි.

**නිෂ්පාදනය**

අගෝස්තු මස 6 දින වන විට පිරිපහදුව වසර 43 ක මෙහෙයුම් කාලයක් නිමා කොට ඇත. වර්ෂය තුළ බොරතෙල් මෙ.ටො. 1,596,658 ක් පෙරසැරි කොට ඇති අතර, දින 338 ක් තම මෙහෙයුම් පවත්වා ඇත.

**බොරතෙල් හා නිමි තොග ආනයනය**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 1,369.040 ක් වැය කරමින් ගතවූ වර්ෂය තුළ බොරතෙල් මෙ.ටො. මිලියන 1.626 ක් සංස්ථාව විසින් ආනයනය කොට ඇත. පෙර වර්ෂයේ වාර්තා වූ සාමාන්‍ය බොරතෙල් පිරිවැය (බැරලයට) ඇ.එ.ජ. ඩොලර් 110 ට සාපේක්ෂව ගතවූ වර්ෂය තුළ බැරලයට ඇ.එ.ජ. ඩොලර් 115 ක් බවට වාර්තා විය. එමෙන්ම බොරතෙල් ආනයනයේ දී ප්‍රවාහන කුලියේ සාමාන්‍ය අගය මෙ.ටො. 1 කට ඇ.එ.ජ. ඩොලර් 8.20 ක් වූ අතර, පෙර වර්ෂයේ දී ඇ.එ.ජ. ඩොලර් 9.46 ක් විය.

පිරිපහදු කළ නිමිතොග මෙම වර්ෂය තුලදී මෙ.ටො. මිලියන 2.778 ක් ආනයනය කොට ඇති අතර, මේ සඳහා පිරිවැය හා ප්‍රවාහන කුලිය ඇතුලත්ව මුළු පිරිවැය ලෙස ඇ.එ.ජ. ඩොලර් මිලියන 2,633.552 ක් වැය කොට ඇත.

**ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් සපයන සේවාවන්**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග තෙල් තොග ගබඩා කිරීම, කොලොන්නාව හා දිප ව්‍යාප්ත ප්‍රාදේශිය තොග ගබඩා 12 ක මෙහෙයුම් කටයුතු, දත්ත සැකසුම හා බෙදාහැරීම් ක්‍රියාවලිය මෙම සමාගම යටතේ සිදුකරනු ලබයි.

CPC හා CPSTL එක්ව සතිපතා විධිමත් තොග සමාලෝචන රැස්වීම් පවත්වා රටේ පවතින සමස්ථ ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය තරම් තොග පවතින බවට තහවුරු කර ගැනීමත්, අවශ්‍ය සොයා බැලීම සිදුකිරීමත් සිදුකරනු ලබයි. මෙම සේවා එනම්, ගබඩාකරණය, මෙහෙයුම් සේවා සැපයීම, බෙදාහැරීම හා දත්ත සැකසුම් කටයුතු වල අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම පිණිස හා අදාල සේවා සංස්ථාවට ලබාදීම වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ගාස්තුවක් අයකරනු ලබයි.

**කෘෂි රසායන**

වගාකරුවන් හා වතුවගා අංශයට භාවිතයට ගන්නා කෘෂි රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා සංස්ථාවෙහි සාධාරණ මිල ප්‍රතිපත්තිය අනුව යමින් අඩු පිරිවැයක් පවත්වා ගනිමින් රටේ කෘෂි කාර්මික ආර්ථිකය පුබුදුවාලීමට කටයුතු කරන ලදි.

වර්තමාන " CEYPETCO" නිෂ්පාදන මිශ්‍රය සඳහා වල් නාශක වර්ග 5 ක්ද, දිලීර නාශක වර්ග 4 ක්ද, කෘමි නාශක වර්ග 6 ක්ද ඇතුලත් වේ. අනාගතයේ අනෙකුත් කෘෂි කර්මාන්තය පදනම්ව ඇති ප්‍රදේශ කරාද අපගේ නිෂ්පාදන මිශ්‍රය ව්‍යාප්ත කිරීමට කටයුතු කරනු ඇත. තවද, රට තුළ කෘෂි කර්මාන්තය පදනම්ව ඇති ප්‍රදේශකරා අපගේ සිපෙට්කෝ අලෙවි මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීමට සැලසුම් සකස් කරමින් සිටි. කෘෂි රසායන අලෙවිය වැඩි කිරීම සහ දිස්ත්‍රික් ජාලය ව්‍යාප්ත කිරීම සඳහා තෝරා ගන්නා ලද අලෙවි නියෝජිතවරුන්ට සහ පාරිභෝගිකයින්ට වට්ටම් ලබා දීම සහ අලෙවි මධ්‍යස්ථාන හයක ගබඩාකරණ ධාරිතාව වැඩි කිරීමට සැලසුම් කරමින් පවති.

**මානව සම්පත් වර්ධනය හා සුභසාධනය**

2012 වර්ෂයේ සංස්ථාවේ සේවක ශක්තිය ස්ථිර සේවකයන් 2637 දෙනෙකුගෙන් ද අනියම් සේවකයන් 21 දෙනකුගෙන් ද සමන්විත වේ.

සේවකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍යාධාර ක්‍රමයක් සංස්ථා සකසුරුවම් සමිතිය මගින් කළමනාකරණය කරනු ලබයි. සේවකයන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම පිණිස වෛද්‍යවරුන් දෙදෙනකුගේ පූර්ණ කාලීන සේවය ලබාගනී. සමාලෝචිත වර්ෂයේ දී රෝහල් ගතවීම් හා නේවාසික ප්‍රතිකාර සඳහා රු. මිලියන 30 ක් වැය කොට ඇත. බාහිර රෝග ප්‍රතිකාර සඳහා සෑම සේවකයකුටම මාසිකව රු. 250/- ක දීමනාවක්ද ගෙවනු ලබයි.

පාරිතෝෂිත පනතට අනුව අදාල සේවකයා සේවය කොට ඇති සෑම වර්ෂයකටම අර්ධ මාසික වැටුපට සමාන මුදලක් පාරිතෝෂිත දීමනාව වශයෙන් ගෙවනු ලබන අතර, සංස්ථා සකසුරුවම් සමිතිය මගින් අතිරේක විශ්‍රාම ප්‍රතිලාභයන් ද මරණ පාරිතෝෂිතද ගෙවනු ලබයි. සේවකයකුගේ මරණයකදී මරණ පාරිතෝෂිතයන් ද ගෙවනු ලබයි. සේවකයන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සේවක ක්‍රීඩා සමිති වෙනුවෙන් මූල්‍යාධාර සැපයීමද සංස්ථාව මගින් සිදුකරනු ලබයි. සේවකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් වෙනුවෙන් නිවාඩු නිකේතන 4 ක් නඩත්තු කරයි. සේවකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සහනදායි පොළී අනුපාතිකයන් යටතේ විවිධ ණය යෝජනා ක්‍රම කිහිපයක් ද ක්‍රියාත්මක වේ.

එමෙන්ම සේවකයන් හට දේශීය හා විදේශ පුහුණු කිරීම් වලට අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කොට තිබේ. සේවකයන්ගේ වැඩ පරිසරය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ පරිගණක සාක්ෂරතාවය හා භාෂා ඥාණය වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.875,000/- ක මුදලක් වෙන්කොට පශ්චාත් උපාධි ඩිප්ලෝමා / උපාධි සඳහා සේවකයන් යොමුකර ඇත.

පහත සඳහන් පරිදි සතුටුදායක ලෙස තමන්ගේ සේවා කාලය සම්පූර්ණ කරන සේවකයන් සඳහා තිළිණ ප්‍රදානය කිරීමක් ද සිදුකරයි.

- 20 වසරක් - රු. 10,000/=
- 25 වසරක් - පවුම් 2.5 ක රන් පවුමක්
- 30 වසරක් - රු. 20,000/=
- 35 වසරක් - රු. 25,000/=
- 40 වසරක් - රු. 40,000/=

මෙම වසර තුළදී, සේවකයන් 244 ක් වෙත මෙම තිළිණ ලබා දෙන ලදී. රාජ්‍ය විශ්ව විද්‍යාලයකට තේරී පත්වන සේවක දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමක් ද සංස්ථා සුභසාධන කටයුත්තක් වශයෙන් සිදුකරනු ලබයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 50 වන සංවත්සරයට සමගාමීව එය සැමරීම වස් පහත සඳහන් වැඩසටහන් අලෙවි කාර්යාංශය මගින් සංවිධානය කරන ලදී.

- බහු ආගමික වැඩසටහන් හතරක් දිවයිනපුරා පවත්වන ලදී.
- අඩු පහසුකම් සහිත තෝරාගත් පාසල් අටකට පරිත්‍යාග ලබා දෙමින් සිදුකරන ලද ප්‍රජා සේවය.
- දිවයින පුරා පුහුණු වැඩසටහන් 11 ක් පවත්වන ලදී.
- ඉන්ධන පිරවුම්හල් A, B, C ලෙස කාණ්ඩ කිරීම සහ ඇගයීමට ලක් කිරීම.

**පාරිසරික ආරක්ෂණය**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා වෙළඳපළ නායකයා වීමත්, දේශීය පිරිපහදුවක් හිමි එකම ආයතනය වීම නිසාත් පරිසර දූෂණය අවම කිරීමට වගකීමෙන් බැඳී සිටින අතර, පරිසරයට හානියක් නොවන පරිදි ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතා කිරීමත්, මෙහෙයවීමටත් බැඳී සිටී. ලෝක පාරිසරික සම්මුතීන්ට අනුගාමීව අඩු සල්ෆර් ඩීසල් නිෂ්පාදනය සඳහා පිරිපහදුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක වීමට නියමිතය. මේ වන විට ඉඩම් පවරා ගැනීමේ කටයුතු 98% ක් අවසන් කර ඇති අතර, ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ලැබීමට නියමිත අතර ඉන්පසු ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතයි.

**ස්තුතිය**

ගතවූ කාලයේ මා වෙනුවෙන් සියලුම අභියෝගයන් භාරගත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා කණ්ඩායමේ සියලුම සාමාජිකයන්ට ස්තූතිය ප්‍රකාශ කරන අතර, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් කර්මාන්ත ගරු අමාත්‍යතුමා හා ඔහුගේ කාර්ය මණ්ඩලයටත්, භාණ්ඩාගාරයටත්, මහ බැංකුවටත් අපගේ ව්‍යාපාරික සහකරුවන්ටත් හා සියලුම පාරිභෝගික භවතුන්ටත් ඔවුන් ලබාදුන් සහයෝගයට හා අනුග්‍රහයන් වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් කර ගනිමි.



**එල්.පී. සුසන්ත සිල්වා**
කළමනාකාර අධ්‍යක්ෂ
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

# ආකලිත වටිනාකම් ප්‍රකාශය

| | 2012 රු. මිලියන | % | 2011 රු. මිලියන | % |
|---|---|---|---|---|
| පිරිවැටුම | 542,146 | | 382,268 | |
| අමුද්‍රව්‍ය හා සේවා මිලදී ගැනීම් | (556,393) | | 423,138 | |
| **එකතු කළ වටිනාකම** | **(14,247)** | | **(40,870)** | |
| **පහත දැක්වෙන පරිදි ගලපා ඇත** | | **%** | | **%** |
| **සේවකයින්ට ගෙවීම සඳහා** | | | | |
| වැටුප් හා අමතර ප්‍රතිලාභ | 2,865 | (20.10) | 2,070 | 5.06 |
| **ප්‍රාග්ධන සැපයුම්කරුවන් වෙත ගෙවීම්** | | | | |
| ණය සඳහා පොළී | 18,360 | (128.87) | 9,001 | (22.03) |
| **වත්කම් නඩත්තු සහ පුළුල් කිරීම් වෙනුවෙන්** | | | | |
| ක්ෂය කිරීම් | 517 | (3.63) | 417 | (1.02) |
| රඳවාගත් ලාභය | (97,308) | 683.26 | (94,503) | 232.89 |
| **රජයට ගෙවිය යුතු** | | | | |
| බදු ගෙවීම්, මුද්දර බදු, සහ මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | 61,319 | (430.40) | 42.146 | (103.12) |
| **එකතු කළ වටිනාකම** | **(14,247)** | **100.00** | **(40,870)** | **100.00** |

# මූලික කරුණු

| මූල්‍ය | ඒකකය | 2012 | 2011 |
|---|---|---|---|
| දළ ආදායම | රු. මිලියන | 512,910.308 | 356,442.364 |
| දළ ලාභය/ (අලාභය) | රු. මිලියන | (55,662.485) | (70,588.126) |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) | රු. මිලියන | (52,868.054) | (70,126.286) |
| මූල්‍ය ආදායම් | රු. මිලියන | 71,209.496 | 85,356.072 |
| මූල්‍ය වියදම් | රු. මිලියන | 18,359.678 | 9,000.571 |
| බදු පෙර ලාභය/ (අලාභය) | රු. මිලියන | (89,569.175) | (94,356.643) |
| බදු පසු ශුද්ධ ලාභය/ (අලාභය) | රු. මිලියන | (89,569.175) | (94,356.643) |
| ප්‍රාග්ධනය සහ සංචිත | රු. මිලයන | (220,883.539) | (131,236.142) |
| දිගු කාලින ණය ගැනිම් | රු. මිලියන | (1,998.218) | (28,273.164) |
| ප්‍රාග්ධන වියදම් | රු. මිලයන | 223.360 | 1,945.539 |
| **ආනයන** | | | |
| බොරතෙල් ආනයන | මෙ.ටොන් | 1,626.074 | 1,931.529 |
| පිරිපහදු කළ තොග ආනයන | මෙ.ටොන් | 2,778.654 | 1,449.969 |
| පිරිවැය සහ නැව් ගාස්තු වටිනාකම | රු. මිලියන | 516,153.897 | 189,848.570 |
| **මෙහෙයුම්** | | | |
| විකුණුම් | මෙ.ටොන් | 4,405.502 | 4,234.808 |
| පිරිපහදු නිමැවුම් | මෙ.ටොන් | 1,555.943 | 2,003.674 |
| **අලෙවි** | | | |
| CPC සතු බෙදුම්පොළවල් | සංඛ්‍යාව | 248 | 248 |
| බෙදුම්කරුවන් සතු බෙදුම්පොළවල් | ” | 795 | 775 |
| බෙදුම්කරුවන් පාලනය කරන බෙදුම්පොළවල් | ” | 47 | 47 |
| **සේවකයන්** | | | |
| වසර අවසාන වන විට සේවකයන් ගණන | සංඛ්‍යාව | 2,658 | 2,792 |
| වසර තුල සම්පූර්ණ ගෙවීම් | රු. මිලියන | 2,824.431 | 2,213.654 |
| සේවකයෙකු සඳහා එකතු කළ වටිනාකම | රුපියල් | 1,062.615 | 848.143 |

# සංස්ථාපිත යහපාලනය

## සංස්ථාපිත යහපාලනය

ජාතික අවශ්‍යතාවය සඳහා ඛනිජ තෙල් සපයන ප්‍රධාන සැපයුම්කරු ලෙස, රටේ සෑම ආයතනයකම සහ පුද්ගලයෙකුගේම පැවැත්ම කෙරෙහි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බලපෑමක් ඇති කරයි. සංස්ථාවේ මෙහෙයුම් කාර්යන්හි ඉහලම ප්‍රමිතින් පවත්වාගෙන යාම සඳහා, සංස්ථාව කෙරෙහි ඇල්මක් දක්වන කණ්ඩායම් ද සැලකිල්ලට ගෙන, ශක්තිමත් සංස්ථාපිත යහපාලනයක් ඇති කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී ඇති අතර, ඒ වෙත ළඟා විය හැකි බවද ඔවුන්ගේ විශ්වාසයයි. විනිවිදභාවය, කරුණු හෙලිදරව් කිරීම සහ වගකීම හා සම්බන්ධ තම කටයුතු ඉටු කිරීමේදී ශක්තිමත් සංස්ථාපිත යහපාලනය උපකාරී වන බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එසේම, සංස්ථාපිත යහපාලනය ශක්තිමත් කිරීම යනු අඛණ්ඩ ක්‍රියාවලියක් බව ඔවුන් විසින් සලකනු ලැබේ. මෙම කොටස මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ක්‍රියාවට නංවන ලද යහපාලනයට අදාල ව්‍යුහයන්, ක්‍රියාවලින් සහ ක්‍රියාමාර්ගයන් විස්තර කෙරේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත සහ එහි සංශෝධන ප්‍රකාර, ඛනිජ තෙල් කර්මාන්ත ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද සභාපතිතුමා ඇතුළුව සාමාජිකයන් හයදෙනෙකුගෙන් අධ්‍යක්ෂක මණ්ඩලය සැදී ඇත. ඉන් එක් අධ්‍යක්ෂවරයෙකු මහා භාණ්ඩාගාරයේ (මුදල් අමාත්‍යාංශයේ) නියෝජිතයෙකු වනු ඇත. සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂක හැර සෑම අධ්‍යක්ෂවරයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරු වන අතර, 2012 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එල්.ඒ. සුසන්ත සිල්වා මහතා කළමනාකාර අධ්‍යක්ෂක ලෙස පත්කරන ලදී.

නැවත පත්කිරීමට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ පත්වීම වසර 03 ට සීමාවේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් හා අවශ්‍ය වූ විට බාහිර වෘත්තියවේදීන්ගෙන් ද අවශ්‍ය තොරතුරු ලබා ගනී.

සංස්ථාව පාලනය වන ව්‍යවස්ථාපිත නීති වලට අනුකූලව ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, සංයුක්ත සැලැස්ම සහ මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. එසේම, සංස්ථාවේ ඉහළ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ආයෝජන සහ මූල්‍ය ණය සඳහා අනුමැතිය ලබා දීමද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසික පදනම මත පවත්වන අතර, අවශ්‍ය වූ විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලබයි.

සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 18 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් සහභාගි වී තිබේ.

**අනුකූලත්වය හා පාරදෘෂ්‍යභාවය**

සියළුම මෙහෙයුම් කටයුතු කිරිමේදී වඩාත් පාරදෘෂ්‍යභාවයකින් කටයුතු කිරිමට සංස්ථාව බැඳී සිටි. ගිණුම් කටයුතු භාවය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ගණකාධිකරණ ප්‍රමිත හා වෙනත් රෙගුලාසි වලට අනුව කටයුතු කිරිමට සංස්ථාව ක්‍රියාකර තිබේ. සංස්ථාවේ දෛනික මෙහෙයුම් කටයුතු සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කොට තිබේ. 1971 අංක 38 දරණ මුදල් පනත සහ එහි මවි පනතේ විධිවිධානයන්ට අනුව, මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන අතර, පාර්ලිමේන්තුවේද සභාගත කරයි. එයට අමතර වශයෙන් මුදල් පනතට අනුකූලව විගණකාධිපතිවරයා විසින් සංස්ථාවේ බාහිර විගණනය සිදුකරනු ලබයි.

**විගණන කමිටුවේ සංයුතිය**

55 වන විගණන කමිටුවේදී මෙත්සිරි විජේගුණවර්ධන මයා, චම්පිකා දිල්හාරා අමරසේකර මිය සහ සන්ධ්‍යා විජයබණ්ඩාර මිය යන විධායක නොවන අධ්‍යක්‍ෂකවරු කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී. 56 වන විගණන කමිටුවේ සිට 58 වන විගණන කමිටුව දක්වා විධායක නොවන අධ්‍යක්‍ෂකවරු තුන්දෙනෙක් පත් කරන ලද අතර, ආචාර්ය හාන්ස් විජේසූරිය මයා එකී කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදී. අනෙකුත් සාමාජිකයන් දෙදෙනා නම්, එස්.පී. වෙල්ලප්පිලි මිය සහ සන්ධ්‍යා විජයබණ්ඩාර මිය යි.

පොදු වෙළඳ ආයතනයන්හි විගණන කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති මහා භාණ්ඩාගාර චක්‍රලේඛ වල පෙන්වා දී ඇති වගකීම් ආවරණය වන පරිදි කමිටුවේ විගණන ප්‍රඥප්තිය පිළියෙල කර ඇත.

**විගණන කමිටුවේ කාර්‍යයන්**

සමාලෝචිත වර්ෂයේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය සහ මෙහෙයුම් අංශයන්ගේ ගැටළු, සංස්ථාවේ කාර්ය සාධනය පිළිබඳව ඇගයීම සහ අභ්‍යන්තර සහ බාහිර විගණන ප්‍රශ්න සම්බන්ධව එවන ලද පිළිතුරු ඇගයීම්, මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම සහ අනෙකුත් ඒ හා සම්බන්ධ මානව සම්පත් ගැටළු ආදිය පිළිබඳව විගණකාධිපතිවරයා විසින් එවන ලද වාර්තාවන්, අභ්‍යන්තර විගණන ගැටළු හා වාර්තා, වෙළඳ ණය පියවා ගැනිම සඳහා තෝරා ගන්නා ලද ක්‍රමවේදය කෙරෙහි කමිටුවේ අවධානය යොමු කරන ලදී. එසේම වෙළඳ ණය පියවා ගැනිම සහ ERP ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීම, ප්‍රධාන කාර්යාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ නිෂ්ප්‍රයෝජන වත්කම්වල වර්තමාන තත්වය විශ්ලේෂණය කිරීම සඳහා වූ කරුණුද විගණන කමිටුව විසින් සාකච්ජා කරන ලද කරුණු වේ.

**2. විගණන කමිටු රැස්වීම්**

සමාලෝචිත වර්ෂයේදී, ඉහත සඳහන් කළ පරිදි තමන් වෙත පවරා ඇති රාජකාරීන් සාකච්ජා කිරීම සඳහා විගණන කමිටු 04 ක් පවත්වන ලදී.

සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ සාමාජිකයන් පහත සඳහන් කර ඇත.

| අනුක්‍රමික අංකය | දිනය | කමිටු සභාපති | කමිටු සාමාජිකයන් ගණන | සහභාගී වූ සාමාජිකයන් ගණන | සහභාගී වූ සාමාජිකයන්ගේ නම් |
|---|---|---|---|---|---|
| 55 | 2012.07.25 | මෛත්සිරි විජේගුණවර්ධන මයා | 03 | 03 | චම්පිකා දිල්හාරා අමරසේකර මිය<br>සන්ධ්‍යා විජයබණ්ඩාර මිය |
| 56 | 2012.10.04 | ආචාර්ය හාන්ස් විජේසූරිය මයා | 03 | 04 | එස්.පී. වෙල්ලප්පිලි මිය<br>සන්ධ්‍යා විජයබණ්ඩාර මිය |
| 57 | 2012.11.14 | ” | 03 | | ” |
| 58 | 2013.01.08 | ” | 03 | | ” |

### 3. විගණන කමිටුව විසින් සිදුකරන ලද කාර්යයන්

විගණන කමිටුව විසින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා විවිධ තිරණ සහ නිර්දේශ විගණන කමිටුව විසින් ඉදිරිපත් කරන ලදී.

1. 2011.12.31 දිනට අවසන්වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳව සාකච්ඡාව.

   විගණකාධිපතිගේ වාර්තාව මඟින් විශේෂයෙන් පෙන්වා දෙන ලද ඌනතා නැවත ඇතිවීම වැලැක්වීම සහ ඒ සඳහා නිවැරදි පියවර ගැනීම සඳහා සවිස්තරාත්මක විස්තර ලබාගන්නා ලදී.

2. ඛනිජ තෙල් නොවන නිෂ්පාදන අලෙවිය මඟින් ඇති වූ අලාභය සඳහා හේතු හඳුනා ගැනීමේදී, අලාභ ලැබීම් වැලැක්වීම සහ අනෙකුත් ලාභදායී ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා ඉතා ඉක්මන් සුදුසු පියවර යෝජනා කිරීමට හෝ නිර්දේශ කිරීමට සවිස්තරාත්මක විශ්ලේෂණයක් සහ අධ්‍යනයක් දියත් කරන ලදී.

3. අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත්බව සහ පාරිභෝගිකයන් වෙත බෙදාහරින ලද නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම. SAP පද්ධතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති වූ වෙනස්කම් හා හඳුනාගන්නා ලද දුර්වලතා පාලනය කිරීම සහ සුදුසු පාලනයක් නිර්දේශ කිරීම. පිරවුම්හල් තුළදී සිදුකරන ලද විගණනයන් මඟින් සංස්ථා ක්‍රියාපටිපාටියේ අනුකූලතාවය සම්බන්ධයෙන් අලෙවි නියෝජිතයන්ගේ පැමිණිලි සහතික කිරීම.

4. අගය සහ වැදගත්කම පදනම් කර අවදානම් ශ්‍රේණිගත කිරීම හඳුනාගැනීම.

   සංස්ථාවේ අවදානම් ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීම සඳහා කමිටුවක් පිහිටුවන ලද අතර ප්‍රධාන අවදානම් 10 හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා විකල්ප ද යෝජනා කරන ලදී.

### කළමනාකරණ කමිටුව

කළමනාකරණ කමිටුව මසකටවරක් රැස්වී ආංශික ගැටළු ඇතුළුව වර්තමාන ගැටළු සාකච්ඡා කරනු ලබයි. කමිටුවේ සභාපති වෙත සහාය ලබා දෙන අධ්‍යක්‍ෂකවරු දෙදෙනෙකු විසින් කමිටුව මෙහෙයවනු ලැබේ. මෙම කමිටුවේ දී, ගැටළු සවිස්තරාත්මක ලෙස සාකච්ඡා කරනු ලබන අතර, එමඟින් ගන්නා තිරණ අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත යොමුකරනු ලැබේ.

### තොග සමාලෝචන කමිටුව

මෙම කමිටුවේ රැස්වීම් පවත්වනුයේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කාර්ය මණ්ඩලය සහ විදුලිබල මණ්ඩලයේ සහ ඉන්දියානු තෙල් සංස්ථාවේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙනි. එහිදී තොග තත්වය සමාලෝචනය කරනු ලබන අතර ඉදිරි මාස තුනක කාලපරිච්ජේදය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරනු ලබයි.

පිරිපහදුවේ නිෂ්පාදනය සළකා බලා රටේ අවශ්‍යතාවය අනුව ආනයනය කළ යුතු ප්‍රමාණය හඳුනාගෙන පවත්නා තොග සැලකිල්ලට ගෙන ඉදිරි කටයුතු සැලසුම් කරයි. අඛණ්ඩ සමීප අධීක්‍ෂණය සිදුකරන බැවින් රටේ තෙල් සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යාමට සංස්ථාවට හැකියාව ලැබේ.

### ප්‍රසම්පාදන කමිටුව සහ ටෙන්ඩර් ඇගයීමේ කමිටුව

ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් නිෂ්පාදන, භාණ්ඩ, සේවා සහ කාර්යයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා වන මාර්ගෝපදේශන කාණ්ඩයක් නිකුත් කරන ලදි. ප්‍රසම්පාදනයේ පාරදෘෂ්‍යභාවය සහතික කිරීමට, ප්‍රමාදයන් අවම කිරීමට සහ මූල්‍යමය වශයෙන් වඩාත් යහපත් සහ ගුණාත්මකභාවයෙන් යුත් සේවා සහ සැපයුම් සංස්ථාව වෙත ලබා ගැනීමට ටෙන්ඩර් ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් පනවා ඇති මාර්ගෝපදේශ අනුගමනය කරයි.

### මූල්‍ය හෙළිදරව්ව

සංස්ථාවේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණත්වය පිලිඹිබු වන ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අධ්‍යක්‍ෂක මණ්ඩලය වගකීමෙන් බැඳී සිටියි. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මුදල් පනතේ හා ඛනිජ තෙල් සංස්ථා මව් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබේ.

### අභ්‍යන්තර පාලනයන්

ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම සහ එහි ඵලදායිතාව සමාලෝචනය කිරීම සඳහා සංස්ථාව වගකිව යුතු වේ. මෙකී පද්ධතිය මඟින් සංස්ථාවේ වත්කම් ආරක්‍ෂා කිරීම සහ විධිමත් වාර්තා පවත්වාගෙන යාම සනාථ කිරීම සහ විශ්වාසවන්ත තොරතුරු සැපයීම අපේක්‍ෂා කෙරේ. මූල්‍යමය, මෙහෙයුම්ගත සහ අනුකූලතා පාලනය කිරීම මෙන්ම අවදානම් කළමනාකරණය ද අන්තර්ගතව සෑම ආකාරයකම පාලනය කිරීම් මෙම වගකීම මඟින් ආවරණය කරයි. දෙන ලද කාලපරිච්ජේදයක් තුළ අඩුලුහුඩුකම් සහ අක්‍රමිකතා පෙන්වා දෙනු ඇතැයි අනිවාර්ය සහතිකයක් ඉදිරිපත් නොකරන අතර ඉන් සාධාරණ සහතිකයක් පමණක් ලබාදෙනු ඇති බව අවශ්‍යයෙන්ම දැක්විය යුතුයි.

අභ්‍යන්තර පාලන පටිපාටියේ ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා සහ සංවර්ධනය පිළිබඳව අඛණ්ඩ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය වගකියනු ලැබේ.

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෘත්තිය සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කටයුතු සිදුකරයි. අනුකුල හා ස්වාධීන පරීක්ෂණ අභ්‍යන්තර පාලනයන් භාවිතයෙන් ඇගයීම, එක් එක් අංශයන්හි අවදානම් ක්ෂේත්‍ර පිළිබඳව අවබෝධ කර ගැනීම සහ කළමනාකරණ පාලන කාර්යයන් ඇගයීම සඳහා විගණන සැලසුම් ක්‍රියාත්මක කරයි.

සමාලෝචිත වර්ෂයේදී තම විගණන පැවරුම් වලට අමතරව අභ්‍යන්තර විගණනය විසින් පහත සඳහන් ක්ෂේත්‍ර වෙතද අවධානය යොමු කරන ලදී.

1. ගණකාධිකරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණවත්භාවය සහ අදාලත්වය පිළිබඳව සමාලෝචනය කිරීම සහ ඇගයීම.

2. වෙළඳ ලැබීම් ද ඇතුළුව ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය පිළිබඳ සමාලෝචනය කිරීම.

3. රජයේ විගණනය මඟින් බාහිර විගණන ප්‍රශ්න වෙත එවා ඇති පිළිතුරු වල අදාලත්වය සහ පිළිගැනීම ඇගයීම.

4. සම්පත් ඵලදායි ලෙස භාවිතා කිරීම උපරිම කිරීම සඳහා විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ජා කිරීම.

5. භාවිතයේ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිත්වය සහතික කිරීම, වත්කම් ආරක්ෂා කිරීම සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව යහපත් දර්ශනයක් සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන ගැටළු මතු කිරීම.

# මූල්‍ය ප්‍රකාශන

- විස්තීරණ ආදායම් ප්‍රකාශය
- මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය

# විස්තිරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට අවසන් වු වර්ෂය සඳහා

| | සටහන් | සංස්ථාව 2012 රු. මිලියන | සංස්ථාව 2011 රු. මිලියන | සමාගම 2012 රු. මිලියන | සමාගම 2011 රු. මිලියන |
|---|---|---|---|---|---|
| ආදායම | 1 | 512,910.308 | 356,442.364 | 514,546.562 | 356,895.047 |
| විකුණුම් පිරිවැය | 2 | (568,572.793) | (428,070.572) | (575,399.595) | (433,969.689) |
| **දළ ලාභය/ (අලාභය)** | | **(55,662.485)** | **(71,628.208)** | **(60,853,033)** | **(77,074.642)** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | 434.700 | 230.413 | 543.118 | 378.436 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 3.1 | (12,633.096) | (10,861.465) | (2,773.532) | (1,142.937) |
| පරිපාලන වියදම් | 3.2 | (5,800.737) | (3,425.924) | (8,801.501) | (5,517.977) |
| මූල්‍ය වියදම් | 3.3 | (18,359.678) | (9,000.571) | (18,360.200) | (9,002.041) |
| මූල්‍ය අදායම් | 3.4 | 2,413.145 | 304,455 | 2,472.059 | 319.366 |
| ආයෝජිත දේපළ මත ආදායම් | 3.5 | 38.976 | 24.657 | 38.976 | 24.657 |
| **බදු පෙර ලාභය/ අලාභය** | | (89,569.175) | (94,356.643) | (87,734.113) | 92,015.138 |
| ආදායම් බදු වියදම් | | -- | -- | (75.914) | (752.287) |
| **අතිවිශේෂ ක්‍රියාකාරකම් පෙර බදු ලාභය/(අලාභය)** | | **(89,569.175)** | **(94,356.643)** | **(87,810.026)** | **(92,767.426)** |
| අඩු කළා : හෙජින් වියදම් | | (7,611.600) | -- | (7,611.600) | -- |
| **අතිවිශේෂ ක්‍රියාකාරකම් පෙර බදු ලාභය/(අලාභය)** | | **(97,180.775)** | **(94,356.643)** | **(95,421.626)** | **(92,767.426)** |
| **වෙනත් විස්තිරණ ආදායම්** | | | | | |
| ආයෝජන මත අලාභ | | (51.500) | (41.000) | (51.500) | (41.000) |
| ආයුගණන අලාභ | | (76.098) | (105.803) | (76.098) | (105.803) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තිරණ අලාභ** | | (127.598) | (146.803) | (127.598) | (146.803) |
| **වර්ෂය සඳහා වෙනත් මුළු විස්තිරණ අලාභ** | | **(97,308.373)** | **(94,503.446)** | **(95,549.224)** | **(92,914.229)** |
| අඩු කළා : පාලනය නොකරන පොලිය | | -- | -- | (586.383) | (529.739) |
| **වර්ෂය සඳහා ලාභය/ (අලාභය)** | | **(97,308.373)** | **(94,503.446)** | **(96,135.607)** | **(93,443.968)** |

පිටු අංක. 46 - 58 දක්වා සඳහන් සටහන් මූල්‍ය ප්‍රකාශයේ අනුකූල කොටසිනි.

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | සංස්ථාව 2012.12.31 රු. මිලියන | සංස්ථාව 2011.12.31 රු. මිලියන | සංස්ථාව 2010.12.31 රු. මිලියන | සමාගම 2012.12.31 රු. මිලියන | සමාගම 2011.12.31 රු. මිලියන | සමාගම 2010.12.31 රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4 | 9,572.201 | 8,823.681 | 8,252.799 | 28,627.947 | 29,006.192 | 27,728.563 |
| ආයෝජන දේපළ | 4.5 | 26.970 | 26.691 | 27.285 | 26.970 | 26.691 | 27.285 |
| අස්පෘශ්‍ය වත්කම් | 4.7 | -- | -- | -- | 229.428 | 266.852 | 349.047 |
| ආශ්‍රිත සමාගම් ආයෝජන | 5.1 | 5,000.000 | 5,000.000 | 5,000.000 | -- | -- | -- |
| වෙනත් අයෝජන | 5.2 | 53.126 | 104.626 | 145.626 | 53.126 | 104.626 | 145.626 |
| ස්ථිර තැන්පතු ආයෝජන | 5.3 | 5.000 | 5.000 | 5.000 | 5.000 | 5.000 | 5.000 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ - වසරකට වැඩි | 6 | 16,110.986 | 41,168.548 | 6,699.985 | 14,682.463 | 742.965 | 3,538.115 |
| විලම්භිත බදු වත්කම් | | -- | 689.623 | 689.623 | -- | 689.623 | 689.623 |
| | | **30,768.283** | **18,818.169** | **20,820.318** | **43,624.935** | **30,841.948** | **32,483.259** |
| ***ජංගම වත්කම්*** | | | | | | | |
| තොග | 7 | 62,189.825 | 37,078.486 | 41,407.414 | 62,550.296 | 37,450.028 | 41,814.202 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ - වසරක් තුළ | 6 | 101,403.011 | 118,384.937 | 80,022.307 | 104,303.415 | 121,343.506 | 81,731.835 |
| ආදායම් බදු ආපසු ගැනීම් | | 246.990 | 246.990 | 244.357 | 628.057 | 525.174 | 574.893 |
| අතැති මුදල් හා බැංකුගත මුදල් | 8 | 11,623.634 | 12,686.986 | 13,312.111 | 12,085.561 | 13,081.902 | 13,603.197 |
| | | 175,463.460 | 168,397.399 | 134,986.189 | 179,567.329 | 172,400.609 | 137,724.127 |
| **මුළු වත්කම්** | | **206,231.743** | **187,215.568** | **155,806.507** | **223,192.264** | **203,242.557** | **170,207.386** |
| **ස්කන්ධ හා වගකීම්** | | | | | | | |
| ***ප්‍රාග්ධන හා සංචිත*** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 9 | 1,000.000 | 1,000.000 | 1,000.000 | 1,000.000 | 1,000.000 | 1,000.000 |
| CPSTL සමාගමේ පැවති කොටස් | | 2,500.000 | 2,500.000 | 2,500.000 | 2,500.000 | 2,500.000 | 2,500.000 |
| ප්‍රාග්ධන සංචිත | 10 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 | 4,992.686 |
| රක්ෂණ සංචිත | | -- | -- | 619.432 | -- | -- | 619.432 |
| ඒකාබද්ධ සංචිත | | -- | -- | -- | 2,485.643 | 2,485.643 | 2,485.643 |
| රඳවාගත් ඉපැයීම් | | (237,037.201) | (139,728.828) | (46,480.698) | (233,748.588) | (138,240.147) | (46,051.496) |
| පාලනය නොකරන පොලිය | | -- | -- | -- | 5,387.128 | 4,487.162 | 3,957.423 |
| **මුළු ස්කන්ධය** | | **(228,544.515)** | **(131,236.142)** | **(37,368.580)** | **(217,383.131)** | **(122,774.656)** | **(30,496.311)** |
| ***ජංගම නොවන වගකීම්*** | | | | | | | |
| විශ්‍රාම පාරිතෝෂිත වගකීම | | 546.935 | 626.675 | 746.337 | 1,652.777 | 1,481.089 | 1,594.572 |
| විලම්භිත බදු | | -- | -- | -- | 366.065 | 1,243.095 | 712.662 |
| ණය හා ගැනීම් සඳහා පොලිය | 11 | 1,998.218 | 27,645.587 | 28,477.292 | 4,521.422 | 29,399.240 | 30,690.421 |
| | | **2,545.153** | **28,272.262** | **29,223.629** | **6,540.265** | **32,123.424** | **32,997.654** |
| ***ජංගම වගකීම්*** | | | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 12 | 220,897.351 | 167,033.008 | 145,633.316 | 221,848.494 | 169,792.400 | 148,674.564 |
| ණය හා ගැනීම් සඳහා පොලිය | 13 | 211,163.063 | 122,975.749 | 18,147.451 | 212,015.945 | 123,930.697 | 18,860.788 |
| ලාභාංශ බදු සඳහා වෙන් කිරීම් | | 170.691 | 170.691 | 170.691 | 170.691 | 170.691 | 170.691 |
| | | 432,231.105 | 290,179.448 | 163,951.458 | 434,035.130 | 293,893.788 | 167,706.043 |
| **මුළු ස්කන්ධ සහ වගකීම්** | | **206,231.743** | **187,215.568** | **155,806.507** | **223,192.264** | **203,242.556** | **170,207.386** |

පිටු අංක. 46 සිට 58 දක්වා සඳහන් සටහන් මූල්‍ය ප්‍රකාශයේ අනුකූලන කොටසිනි.

**තිලක් කොල්ලූරේ**
සභාපති

**එල්.ට්. සුසන්ත සිල්වා**
කළමනාකාර අධ්‍යක්ෂ

**ඩබ්. සරත් පෙරේරා**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**ආර්.ටී.ඒ. දාබරේ**
මුදල් කළමනාකාර

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳව ප්‍රකාශය

රු.මිලියන

| | දායක ප්‍රාග්ධනය | CPSTL හි කොටස් | ප්‍රාග්ධන සංචිත | රක්‍ෂණ සංචිත | ඒකාබද්ධ සංචිත | රඳවාගත් ඉපැයුම් | කොටස්කරුවන්ගේ අරමුදල | පාලනය කළ නොහැකි පොළිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,000.000 | 2,500.000 | 4,992.686 | 619.432 | 2,485.643 | (46,051.496) | (34,453.735) | 3,957.423 | (30,496.312) |
| **විස්තිරණ ආදායම** | | | | | | | | | |
| වර්ෂය සඳහා අලාභය | | | | | | (93,297.165) | (93,297.165) | | (93,297.165) |
| වර්ෂය සඳහා වන වෙනත් විස්තිරණ ආදායම | | | | | | (146.803) | (146.803) | | (146.803) |
| **2011 වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම** | | | | | | **(93,443.968)** | **(93,443.968)** | | **(123,940.280)** |
| වර්ෂය තුළ එකතු කිරීම් | | | | | | | -- | | -- |
| වර්ෂය තුළ අතිරික්තය | | | | 0.776 | | 635.108 | 635.884 | | 635.884 |
| රඳවාගත් ඉපැයුම්/ ප්‍රත්‍යාවර්තන වෙත මාරුකිරීම් | | | | (620.208) | | 620.208 | -- | | -- |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,000.000** | **2,500.000** | **4,992.686** | **--** | **2,485.643** | **(138,240.148)** | **(124,776.175)** | **4,487.167** | **(122,774.656)** |
| **විස්තිරණ ආදායම** | | | | | | | | | |
| වර්ෂය සඳහා අලාභය | | | | | | (96,008.009) | (96,008.009) | | (96,008.009) |
| වර්ෂය සඳහා වන වෙනත් විස්තිරණ ආදායම | | | | | | (127.598) | (127.598) | | (127.598) |
| CPSTL රඳවාගත් ඉපැයුම් සඳහා ගැලපීම් | | | | | | 627.167 | 627.167 | | 627.167 |
| 2012 සඳහා මුළු විස්තිරණ ආදායම | | | | -- | | (95,508.440) | (96,135.607) | | (95,508.440) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,000.000** | **2,500.000** | **4,992.686** | **--** | **2,485.643** | **(233,748.588)** | **(222,770.258)** | **5,387.128** | **(217,383.130)** |

පිටු අංක 46 සිට 58 දක්වා සඳහන් සටහන් මූල්‍ය ප්‍රකාශනයේ අනුකූලන කොටසිනි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට අවසන් වු වර්ෂය සඳහා

| | | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන් | 2012 රු. මිලියන | 2011 රු. මිලියන | 2012 රු. මිලියන | 2011 රු. මිලියන |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වන මුදල් ප්‍රවාහ** | | | | | |
| මෙහෙයුම් වලින් උත්පාදනය වු මුදල් | 14 | (50,699.387) | (93,710.317) | (49,807.891) | (90,124.146) |
| ගෙවන ලද පොළී | | (18,359.678) | (9,000.571) | (19,084.230) | (9,647.458) |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික | | (39,000) | (42.801) | (102.938) | (95.551) |
| ගෙවන ලද ආදායම් බදු/ WHT | | 689.623 | (2.633) | 574.622 | (172.134) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරනලද ශුද්ධ මුදල්** | | **(68,408.442)** | **(102,756.322)** | **(68,420.436)** | **(100,039.288)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වන මුදල් ප්‍රවාහ** | | | | | |
| දේපළ පිරියත හා උපකරණ පවරා ගැනීම | | (1,280.428) | (989.091) | (1,356.747) | (2,835.864) |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් වන නිකුතුන් | | 15.762 | 40.674 | 16.098 | 48.604 |
| ආයෝජන ආදායම් | | 0.003 | 0.003 | 0.003 | 0.003 |
| පොළී ලැබීම් | | 2,413.145 | 304.455 | 2,472.059 | 319.366 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල්** | | **1,148.481** | **(643.959)** | **1,131.413** | **(2,467.892)** |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් උපදවන මුදල් ප්‍රවාහ** | | | | | |
| කාලපරිච්ඡේදය තුළ ලබා ගන්නා ලද ණය | | -- | -- | 1,135.400 | 150.269 |
| කාලපරිච්ඡේදය තුළ ශුද්ධ බදු මුදල් යෙදවීම් | | -- | -- | -- | (15.420) |
| දීර්ඝ කාලීන නැවත ගෙවීම් | | 62,539.945 | 119,016.505 | 61,480.735 | 117,835.346 |
| පාලනය නොකරන පොළී | | -- | -- | -- | -- |
| **මුල්‍ය ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල්** | | **62,539.945** | **119,016.505** | **62,616.135** | **117,970.195** |
| මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම්) | | (4,720.016) | 15,616.224 | (4,672.888) | 15,463.015 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | | 11,655.102 | (3,961.122) | 11,704.819 | -- |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 8 | **6,935.086** | **11,655.102** | **7,031.931** | **15,463.015** |

පිටු අංක 46 සිට 58 දක්වා සඳහන් සටහන් මුල්‍ය ප්‍රකාශයේ අනුකූලන කොටසිනි.

# වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 01. සංස්ථාපිත තොරතුරු

### 1.1. වාර්තා කිරීමේ ඒකකය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතින් ලියාපදිංචි කොට පිහිටවනු ලැබූ රාජ්‍ය සංස්ථාවකි. මෙහි ලියාපදිංචි කළ ප්‍රධාන කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්‍යයන් වනුයේ, බොරතෙල් ආනයනය හා පිරිපහදු කිරීම, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදනයන් ආනයනය කිරීම හා ශ්‍රී ලංකාව තුළ බෙදාහැරීමයි.

### 1.3 ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය හා ආශ්‍රිත සමාගම් අතර සබඳතාව

ඛනිජ තෙල් සංස්ථාව, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්‍ෂණය යටතේ පවත්වාගෙන යන ව්‍යාපාරයකි. අධ්‍යක්‍ෂවරුන්ගේ අදහසට අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරණය හා පාලනය සම්බන්ධ අවසාන තීරණය ගනු ලබන්නේ ශ්‍රී ලංකා රජය විසිනි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස් වලින් 2/3 ක් සංස්ථාව සතුවේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ බලය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තීරණය අනුව 2014 පෙබරවාරි 18 වන දින අනුමත කරන ලදී.

## 02. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ විධිවිධාන ප්‍රකාර ගණකාධිකරණ ප්‍රමිතීන්හි සාමාන්‍යයෙන් පිළිගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති අනුව ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි. SLFRS/LKAS අනුව පිළියෙල කරන ලද සංස්ථාවේ පළමු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මේවා වෙයි.

සටහන 18 හි පෙන්වා දෙන ලද ඇතැම් වෙනස්කම් සහ වෙන් කිරීම් සමඟ අනුගතව SLFRS/LKAS ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මෙහි දක්වා ඇති කාලපරිච්ඡේදය පුරා, 2011 ජනවාරි 1 දිනට වන SLFRS මූල්‍ය තත්ව ප්‍රකාශයේ ආරම්භක ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා සංස්ථාව මෙම ගණකාධිකරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් භාවිතා කරන ලද අතර, සංස්ථාවේ වාර්තා කරන ලද මූල්‍ය තත්වය පිළියෙල කිරීමේදී SLFRS/LKAS වෙනස්වීම් ප්‍රකාශයේ බලපෑම සටහන 18(ආ)/6(ආ)/(ඇ) හි අනාවරණය කරන ලද අතර, 2011 දෙසැම්බර් 31 දිනට අවසන්වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල භාවිතා කරන ලද ගණකාධිකරණ ප්‍රතිපත්තිවල කැපී පෙනෙන වෙනස්කම්හි ස්වභාවය සහ බලපෑම ඇතුළුව මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පෙර භාවිතා කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් ප්‍රකාර සකස්කර ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, සඳහන් නොකරන ලද අවස්ථාවකදී සෑම අගයක්ම ආසන්න මිලියනයට වටයා ඇත.

### 2.1.2 නිකුත් කළ නමුත් ගලපා නොගන්නා ලද ගණකාධිකරණ ප්‍රමිතීන්

ආ) 2012 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා වලංගු නොවෙන කලින් ගලපා නොගන්නා ලද නව ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථදැක්වීම්;

(i) SLFRS 13, සාධාරණ වටිනාකම් මිණුමේ නීති මූලාශ්‍රය සහ SLFRS හරහා භාවිතා කිරීම සඳහා වන අනාවරණ අවශ්‍යතා මගින් සංගතතාවය වැඩිදියුණු කිරීම සහ ව්‍යාකූලත්වය අඩු කිරීම "සාධාරණ වටිනාකමේ මිණුම්" මගින් ඉලක්ක කරනු ඇත.

(ii) SLFRS 9, "මූල්‍ය මෙවලම්" මගින් වර්ගීකරණය, මැනීම සහ මූල්‍ය වත්කම් සහ බැරකම් හඳුනා ගැනීම සිදුකරයි. SLFRS 9 මගින් LKAS 39 කොටස් ප්‍රතිස්ථාපනය කරයි, එය මූල්‍ය මෙවලම්වල වර්ගීකරණය සහ මිණුම් සමග සම්බන්ධ වේ: SLFRS 9 සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ දෙකකට වර්ගීකරණය කිරීම අවශ්‍ය වේ; එනම් සාධාරණ වටිනාකම යටතේ සහ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ මනිනු ලබයි. මූලික හඳුනා ගැනීම සහ වර්ගීකරණය යටතේ නිර්ණය කිරීම සිදුකරනු ලබයි. එය ආයතනයේ ව්‍යාපාරික ආකෘතිය මත රඳා පවති. SLFRS 9, හි සම්පූර්ණ බලපෑම ඇගයීමට සංස්ථාව විසින් තවම කටයුතු කර නොමැත.

(iii) SLFRS 12, අනෙකුත් ආයතනවල, සාමූහික සමාගම් සහ සහාය සමාගම්ද ඇතුළුව සෑම ආකාරයේම රුචිකත්වයන් සඳහා ආවරණ අවශ්‍යතාද ඇතුළුව "අනෙකුත් ආයතනයන්හි ආවරණ රුචිකත්වයන්" සංස්ථාව කෙරේ භෞතික බලපෑමක් ඇතිකළ හැකියැයි අපේක්ෂා කළ හැකි ආකාරයේ අනෙකුත් SLFRS ක්‍රියාත්මක නොවේ.

### 2.1.3 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ සහ එහි සංශෝධන ප්‍රකාර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

## 2.1.4 **අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්ප**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ පැහැපත් අනාගතයක් සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය මතය. 2012 දෙසැම්බර් 31 දිනට අවසන්වූ වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව රු. මිලියන 217,383 ක සෘණ ස්කන්ධ තත්වයක් සහ රු. මිලියන 96,135 ක අලාභයක් සංස්ථාව විසින් දැරුව නමුත්, එහි මෙහෙයුම්වල පරිමාණයන් භෞතික ලෙස අඩු කිරීමේ හෝ ඇවර කිරීමේ හෝ අවශ්‍යතාවයක් හෝ අරමුණක් සංස්ථාවට නොමැති බව උපකල්පනය කර ඇත. ලංකා බැංකුවේ ඇ.එ.ජ. ඩොලර් 1000 ක් වන සහ මහජන බැංකුවේ ඇ.එ.ජ. ඩොලර් 1000 ක් වන සහ මහජන බැංකුවේ ඇ.එ.ජ. ඩොලර් 650 ක් වන විදේශ මුදල් ණය ගෙවා දැමීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් භාණ්ඩාගාර ඇපකර නිකුත් කරන ලදී. සෑම ණයවර ලිපියක්ම ලංකා බැංකුව සහ මහජන බැංකුව හරහා ක්‍රියාත්මක වේ.

## 2.1.5 **සංසන්දනාත්මක තොරතුරු**

මෙම වසරේ ඉදිරිපත් කිරීම්වල පවත්නා වෙනස්කම්වලට අනුගත වීමට අවශ්‍ය අවස්ථාවන්වලදී ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් ගළපා ගැනීම සමඟ තුලනයන් සිදුකරන ලදී.

## 2.2 **වැදගත් ගිණුම්කරන තීරණයන්, තක්සේරු කිරීම් හා උපකල්පනයන් සාරාංශය**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති සමඟ අනුගත වෙමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතැම් තීරණාත්මක ගණකාධිකරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. සංස්ථාවේ ගණකාධිකරණ ප්‍රතිපත්ති ගැළපීමේදී තම නිර්ණය කිරීමේ හැකියාව භාවිතා කිරීමට කළමනාකාරීත්වයට සිදුවේ. ඉතා ඉහළ මට්ටමේ විනිශ්චය කිරීමක් හෝ විවිධත්වයක් අවශ්‍ය ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු අවශ්‍ය අවස්ථා පහත දක්වා ඇත.

***විශ්‍රාම බැඳීම් (පාරිතෝෂිත)***

උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණන පදනම මත නිර්ණය කරනු ලබන කරුණු ගණනාවක් මත විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම පදනම් වේ. විශ්‍රාම පිරිවැය නිර්ණය කිරීමේදී භාවිතා කරන ලද මෙම උපකල්පන සඳහා වට්ටම් අනුපාත ද අන්තර්ගත වේ. විශ්‍රාම වැටුප් බැඳීමේ ප්‍රමාණය සඳහා උපකල්පනයන් හි ඕනෑම වෙනසක් බලපානු ඇත. සෑම වර්ෂයකම අවසානයේදී, අදාළ වට්ටම් අනුපාත කළමනාකාරීත්වය විසින් තීරණය කරයි. විශ්‍රාම බැඳීම් පියවීම සඳහා අවශ්‍යවේ යැයි අපේක්ෂාකළ හැකි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ වාර්තමාන අගය නිර්ණය කිරීම සඳහා භාවිතා කළ යුතු පොලී අනුපාතය මෙය වේ. වට්ටම් අනුපාතය නිර්ණය කිරීමේදී, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත ඇපකර සඳහා වෙළඳපල නොමැති අවස්ථාවලදී, රජයේ ඇපකර වල පොළී අනුපාත කළමනාකාරීත්වය විසින් සලකා බලනු ලබයි.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන පවත්නා වෙළඳපළ තත්වයන් මත රඳා පවතී. අතිරේක තොරතුරු සටහන 24 හි පෙන්වා ඇත.

***අලෙවිය සඳහා පවත්නා කොටස් අඩු වීම***

අලෙවිය සඳහා පවත්නා කොටස් අඩුවන අවස්ථා වලදී එය නිර්ණය කිරීම සඳහා LKAS 39 මාර්ගෝපදේශන සංස්ථාව විසින් අනුගමනය කරනු ලබයි. මෙම නිර්ණය කිරීම සඳහා කැපීපෙනෙන විනිශ්චයක් අවශ්‍ය වේ. මෙම විනිශ්චය සිදු කිරීමේදී, කළමනාකාරීත්වය විසින් ඇගයීමට ලක්කරන අනෙකුත් කරුණු අතර, ආයෝජනයක සාධාරණ වටිනාකමේ කාලපරිච්ජේදය සහ ප්‍රමාණය එහි පිරිවැයට වඩා අඩු බව සහ ආයෝජකයාගේ මූල්‍ය තත්වය සහ කෙටි කාලීන ව්‍යාපාරික දෘෂ්ටිය, කර්මාන්ත සහ ආංශික කාර්යසාධනය ද ඇතුළුව තාක්‍ෂණික සහ මෙහෙයුම් වෙනස්කම් සහ මූල්‍ය ප්‍රවාහ වෙනස්වීම් යන කරුණු සළකා බලයි.

## 2.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.3.1 විදේශ විනිමය ගණුදෙනු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකාවේ නිල මුදල් ඒකකය වන රුපියල යොදාගෙන තිබේ.

විදේශ විනිමය ඒකකයන් පදනම් කර ගෙන සිදුවන ගණුදෙනු ඒ ඒ විදේශ මුදල් ඒකකයන්ට අදාලව ගණුදෙනුව සිදුව පැවති දිනයට අදාලවන විදේශ විනිමය අනුපාතිකය යොදාගෙන දේශීය ව්‍යවහාර මුදල් පදනම යොදාගෙන මූලික වශයෙන් ගිණුම් වල වාර්තා කිරීම සිදුකරයි. එහිදී ඇතිවන විදේශ විනිමය වාසි හා පාඩු අදායම් ගිණුමට ගලපනු ලබයි. විදේශ මුදල් ඒකකයන්ගේ ස්වරූපයෙන් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් දේශීය ව්‍යවහාර මුදල් ඒකකයට අදාලව ශේෂපත්‍ර දිනයට පැවති විනිමය අනුපාත යොදාගෙන පරිවර්තනය සිදුකරනු ලබයි. මූල්‍යමය නොවන ස්වරූපයේ පවතින සියළු දෑ ඓතිහාසික පිරිවැය පදනමට අනුව එම ගනුදෙනුව සිදුවන මුල් දිනට පැවතුනු විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කර වාර්තා කරයි.

විදේශ මුදල්වල සාධාරණ අගය යටතේ මනිනු ලබන මූල්‍යමය නොවන අයිතම සාධාරණ අගය නිර්ණය කරනු ලබන දිනට පවත්නා විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කර ඇත.

### 2.3.2 බදුකරණය

***ප්‍රවර්තන බදු***

ප්‍රවර්තන පූර්ව කාලසීමාවක් සඳහාවූ ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ බදු බලධාරීන් වෙතින් ලැබියයුතු හෝ ඔවුන් වෙත ගෙවියයුතු යැයි අපේක්‍ෂිත මුදල පදනම් කරගෙනය. මුදල ගණනය කිරීමට උපයෝගි කරගත් බදු අනුපාතිකය හා බදු නීති වනුයේ ශේෂ පත්‍ර දිනට බලපවත්වන හෝ ප්‍රමාණාත්මක බලපවත්වන අනුපාතික හා නීතින්ය.

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් කර තිබෙන ආදායම් හා වියදම් මූලිකාංග මත වන අතර, එය ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරන ආදායම් බදු පනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලවය. කෙසේ වෙතත්, සංස්ථාව අධික පාඩු ලබන හෙයින් මෙම වසරේදී බදු ගෙවීමට සිදු නොවුණු අතර, 2011/12 ඇගයීම් වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි වසර 05 ක බදු රහිත කාලයක් ලබාදී තිබුණි.

***විලම්භිත බදුකරණය***

ශේෂ පත්‍ර දිනය වන විට වත්කම් හා වගකීම් වල බදු පදනම හා මූල්‍ය වාර්තාකරණ කාර්‍යයන් සඳහා ඒවායේ ධාරනීය අගය අතර වූ තාවකාලික විචලන මත වගකීම් ක්‍රමය උපයෝගි කරගනිමින් විලම්බිත අදායම් බදු සඳහා ප්‍රතිපාදන වෙන් කෙරේ.

ව්‍යාපාරික සංකලනයක් නොවන ගනුදෙනුවක් නොවන්නා වූද එම ගනුදෙනු අවස්ථාවේදී ගණනය කළ ලාභය හෝ බදු පැනවිය හැකි ලාභය හෝ පාඩුවට බලපෑමක් නොවන්නා වූද වත්කමක් හෝ වගකීමක් මුල් වරට හඳුනාගැනීමේදී පැන නගින විචලන හැර බදු පැනවිය හැකි සියළුම තාවකාලික විචලන සඳහා විලම්බිත අදායම් බදු වගකීම් පිළිගැනේ.

අඩුකළ හැකි තාවකාලික විචලන, උපයෝගි නොකල බදු වත්කම් හා බදු අලාභ වල ඉදිරියට ගෙන ගිය අගය සඳහා වූ බදු පැනවිය හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාවක් තිබෙන තාක් හා අඩු කළ හැකි තාවකාලික විචලන උපයෝගි නොකළ බදු වත්කම් හා අලාභ වල ඉදිරියට ගෙන ගිය අගය ඒ සඳහා උපයෝගි කළ හැකි නම් අඩුකල හැකි තාවකාලික විචලන වලට අදාල විලම්බිත අදායම් බදු වත්කම් හැර ව්‍යාපාරික සංකල්පයක් නොවන ගනුදෙනුවක් නොවන්නා වූද එම ගනුදෙනු අවස්ථාවේදී ගණනය කළ ලාභය හෝ බදු පැනවිය හැකි ලාභය හෝ පාඩුවට බලපෑමක් නොවන්නා වූද වත්කමක් හෝ වගකීමක් මුල්වරට හඳුනාගැනීමේදී පැනනගින විලම්බිත අදායම් බදු වත්කම් පිළිගැනේ.

සෑම ශේෂ පත්‍ර දිනකම විලම්බිත අදායම් බදු වත්කම් අගය සමාලෝචනයට පාත්‍රවී සමස්ටයක් වශයෙන් උපයෝගි කරගෙන ප්‍රමාණවත් බදු පැනවිය හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාවය තවදුරටත් වෙළඳ නොවන තරමට එම විලම්බිත අදායම් බදු වත්කමින් අඩුකෙරේ.

විලම්බිත අදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ වත්කම අලෙවිකරණ හෝ වගකීම් පියවන වසරට අදාල අපේක්ෂිත බදු අනුපාතය අනුව වන අතර, එය පදනම්ව ඇත්තේ ශේෂ පත්‍ර දිනයට බලපවත්වන හෝ ප්‍රමාණාත්මකව බලපවත්වන බදු අනුපාත හා බදු නීතින්ය. ස්කන්ධයේදී සෘජුවම හඳුනාගෙන තිබෙන අයිතම වලට අදාල විලම්බිත අදායම් බදු හඳුනාගෙන තිබෙනුයේ අදායම් ප්‍රකාශයේ නොව ස්කන්ධයේය.

***විකුණුම් බද්ද***

වත්කමක් හෝ සේවාවක් මිලදී ගැනීමේදී අයකරන විකුණුම් බදු, බදු බලධාරීන්ගෙන් අයකර නොගන්නා අවස්ථාවලදී හැර ආදායම්, වියදම් හා වත්කම් අලෙවි බද්දේ ශුද්ධ අගය ලෙස නොසැලකේ. එවැනි අවස්ථාවලදී අලෙවි බද්ද වත්කම් මිලෙහි කොටසක් ලෙස හෝ වැය අයිතමයේ කොටසක් ලෙස සළකනු ලැබේ. බදු බලධාරීන්ට අදාලව ලැබිය යුතු හා ගෙවිය යුතු අලෙවි බදු මුදල ශේෂ පත්‍රයේ ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල් යටතේ ඇතුලත්ය.

2.3.3 **ණය ගැනීම් සඳහා වූ පිරිවැය**

වත්කම්වල අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සුදානම්වීම පිණිස ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක් අවශ්‍යයෙන්ම ලබා ගන්නා වත්කම්, පවරා ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනය කිරීම් සඳහා සෘජුවම බලපානු ලබන සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීම් පිරිවැය, එවැනි වත්කම් අපේක්ෂිත භාවිතයට ලක් කිරීම හෝ අලෙවි කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි සුදානම්වන තුරු පිරිවැයට එකතු කර ඇත.

### 2.3.4 **තොග**

තොග තක්සේරු කරනු ලබනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් වඩාත් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධිත අගය යනු සම්පූර්ණ කිරීමට ඇස්තමේන්තුගත පිරිවැය හා අලෙවිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමෙන් පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් අදාළ අගයට විකිණිය හැකි මිලයි.

භාණ්ඩ තොග වර්තමාන තත්වයට ගෙන ඒමට අදාල වූ පිරිවැය පහත දැක්වෙන පිරිවැය සූත්‍රයන් උපයෝගි කරගෙන ගණනය කරනු ලබයි.

| අමුද්‍රව්‍ය | පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
|---|---|
| **නිමි භාණ්ඩ,**<br>(අ) පිරිපහදු කළ නිෂ්පාදන<br><br>(ආ) ආනයන | සෘජු ද්‍රව්‍ය, සෘජු කුළි හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය.<br><br>පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
| **නොනිමි වැඩ**<br>(අ) පිරිපහදු කළ නිෂ්පාදන<br><br>(ආ) ආනයන | සෘජු ද්‍රව්‍ය, සෘජු කුළි හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන පොදුකාර්යය පිරිවැයේ උචිත අනුපාත අගය.<br><br>පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල |
| වෙනත් නිමි භාණ්ඩ | භරිත සාමාන්‍ය පදනම මත ගැනුම් මිල |
| පාරිභෝජන හා අමතර කොටස් | භරිත සාමාන්‍ය පදනම මත ගැනුම් මිල |

### 2.3.5 **වෙළඳ සහ අනෙකුත් ලැබීම්**

සේවාදායකයන්ගෙන් ඉන්ධන අලෙවිය සඳහා ලැබිය යුතු ණය වෙළඳ ලැබීම් වේ. වෙළඳ ලැබීම් මූලික වශයෙන් සාධාරණ අගය යටතේ හඳුනාගෙන ඇති අතර, ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ මැන බලනු ලබයි.

අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු අනෙකුත් ලැබීම් සහ ණය අඩුකිරීම සඳහා වන පිරිවැය රහිත විධිවිධාන යටතේ හඳුනාගෙන ඇත.

### 2.3.6 **මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් හා මුදල් සමාන දෑ යනු අත ඉතිරි මුදල්, ඉල්ලුම් තැන්පතු හා වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමකට පමණක් භාජනය විය හැකි හා මුදල් වලට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි කෙටිකාලීන අධි ද්‍රවශීල ආයෝජනයන් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා වන මුදල් හා මුදල් සමාන දෑ වෙත ඇතුලත් වනුයේ අත ඉතිරි මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ හිඟ අගයන්ය. කෙටි කල්පිරීමේ ආයෝජනයන්ද (එනම් ලබාගත් දිනයේ සිට තුන් මසක් හෝ ඊට අඩු) මුදල් සමානයන් ලෙස සැලකේ.

2.3.7 **දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල එදිනදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ පිරියත හා උපකරණ වල කොටස් ආදේශ කිරිමේ පිරිවැය එය දරණ අවස්ථාවේදී හඳුනාගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම් එකී වියදම්ද එවැනි පිරිවැයට ඇතුලත්වනු ඇත. ගොඩනැගිලි සඳහා වූ සමුච්චිත ක්ෂය පිරිවැයෙන් අඩුකර ඉඩම් ගොඩනැගිලි වල අගය ගණනය කර ඇත.

වත්කමේ ශේෂ අගය, උපයෝගි කරගත හැකි ආයු කාලය හා ක්ෂය කිරිමේ ක්‍රම සෑම මුදල් වර්ෂයක අවසානයේදීම සමාලෝචනයට භාජනය වන අතර උචිත පරිදි වෙනස් කෙරේ.

2.3.8 **මිණුම්**

වත්කමක් ලෙස සැලකෙන දේපළ පිරියත හා උපකරණ එකී වත්කම අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම හෝ අභඹු වියදම් සමඟ වන තක්සේරු කිරීම සඳහා සෘජුවම අදාලවන මිලට මූලික වශයෙන් මැණිම සිදුකරයි.

ස්වයං නිර්මිත වත්කම් පිරිවැය තුළ ද්‍රව්‍යමය පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම් ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා සෘජුවම අදාල වන ඕනෑම පිරිවැයක් සහ අයිතමයන් බිඳදැමීම සහ ඉවත් කිරීම සඳහා වන පිරිවැය සහ ඒවා පිහිටා ඇති භූමිය නැවත සකස් කිරීම සඳහා වන පිරිවැය අන්තර්ගත වේ.

2.3.9 **පිරිවැය ආකෘතිය**

පිරියත සහ උපකරණ සඳහා සංස්ථාව විසින් පිරිවැය ආකෘතියක් අදාල කර ගන්නා අතර, මිලදී ගන්නා හෝ ඉදිකිරීමේදී වන පිරිවැය ඒ සමඟ ඇතිවිය හැකි අභඹු වියදම් ද අඩුවෙන් ඒකරාශි කරන ලද ක්ෂයවීම් සහ ඕනෑම ඒකරාශි කරන ලද අපහායන අලාභයන් ද සමඟ වාර්තා කරනු ලබයි.

2.3.10 **පසු පිරිවැය**

චංචල දේපළ පිරියත සහ උපකරණයනිහි කොටසක් අදේශ කිරීමේ පිරිවැය එම කොටසේ අන්තර්ගත අනාගත අර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා එනු ඇති බවට විශ්වාසයක් පවතී නම්, එසේ පවත්නා වටිනාකම මත තිරණය කරනු ලැබේ.

2.3.11 **නැවත පිහිටවීමේ පිරිවැය**

නැවත පිහිටුවීම හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වාගෙන යාම සඳහා දේපළ පිරියත හා උපකරණ අලුත්වැඩියා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වන පිරිවැය වියදම් ලෙස අදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

2.3.12 **වටිනාකම නැවත ඇගයීම**

දේපළ පරියත හා උපකරණ අයිතමයන්ගේ මිල ඒවා නිෂ්කාශනය කිරීමේ හෝ එහි භාවිතය හෝ නිෂ්කාශනය මඟින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්‍ෂා කළ නොහැකි අවස්ථාවකදී, එහි වටිනාකම නැවත ඇගයීමට ලක් කරනු ඇත. දේපළ පිරියත හා උපකරණ අයිතමයන් නැවත වටිනාකම ඇගයීම තුළින් වන ඉපැයුම හෝ ආලභය එම අයිතමය නැවත ඇගයීමට ලක් කළ පසු ආදායම් ප්‍රකාශනයේ අන්තර්ගත කරනු ඇත.

2.3.13 **ක්ෂය වීම්**

විවිධ වර්ගයේ වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලයට අදාළ වන, කාලපරිච්ඡේදය පුරා සංස්ථාව විසින් සෘජු පදනමක් යටතේ ක්ෂයවීම් පෙන්වා දෙයි.

දේපළ පිරියත හා උපකරණවල ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන අනුපාතික පදනම මත සිදු කෙරේ.

වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය මත සරල රේඛීය පදනම යටතේ ක්ෂයවීම් ගණනය කර ඇත. ක්ෂයවීම් අනුපාත පහත සඳහන් පරිදි වේ.

| **වත්කම් කාණ්ඩය** | **ප්‍රතිශතය** |
|---|---|
| නිදහස් අයිතම සහිත ඉඩම් | Nil |
| ගොඩනැගිලි | 2.5 |
| නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | 2 |
| පිරිපහදු ටැංකි සහ නල මාර්ග | 2.5 |
| පිරිපහදු කම්හල සහ යන්ත්‍රසූත්‍ර | 10 |
| අනෙකුත් ටැංකි | 2.5 හෝ 5 |
| අනෙකුත් නල මාර්ග | 10 හෝ 20 |
| කම්හල සහ යන්ත්‍රසූත්‍ර | 10 හෝ 20 |
| බවුසර සහ ටැංකි ලොරි | 20 |
| වෑන් සහ දුම්රිය මැදිරි | 25 |
| 98/12/31 දක්වා ගෘහ භාණ්ඩ/ උපාංග සහ කාර්යාලීය උපකරණ | 100 |
| 99/12/31 දක්වා ගෘහ භාණ්ඩ/ උපාංග සහ කාර්යාලීය උපකරණ | 33 1/3 |
| SPM පරිශ්‍රය - ටැංකි පද්ධතිය | 2.5 |
| නල මාර්ග | 5 |
| බෝයාව | 10 |

2.3.14 **කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්ය්‍යය**

කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්ය්‍යයන් පිරිවැය යටතේ දක්වා ඇත. ගොඩනැගිලි ප්‍රධාන යන්ත්‍රාගාරය සහ යන්ත්‍රසූත්‍ර ඉදිකිරීම් සහ තොරතුරු සංවර්ධනය ආදිය සඳහා දැරීමට සිදුවූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්.

අඩු කාලයකින් කල්පිරීමට නියමිත, එනම් පවරාගන්නා ලද දිනයේ සිට මාස තුන හෝ ඊට අඩු කාලයකින්, ආයෝජන මුදල් හා සමාන අයිතම ලෙස සලකනු ඇත.

2.3.15 **මූල්‍ය නොවන වත්කම් ක්‍රමක්ෂය කිරීම**

දේපළ පිරියත සහ උපකරණවල ධාරණ ප්‍රමාණය නැවත අයකර ගැනීමට නොහැකි ලෙස ඇතැම් අවස්ථා වෙනස්වීම් වලදී පෙන්නුම් කරන විට ඒවා ක්‍රමක්ෂය කිරීම සඳහා සමාලෝචනය කරනු ලබයි. වත්කම්වල ධාරණ ප්‍රමාණය ඒවායේ නැවත අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන ප්‍රමාණ සඳහා ක්‍රමක්ෂයවන අලාභ හඳුනාගෙන ඇත. නැවත අයකර ගත හැකි ප්‍රමාණය වනුයේ වත්කම්වල සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය සහ භාවිත අගය අඩු කිරීමේදී වන ඉහළ ප්‍රමාණයයි.

ක්‍රමක්ෂය කිරීම ඇගයීම සඳහා, වෙන්වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ (මුදල් උත්පාදන ඒකක) සඳහා අඩුම මට්ටමෙන් වත්කම් කාණ්ඩ කර ඇත. අඩු වූ මූල්‍ය නොවන වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම අඩු කිරීම ආපසු හැරවිය හැකි වන පරිදි සමාලෝචනය කර ඇත.

2.3.16 **ණය ගැනීම් සඳහා වූ පිරිවැය**

ණය ගැනීම් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයෙනි. (සිදුකරන ලද ශුද්ධ ගනුදෙනුව). ණය ගැනීම් පසුව සිදු කරනුයේ ක්‍රමක්ෂය කරන ලද මිලක්‍රමය; ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ණය ගැනීම් සිදුකරන ලද කාලපරිච්ඡේදය පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, ආරම්භක (ශුද්ධ ගනුදෙනු පිරිවැය) සහ මුදාහැරීමේ අගයේ වෙනසක් වේ නම් හඳුනාගනු ලබයි. ණය පහසුකම් ලබා ගැනීම සඳහා ගෙවන ලද ගාස්තු එම ණය පහසුකම සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ලබා ගත හැකියි යන උපකල්පනය මත ණය පහසුකම් ලබා ගැනීම සඳහා වන ගනුදෙනු පිරිවැය ලෙස හඳුනා ගනු ලබයි. මෙවැනි අවස්ථාවකදී ණය ලබා ගැනීම ආරම්භවන තුරු ගාස්තුව විලම්භනය කරයි. ණය පහසුකම් කොටසක් හෝ එය සම්පූර්ණයෙන්ම ලබා ගැනීමේ අවිනිශ්චිතතාවයක් නොමැති බැවින්, ද්‍රවශීලී සේවාවන් සඳහා වන පෙර ගෙවීමක් වශයෙන් ගාස්තු මුදල් බවට පරිවර්තනය කර ණය පහසුකමට අදාළ කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරන ලදී.

2.3.17 **ආයෝජන**

2.3.17.1 **ආශ්‍රිත සමාගම් තුළ ආයෝජනය**

ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වන අංක. 26 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණයේ පිරිවැය ක්‍රමය යටතේ ආශ්‍රිත සමාගම් වල ආයෝජන ගණනය කර ඇත. ඒ අනුව, ආශ්‍රිත සමාගම් තුළ කරන ලද ආයෝජනයන්, පිරිවැය, අඩු පාඩු සහිත අලාභයක් යටතේ සංස්ථා ශේෂ පත්‍රයේ දක්වා ඇත.

2.3.18 **ආයෝජන දේපළ**

2.3.18.1 **අගය කිරීමේ පදනම**

ආයෝජන දේපළ යනු කුලී ඉපැයීම සඳහා රඳවා ගන්නා ලද හෝ ප්‍රාග්ධන අගය කිරීම් සඳහා හෝ ආයෝජන දේපළ හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා වන එහෙත් ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේදී අලෙවි කිරීමක් සිදු නොවෙන දේපළයි.

2.3.18.2 **මැනීම**

මූල්‍ය ප්‍රකාශනයේ පිරිවැය ක්‍රමය යටතේ අයෝජන දේපළ ගණනය කෙරෙනු ඇත. ඒ අනුව, වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව, දේපළ වල පිරිවැය, එහි ඒකාබද්ධ ක්ෂයවීම් වලින් හානියක් සහිත අලාභ අඩු කිරීම මත ගණනය කෙරේ.

2.3.18.3 **ක්ෂයවීම්**

මිලදීගත් දිනයේ සිට නිෂ්කාශනය කරන දිනය දක්වා වත්කමේ ඇස්තමේන්තුගත ආයුෂ අනුව සරල රේඛීය පදනමක් යටතේ ක්ෂයවීම් ලබාදෙයි.

2.3.18.4 **වටිනාකම නැවත අගය කිරීම**

ආයෝජන දේපළ වල වටිනාකම නැවත අගය කිරීම සිදුකරනුයේ එය නිෂ්කාශනය කිරීමෙන් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කිරීමට නොහැකි බැවින් භාවිතයෙන් මුලුමනින්ම ඉවත් කරන ලද හෝ අවස්ථාවකය. භාවිතයේ වෙනසක් පවතින අවස්ථාවකදී පමණක් ආයෝජන දේපළ හුවමාරුව සිදු කරයි.

## 3 ප්‍රතිපාදන හා වගකීම්

### 3.1 ප්‍රතිපාදන

ආර්ථික ප්‍රතිලාභයන් පිළිබිඹු කරන සම්පත් ගලායාමේ සම්භාවිතාවයන්ට අදාළ බැඳියාව පියවීම සඳහා අවශ්‍ය වූ විට බැඳියාවේ අගය සම්බන්ධයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වීම හා අතීත සිද්ධීන් හේතුකොටගෙන සංස්ථාවට වත්මන් (නීතිමය හෝ සම්මුතියකින්) බැඳියාවක් තිබෙන විට ප්‍රතිපාදන හඳුනා ගැනේ. ප්‍රතිපාදන සියල්ලම හෝ ඒවායින් කොටසක් ප්‍රතිපූර්ණය කිරීම සමාගමක් අපේක්ෂා කරන විට එවැනි ප්‍රතිපූර්ණයන් හඳුනාගන්නේ වෙනම වත්කමක් වශයෙනි. නමුත් මෙය බලපානුයේ ප්‍රතිපූර්ණය නියතවශයෙන් සහතික නම් පමණි.

කිසියම් ප්‍රතිපාදනයක් වෙනුවෙන් වූ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක අදායම් ප්‍රකාශනයක ඇතුළත් කෙරේ. මුදලේ වර්තමානකාල අගයේ බලපෑම වැදගත් නම් මුදලේ කාල අගයේ ප්‍රවර්තන වෙළඳ අගය පිළිබිඹු වන බදු අයකිරීමට පෙර අනුපාතිකයන් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් හා අදාල පරිදි වගකීමට ආවේනික වූ අවදානම මත ප්‍රතිපාදන තීරණය වේ. වට්ටම් යොදාගන්නා විට කාලයාගේ ඇවෑම නිසා ප්‍රතිපාදනයේ වැඩිවීම පොළී වියදමක් ලෙස සලකනු ලැබේ.

### 3.2 පාරිතෝෂිත ප්‍රතිපාදන

සෑම සේවකයෙක් සඳහාම සේවයේ පළමු වසර සිටම විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම සඳහා විධිවිධාන මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇත. පාරිතෝෂිත සම්බන්ධව ශේෂ පත්‍රයේ එන හඳුනාගෙන ඇති වගකීම් නම් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වන වගකීම් හි වර්තමාන අගයයි. LKAS - 19 මඟින් නිර්දේශකර ඇති පරිදි, ගණනය කරන ලද ඒකක බැරක්‍රමය භාවිතා කරමින් සංස්ථාව විසින් විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය ගණනය කරනු ලබයි.

### 3.3 නිශ්චිත දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල

අදාල නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයින්, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායක වෙති. සංස්ථාව විසින් සේවකයන්ගේ මාසික දළ වැටුපෙන් 15% ක් හා 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල වෙත දායක මුදල් බැර කරයි.

### 3.4 ප්‍රාග්ධන සංචිතය

රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබූ නිශ්චිත මුදල් හා ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අලෙවියෙන් ලැබුනු සමාකාලයේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අනුප්‍රාප්තික සමාගමේ නිකුත්කල ප්‍රාග්ධනය ලෙස පිහිටන ශුද්ධ අගය ප්‍රාග්ධන සංචිතයට බැර කොට ඇත.

### 3.5 රක්ෂණ සංචිතය

තෙවන පාර්ශවයක් සමග මාර්ගස්ථ රක්ෂණය නොකරන ආයතනය වලට අදාලව සැබෑ රක්ෂණ වියදමට සමාන මුදලක් රක්ෂණ සංචිතයට බැර කරනු ලැබේ.

3.6 **වෙළඳ ගෙවීම්**

ව්‍යාපාරයේ සාමාන්‍ය ගලායාමේදී සංස්ථාව විසින් සැපයුම්කරුවන් වෙත ගෙවීමට ඇති බැඳීම් වෙළඳ ගෙවීම් වේ. වෙළඳ ගෙවීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකම මත හඳුනාගනු ලබන අතර, ඉන්පසුව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ මැන බලයි.

3.7 **මූල්‍ය උපකරණ**

මූල්‍ය උපකරණයන්හි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සංස්ථාව එක් පාර්ශවයක් වන අවස්ථාවන්හිදී මූල්‍ය වත්කම් සහ බැරකම් හඳුනාගනු ලබයි. වත්කම් මඟින් මුදල් ප්‍රවාහ ලබාගැනීම සඳහා වන අයිතිය කල් ඉකුත්වූ අවස්ථා වලදී හෝ මාරුකරන ලද අවස්ථා වලදී සහ සංස්ථාව විසින් සෑම අවදානමක්ම හා ප්‍රතිලාභයක්ම සැලකිය යුතු ලෙස මාරු කරන ලද අවස්ථා වලදී මූල්‍ය වත්කම් අවප්‍රමාණය වේ. කොන්ත්‍රාත්තුවේ සඳහන් බැඳුම් විසර්ජනය කරන ලද විට, අවලංගු කරන ලද හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීම් අවප්‍රමාණය වේ. මූලික හඳුනා ගැනීමේදී, සංස්ථාවේ මූල්‍ය උපකරණ පහත සඳහන් කාණ්ඩ යටතේ කාණ්ඩ කර ඇත:

**(i) විකුණුම් ආයෝජන සඳහා පවත්නා උපකරණ**

මෙම කාණ්ඩය යටතේ නම් නොකරන ලද හෝ අනෙකුත් කාණ්ඩ යටතේ වර්ගීකරණය නොකරන ලද ව්‍යුත්පන්න නොවන උපකරණ විකුණුම් ආයෝජන සඳහා පවත්නා උපකරණ ලෙස ගැනේ. සංස්ථාවේ විකුණුම් වත්කම් යටතේ මුදල් හා සමාන දෑ ලෙස ගැනෙන වත්කම් හැර හිමිකම් සුරැකුම්පත් (ලේඛනගත කරන ලද සහ ලේඛනගත නොකරන ලද) ද, විකුණුම් ආයෝජන සඳහා පවත්නා කාණ්ඩයට ඇතුලත් වේ.

**(ii) ණය සහ ලැබියයුතු දෑ**

ණය සහ ලැබියයුතු දෑ ක්‍රියාකාරී වෙළඳපලේ මිල ගණන් ඉදිරිපත් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් සමඟ එන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. සංස්ථාවේ ණය සහ ලැබියයුතු දෑ අතරට වෙළඳ ලැබීම්, කාර්ය මණ්ඩලය සඳහා දෙනු ලබන ණය සහ මුදල් සමාන දෑ සහ ජංගම සහ ජංගම නොවන වත්කම් අන්තර්ගත වේ. ණය සහ ලැබීම් මූලික වශයෙන් හඳුනා ගනු ලබන්නේ ලැබියයුතු ප්‍රමාණයන්ගෙන් ණය සහ ලැබීම් වට්ටම් සහිතව සාධාරණ අගයක් දක්වා අඩු කිරීමෙන් ලැබෙන අගය වේ. ඒ අනුව, ණය සහ ලැබීම් මනිනු ලබන්නේ, ඵලදායී පොළී ක්‍රමයෙන් අඩු කිරීම් සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් එන ක්‍රමක්ෂිත පිරිවැය මඟිනි.

**(iii) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ වන මූල්‍ය බැරකම්**

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ වන මූල්‍ය බැරකම් සඳහා වෙළඳ ගෙවීම්, බැංකු ණය සහ දීර්ඝ කාලීන ණය අන්තර්ගත වේ. වෙළඳ ගෙවීම්, බැංකු ණය සහ දීර්ඝ කාලීන ණය අන්තර්ගත වේ. වෙළඳ ගෙවීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ලැබියයුතු ප්‍රමාණයන්ගෙන් ණය සහ ලැබීම් වට්ටම් සහිතව සාධාරණ අගයක් දක්වා අඩු කිරීමෙන් ලැබෙන අගය වේ. (හඳුනා ගැනීම සහ ගණනය කිරීම සඳහා 2.3.5 සහ 4.6 බලන්න.)

**මූල්‍ය වත්කම් අඩු කිරීම**

සෑම වාර්තාකරණ දිනයකදීම, මූල්‍ය වත්කම් අඩු කරන ලද විෂයානුකූල සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් තක්සේරු කරනු ලබයි. අඩුකරන ලද අලාභයක විෂයානුකූල සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීම සඳහා භාවිතා කරන ලද මිණුම්දණ්ඩ තුළ පහත සඳහන් අංග ඇතුලත් වේ:

(i) බන්ධනදායියාගේ කැපී පෙනෙන මූල්‍ය දුෂ්කරතා
(ii) මූලික ගෙවීමේ පොලිය පැහැර හැරීම; සහ
(iii) ණයකරු මූල්‍ය භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට පත්වීමේ සම්භාවිතාවක් ඇති බව.

කොටස් සුරැකුම් සඳහා, සුරැකුම්පත්වල පිරිවැයට අඩුවෙන් එහි සාධාරණ අගයේ කැපී පෙනෙන හෝ දීර්ඝ පහතයෑමක් පවතී නම් වත්කම්වල අඩුවීමක් පවතින බවට සාක්ෂියකි. එවැනි සාක්ෂියක් පවතී නම්, පහත සඳහන් පරිදි සංස්ථාව විසින් අලාභයේ අඩු වීමක් හඳුනා ගනී;

(i) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ එන මූල්‍ය වත්කම්: අලාභය යනු ණය මුදලේ ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හෝ ලැබිය යුතු ණය සහ උපකරණයේ මුල්ම එලදායී පොලී අනුපාතය භාවිත කරමින් වට්ටම් ලබාදීම මඟින් ඇස්තමේන්තුගත කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන අගය. දීමනා ගිණුමක් භාවිතා කිරීම මඟින් සෘජුවම හෝ වක්‍රව මෙම ප්‍රමාණය වත්කම්වල පවත්නා අගයෙන් අඩු කරනු ලබයි.

(ii) විකුණුම් මූල්‍ය වත්කම් සඳහා පවත්නා වත්කම්: අඩු කරන ලද අලාභය යනු වත්කම්වල මූලික පිරිවැය ගණනය කරන දිනයට ඒවායේ සාධාරණ අගය අතර වෙනසින්, ව්‍යුහාත්මක ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති අඩු කරන ලද අලාභයක් වෙතොත් එය අඩු කිරීමෙන් ලැබෙන අගය වේ. මෙම ප්‍රමාණය, ශුද්ධ ආදායමට නැවත වර්ගීකරණය කරන ලද සමුච්චිත අනෙකුත් ආදායමේ අලාභය, නියෝජනය කරයි.

අලාභයේ ප්‍රමාණය අඩු වේ නම් සහ එලෙස අඩුවීම් හඳුනා ගැනීමෙන් පසුව ඇතිවිය හැකි සිදුවීමකට විෂයානුබද්ධ ලෙස සම්බන්ධ කළ හැකි නම්, ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ ගණනය කරන ලද මූල්‍ය වත්කම් මත වන අඩු කරන ලද අලාභය පසු කාලපරිච්ඡේදය තුළදී ප්‍රතිවර්තනය කරනු ඇත. විකුණුම් සඳහා වන කොටස් මත වන අලාභ අඩුවීම් ප්‍රතිවර්තනය නොවේ.

## 4. අදායම් ප්‍රකාශනය

### 4.1 අදායම් හඳුනාගැනීම

යම් කාලපරිච්ඡේදයක් තුළදී, යම් ආර්ථික ක්‍රියාවලියක සාමාන්‍ය ක්‍රියාකාරකම් අතරතුර පැන නගින, ඒ සඳහා සහභාගිවන්නන්ගෙන් වන දායකත්වය සම්බන්ධව වන වැඩිවීම් හැර, සාධාරණ ප්‍රතිඵල ලබාදෙමින් ආර්ථික ප්‍රතිලාභ සිදුවන දළ ගලා ඒම ආදායමයි.

### 4.2 භාණ්ඩ විකිණීම

සාමාන්‍යයෙන් භාණ්ඩ යැවූ පසු එම භාණ්ඩ වලට අදාල ප්‍රමාණවත් අවදානම් හා ප්‍රතිලාභවල හිමිකම ගැනුම්කරු අතට පත්වන විට භාණ්ඩ විකිණීමේ ආදායම සැලකිල්ලට ගැනේ.

### 4.3 පොලී ආදායම සහ වියදම්

ආදායම් සැළකිල්ලට ගනුයේ වත්කමේ සඵල පොළී අනුපාතය පදනම් වන්නාවූ කාල අනුපාත ක්‍රමයකටය. පොළී වියදම් සහ ආදායම් උපචිත පදනම යටතේ ගණනය කරයි.

### 4.4 ලාභාංශ

ගෙවීම ලබාගැනීමට කොටස් හිමියන්ගේ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම් සැලකිල්ලට ගැනේ.

### 4.5 කුලී ආදායම

කුලී ආදායම ගණනය කරනුයේ බදු කොන්දේසි වලට අදාලව සරළ රේඛිය ක්‍රමය පදනම් කරගෙනය.

### 4.6 දේපළ පිරියත හා උපකරණ අලෙවිය මඟින් ලාභය/ (අලාභය) සහ අනෙකුත් ආදායම්

දේපළ පිරියත හා උපකරණ අලෙවිය මඟින් උපයන ලාභය/ (අලාභය) ඒවා අලෙවි කරන කාලපරිච්ඡේදය තුළදී හඳුනාගනු ලබන අතර එකී දත්ත අනෙකුත් ආදායම් යටතේ දක්වා ඇත.

### 4.7 අයෝජන සුරැකුම් වලින් ඉපැයීම් සහ අලාභ

ස්කන්ධ කොටස් සහ මූල්‍යමය උපකරණ අලෙවිය මඟින් උපයා ගන්නා ලද ඉපැයුම් හෝ අලාභයන්, ගනුදෙනුව සිදුකරන ලද දිනයට ගණනය කෙරේ.

### 4.8 මෙහෙයුම් වියදම්

ගෙවිය යුතු සෑම වියදමක්ම උපචිත පදනම යටතේ ඊට අදාල කාලපරිච්ඡේදය යටතේ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

## 5. අවිනිශ්චිත වගකීම්, බැඳීම් සහ නඩු

ආර්ථික ප්‍රතිලාභ හුවමාරුව අවිනිශ්චිත අවස්ථාවන්හිදී හෝ විශ්වාසයෙන් මැණිය නොහැකි අවස්ථාවනිහිදී, අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම සනාථ කරනු ලබන පිළිගත හැකි වගකීම් අවිනිශ්චිත වගකීම් වේ. අවිනිශ්චිත වගකීම් දුරස්ථ ඒවා නොවේ නම් ශේෂ පත්‍රයේ සඳහන් නොකරයි.

වර්තමාන නඩු ප්‍රධාන වශයෙන් ණය නැවත අයකර ගැනීම හා සම්බන්ධ වන අතර, සංස්ථාව විසින් ණය නොගෙවන සේවාදායකයන්ට විරුද්ධව නඩු මඟට බසින ලද අතර, අධිකරණ ක්‍රියාවලියක් හරහා ඒවා අයකර ගැනීමට කටයුතු කරයි. කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ වන කම්කරු ආරවුල් ද මෙවැනි නීතිමය කටයුතු වලට අන්තර්ගත වන අතර අනෙකුත් නීති ආයතන වන මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරන ලද නඩු බොහෝමයක් සංස්ථාවට පක්ෂපාතිව තිරණ ලැබුණු අතර, ඇතම් නඩු දෙපාර්ශවය විසින් සමගියෙන් විසඳා ගන්නා ලදී. හෙපින් ගනුදෙනුවේ හෙලිදරව් හැරුණුකොට, සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය කෙරේ කිසිඳු ආකාරයක බලපෑමක් ඇති නොවන බව සංස්ථාවේ හැඟීමයි. එබැවින් අදාල විධිවිධාන සිදුකර නොමැත.

පහත කෙටියෙන් දක්වා ඇති පරිදි බදු සම්බන්ධ කටයුතු වලට අදාලව නඩු තුනක් සංස්ථාව විසින් ගොනුකරන ලදී.

(i) නොබෙදූ ලාභ මත බදු ගණනය කිරීමේ පදනම හා සම්බන්ධව ඇති වූ 1997/98 ඇගයීම් වර්ෂ හා සම්බන්ධ නොබෙදූ ලාභ මත බදු පිළිබඳව නඩුවක් අභියාචනා අධිකරණයේ විභාග කෙරෙමින් පවති.

සමාලෝචන මණ්ඩලයේ තිරණය වුයේ නොබෙදූ ලාභ මත බදු සංස්ථාවේ පොත් ලාභ මත ගණනය කෙරෙනු ඇති බවයි. සමාලෝචන මණ්ඩලයේ තිරණයට එරෙහිව සංස්ථාව විසින් අභියාචනා කරන ලදී.

(ii) සමාලෝචන මණ්ඩලය විසින් ලබාදෙන ලද තිරණයට එරෙහිව සංස්ථාව විසින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. 1997.02.31 සිට 1997.12.31 දක්වා වන කාර්තුව තුළ යාත්‍රා තෙල් අපනයන අලෙවිය සඳහා වන පිරවැටුම් බද්දේ වගකීම සම්බන්ධව සමාලෝචන මණ්ඩලය විසින් ලබාදෙන ලද තිරණය සංස්ථාව විසින් නොසලකන ලදී.

(iii) 2007/08 වර්ෂය සඳහා නොබෙදූ ලාභ මත බදු ගණනය කිරීමේ පදනම සම්බන්ධව බදු අභියාචනා කොමිෂන් සභාවේ ගොනු කරන ලද අභියාචනය විභාග කෙරෙමින් පවති.

## 6. කොන්ත්‍රාත් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ රුචිය

පහත සඳහන් අනාවරණයන්ට අමතරව ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සමඟ වන කොන්ත්‍රාත්තු පිළිබඳව කිසිඳු අධ්‍යක්ෂකවරයෙකුට ඍජු හෝ වක්‍ර අයිතියක් නොමැත.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ 2/3 ක කොටස් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු වන අතර, සංස්ථාව විසින් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පහත සඳහන් අධ්‍යක්ෂවරු තිදෙනා පත්කරන ලදී.

- එල්.ජ්. සුසන්ත සිල්වා මයා - අධ්‍යක්ෂ
- සන්ධ්‍යා විජයබණ්ඩාර මිය - අධ්‍යක්ෂ
- එච්.ඩී.බී. සමන් කුමාර මයා - අධ්‍යක්ෂ

එල්.ජ්. සුසන්ත සිල්වා මහතා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂකවරයෙකුද වේ.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ශ්‍රී ලංකාව තුළ දියර ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු වල නිරතව සිටි. සංස්ථාව විසින් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත වර්ෂ 2012 දී රු. බිලියන 9.4 ක් දක්වා ගෙවීමක් කරන ලදී. ගෙවිය යුතු අධ්‍යක්ෂක ගාස්තු ගෙවීම 2011 අප්‍රේල් 29 දිනැති අංක PED58 රාජ්‍ය සමාගම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර සිදුකර ඇත.

## 7. හෙජින් ගනුදෙනුව

### ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එරෙහිව ලන්ඩන් නුවර වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව අතර අත්සන් කරන ලද ISDA ප්‍රධාන ගිවිසුම ප්‍රකාර ලන්ඩන් නුවර වාණිජ මහාධිකරණය දෙපාර්ශවය විසින් ගිවිසුම්ගත පොදු සංසදය විය. මතභේදාත්මක ගනුදෙනුව සම්බන්ධව 2008 දෙසැම්බර් 12 වන දින සිට 2009 අගෝස්තු 14 වන දින දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව වෙත එකතුව ඇ.ඩොලර් 161,733,500 ක් වන පරිදි ගෙවීම් නවයක් කිරීමට නීතියෙන් බැඳී ඇති බව එකී බැංකුව හිමිකම් ප්‍රකාශ කරන ලදී. ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව වෙත වාසි සහගත වන පරිදි මහාධිකරණය විසින් තීන්දුව ප්‍රකාශයට පත්කරන ලද අතර, ඇමරිකානු ඩොලර් 166,476,281 ක් සහ අදාල වියදම් එකී බැංකුව වෙත ගෙවීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නියෝග කරමින් 2011 අගෝස්තු 08 වන දින වන විට ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුවේ පිරිවැය වශයෙන් පවුම් 2,967,546 ක් වන අතුරු ගෙවීමක් ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව වෙත ගෙවන ලෙසටද වැඩිදුරටත් නියෝග කරන ලදී. 2011 සැප්තැම්බර් මසදී, ඉහත කී නඩු තීන්දුවට එරෙහිව අභියාචනා කිරීම සඳහා අවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීම වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඇපැල්කරුගේ නිවේදනයක් ගොනු කරන ලදී. 2011 ඔක්තෝම්බර් 31 දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුවේ ඇපෑල සඳහා වන පිරිවැය වෙනුවෙන් වන සුරැකුමක් ලෙස අධිකරණය වෙත පවුම් 500,000 ක් ගෙවන ලදී. 2012 ජුලි මස 27 වන දින, ඉංග්‍රිසි අභියාචනාධිකරණය විසින් ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුවට පක්ෂපාති ලෙස නියෝගය නිකුත් කරන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නීති උපදේශකවරු සහ ගරු නීතිපතිතුමා විසින් ලබාදෙන ලද උපදෙස් අනුව,

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් එංගලන්තයේ මහාධිකරණයේ අභියාචනා කිරීමට අවසර ගැනීම සඳහා ඉල්ලීමක් කරන ලදී.

ඇ.ඩොලර් මිලියන 60 ක මුදලක් සම්පූර්ණ සහ අවසානාත්මක සමථයක් වශයෙන් පිළිගනිමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ සමථයකට එළඹීමට එකඟ බව ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව විසින් ඔවුන්ගේ නීතිඥවරු මගින් ගරු නීතිපතිතුමා වෙත දන්වා ඇති බව 2013.02.20 දිනැති ගරු නීතිපතිතුමාගේ ලිපියෙන් දන්වා ඇති අතර, ගරු නීතිපතිතුමා විසින් තවදුරටත් දන්වා ඇත්තේ, එක්සත් රාජධානියේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිඵලය අවිනිශ්චිත බැවින් එවැනි ගිවිසුමකට එළඹීම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වාසිදායක වනු ඇති බවයි. සමථයකට පැමිණීම සඳහා වන යෝජනාව පිළිගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර, ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව සමඟ කෙටුම්පත් කරන ලද ගිවිසුමට එළඹීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය 2013.04.04 දින ලබා දෙන ලදී. කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි යෝජිත විශ්වසන ස්ථාපන ඔප්පුව සඳහා වන ගිවිසුම සඳහා ගරු නීතිපතිතුමාගේ අනුමැතිය ද ලබා ගන්නා ලදී.

කෙටුම්පත් කරන ලද විශ්වසන ස්ථාපන ඔප්පුව යටතේ වන සම්පූර්ණ සහ අවසානාත්මක සමථය ලෙස ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව වෙත ඇ.ඩොලර් මිලියන 60 ක් ගෙවීම සඳහා 1971 අංක 38 දරණ මුල්‍ය පනතේ 16 වන වගන්තිය සහ 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 24(ii) (ඉ) වගන්තිය ප්‍රකාර, මහජන බැංකුවෙන් ඇ.ඩොලර් මිලියන 60 ක් ණයට ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී.

පාර්ශවයන් දෙක විසින් එළඹෙන ලද විශ්වසන ස්ථාපන ඔප්පුව යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාර, ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව වෙත ඇ.ඩොලර් මිලියන 60 ක් ගෙවන ලදී.

2013 මැයි 29 දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා විසින් කෙටුම්පත් කරන ලද විශ්වසන ස්ථාපන ඔප්පුව අත්සන් තබන ලදී.

ඉහත සඳහන් කරන ලද විශ්වසන ස්ථාපන ඔප්පුව යටතේ ඇ.ඩොලර් මිලියන 60 ක් වන ගෙවීම ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව වෙත 2013 ජුනි මස 03 වන දින ගෙවන ලදී.

ඇපෑල සඳහා වන පිරිවැය වෙනුවෙන් වන සුරැකුමක් ලෙස මහාධිකරණයේ තැන්පත් කරන ලද මුදල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නැවත ගෙවන ලදී.

08. **ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සලකා බලා ඇති අතර, මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය අවස්ථාවන්හි දී අදාල ගැලපීම්/ අනාවරණය සිදුකර ඇත.

09. **අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | සංස්ථාව | | සමාගම | |
|---|---|---|---|---|
| | 2012<br>රු. මිලියන | 2011<br>රු. මිලියන | 2012<br>රු. මිලියන | 2011<br>රු. මිලියන |
| **1. ආදායම** | | | | |
| ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය | 512,910.308 | 356,442.364 | 512,910.308 | 356,442.364 |
| පර්යන්ත වියදම් සහ වෙනත් ආදායම් | -- | -- | 1,636.254 | 452.683 |
| | **512,910.308** | **356,442.364** | **514,546.562** | **356,895.047** |
| **2. විකුණුම් පිරිවැය** | | | | |
| දළ අන්තය ප්‍රකාර | 540,114.897 | 429,165.159 | 540,114.897 | 429,165.159 |
| මෙහෙයුම් අලාභ/ ලාභ | 324.297 | 284.552 | 324.297 | 284.552 |
| භුවමාරු විචල්‍යතා (බොරතෙල්/ තොග) | 33,253.812 | 7,843.352 | 33,253.812 | 7,843.352 |
| ල.වි.ම/ස්.ඛ.නි/ගුවන්තෙල් සේවා දායකයන්ගේ පොළිය | (5,120.213) | (9,222.491) | (5,120.213) | (9,222.491) |
| සෘජු වියදම් සහ වෙනත් | -- | -- | 6,826.802 | 5,899.117 |
| | **568,572.793** | 428,070.572 | **575,399.595** | 433,969.689 |
| **3. වෙනත් මෙහෙයුම් ආදායම්** | | | | |
| ලාභාංශ ආදායම | 0.003 | 0.003 | 0.003 | 0.003 |
| කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගන්නා ලද දඩ මුදල් | -- | -- | -- | -- |
| විවිධ ආදායම් | 428.081 | 223.906 | 518.139 | 356.602 |
| කුළී ආදායම් | 6.616 | 6.504 | 24.976 | 21.831 |
| | **434.700** | **230.413** | **543.118** | **378.436** |
| **3.1 විකුණුම් හා බෙදාහැරීමේ වියදම්** | | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය | 11,159.293 | 9,753.276 | 1,299.729 | 34.748 |
| ගුවන්යානා පර්යන්ත පිරිවැය | 1,077.129 | 816.123 | 1,077.129 | 816.123 |
| ක්ෂය වීම් | 396.674 | 292.066 | 396.674 | 292.066 |
| | 12,633.096 | 10,861.465 | 2,773.532 | 1,142.937 |
| **3.2 පරිපාලන වියදම්** | | | | |
| පරිපාලන වියදම් | 5,800.737 | 4,466.006 | (8,801.501) | 6,558.059 |
| භුවමාරු විචල්‍යතා | -- | (1,040.082) | -- | (1,040.082) |
| | 5,800.737 | 3,425.924 | (8,801.501) | 5,517.977 |

සලකා බලනු ලබන වර්ෂයේදී, හෙජින් ගනුදෙනු දෙකකට අදාළව නිති සහ අනෙකුත් අදාල සියළුම වියදම් ලෙස රු. මිලියන 192.01 ක අලාභයක් දරන ලද අතර, පරිපාලන වියදම් යටතේ මෙය අන්තර්ගත කර ඇත.

| | සංස්ථාව 2012 | සංස්ථාව 2011 | සමාගම 2012 | සමාගම 2011 |
|---|---|---|---|---|
| **3.3 මූල්‍ය පිරිවැය** | | | | |
| දීර්ඝ කාලීන ණය සඳහා පොළිය | 188.769 | 2,847.863 | 188.769 | 2,847.863 |
| බැංකු අයිරා සඳහා පොළිය | 0.352 | 100.950 | 0.352 | 100.95 |
| ගෙවිය යුතු විදේශ බිල්පත් සහ අනෙකුත් බැංකු ණය සඳහා පොළිය | 18,170.557 | 6,051.757 | 18,170.557 | 6,051.757 |
| වෙනත් | -- | -- | 0.522 | 1.470 |
| | **18,359.678** | **9,000.571** | **18,360.200** | **9,002.041** |
| **3.4 මූල්‍ය ආදායම** | | | | |
| භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම | 436.151 | 282.189 | 495.065 | 297.100 |
| විදේශ මුදල් ගිණුම් වලින් ලැබෙන පොළිය | 19.044 | 22.266 | 19.044 | 22.266 |
| ණය ලේඛන සඳහා පොළිය | 1,957.950 | 0.000 | 1,957.950 | -- |
| | **2,413.145** | **304.455** | **2,472.059** | **319.366** |
| **3.5 ආයෝජන දේපළ ආදායම්** | | | | |
| මල්පාර, තර්ස්ටන් පාර පිරවුම්හල් වලින් කුළිය | **38.976** | **24.657** | **38.976** | **24.657** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 4. දේපළ, පිරියත හා උපකරණ

### 4.1 දළ ධාරණ ප්‍රමාණය

| පිරිවැය | සංස්ථාව | | | | | | | සමාගම |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් හා ගොඩනැගිලි | නිරපේක්ෂ දේපළ | දේපළ යන්තෝපකරණ සහ උපකරණ | SPM පරිශ්‍රය | මෝටර් රථ | ගෘහ මෙවලම් කාර්යාලීය උපකරණ සහ වෙනත් වත්කම් | එකතුව | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2011.01.01 දිනට ශේෂය | 1,587.776 | 1.016 | 3,879.116 | 2,142.422 | 369.942 | 1,536.831 | 9,517.103 | 29,221.655 |
| එකතු කිරීම් | 68,524 | -- | 60.932 | -- | 3.304 | 46.151 | 178.911 | 7,561.333 |
| ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ල සඳහා අතිරේක ඉදිකිරීම් | 1,540.595 | -- | 32.934 | -- | -- | 192.922 | 1,766.451 | 1,766.451 |
| ගැලපීම් | (1.747) | -- | -- | -- | (1.307) | (0.022) | (3.076) | (12.208) |
| **2011.12.31 දිනට ශේෂය** | **3,195.147** | **1.016** | **3,972.982** | **2,142.422** | **371.939** | **1,775.882** | **11,459.388** | **38,537.231** |

### 4.2 ක්ෂය වීම්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2011.01.01 දිනට ශේෂය | 204.310 | 0.369 | 2,515.885 | 1,290.634 | 207.940 | 1,088.155 | 5,307.293 | 11,128.998 |
| වර්ෂය සඳහා පිරිවැය | 42.671 | 0.010 | 294.955 | -- | 14.966 | 63.957 | 416.589 | 1,556.693 |
| ඉවත් කිරීම් | (0.301) | -- | -- | -- | (1.307) | (0.019) | (1.628) | (10.76) |
| 2011.12.31 දිනට ශේෂය | 246.680 | 0.379 | 2,810.840 | 1,290.634 | 221.629 | 1,152.093 | 5,722.254 | 12,674.931 |
| **2011.12.31 දිනට ශුද්ධ පොත් අගය** | **2,948.467** | **0.637** | **1,162.142** | **851.788** | **150.310** | **623.789** | **5,737.134** | **25,862.300** |
| 2010.12.31 දිනට පිරිවැය | 1,587.776 | 1.016 | 3,879.116 | 2,142.422 | 369.942 | 1,536.831 | 9,517.103 | 29,221.653 |
| 2010.12.31 දිනට ගිණුම් ක්ෂය වීම් | 204.310 | 0.369 | 2,515.885 | 1,290.634 | 207.940 | 1,088.155 | 5,307.293 | 11,128.998 |
| **2010.12.31 දිනට ශුද්ධ පොත් අගය** | **1,383.466** | **0.647** | **1,363.231** | **851.788** | **162.002** | **448.676** | **4,209.810** | **18,092.655** |

### 2012.12.31 දිනට පිරිවැය

| 2012.12.31 දිනට පිරිවැය | සංස්ථාව | | | | | | | සමාගම |
|---|---|---|---|---|---|---|---|---|
විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

**(අ) තත්ත්වාගණනය කළ විගණන මතය - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ) තත්ත්වාගණනය කළ විගණන මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයේ අනුරූපතාවය

#### (අ) සංස්ථාවේ ප්‍රාග්ධන බාදනය

සංස්ථාව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 97,308 ක අලාභයක් දරා තිබුණු අතර පසුගිය වර්ෂ 4 ක විශාල අලාභයන් දැරීම හේතුකොට ගෙන 2012 වර්ෂය අවසානයට රු. මිලියන 228,545 ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් සංස්ථාවේ ඇතිවී තිබුණි. තවද, හෙජින් ගනුදෙනුව හේතුවෙන් සංස්ථාව දරන ලද පාඩුවේ සෘණාත්මක බලපෑම සංස්ථාවේ 2012 වර්ෂයේ අලාභය ඉහල යාමට හේතු වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයද තවදුරටත් වර්ධනය විය. එබැවින් මහා භාණ්ඩාගාරයේ සහ වෙනත් මූල්‍ය ආයතනවල මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙසට අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව සැක සහිතය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 5 සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/පාඩුව හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා රූප සටහනනෙහි දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ලාභ/(පාඩු) | වර්ෂ අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2007 | 3,984 | 13,568 |
| 2008 | (14,952) | (1,416) |
| 2009 | (11,567) | (13,038) |
| 2010 | (26,923) | (39,952) |
| 2011 | (94,503) | (131,324) |
| 2012 | (97,308) | (228,545) |



(ආ) **අංශ වශයෙන් පරිභෝජනය**

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙම මූල්‍ය දුෂ්කරතා මගහරවා ගැනීමේ අරමුණින් ඛණිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් 2011 හා 2012 වර්ෂයන්හි ඉහළ නංවා තිබුණද සංස්ථාව විසින් අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ 2011 සහ 2012 වර්ෂ සඳහා පාඩු ලැබූ නිෂ්පාදිත පහත වගුවෙන් ඉදිරිපත් කෙරේ.

| **අංශය** | **දෙසැම්බර් 31 දිනට මුළු පාඩුව** | |
|---|---|---|
| | **2012** | **2011** |
| | **රු. මිලියන** | **රු. මිලියන** |
| **ප්‍රවාහන** | | |
| පෙට්‍රල් ඔක්ටේන් 90 | (3,168) | - |
| ලංකා ඔටෝ ඩීසල් | (29,654) | (62,045) |
| **අංශයේ මුළු පාඩුව** | **(32,822)** | **(62,045)** |
| **විදුලිබල උත්පාදන** | | |
| ලංකා ඔටෝ ඩීසල් | (9,034) | - |
| නැප්තා | (1,048) | (798) |
| දැවි තෙල් 3500 | (8,718) | (9,206) |
| දැවි තෙල් 1500 | (23,223) | (18,313) |
| දැවි තෙල් 1500 (L/S) | (11,733) | (5,764) |
| **අංශයේ මුළු පාඩුව** | **(53,756)** | **(34,081)** |
| **ගුවන් කටයුතු** | | |
| AVTEUR-දේශීය | (476) | (718) |
| **අංශයේ මුළු පාඩුව** | **(476)** | **(718)** |
| **කර්මාන්ත** | | |
| දැවි තෙල් - 1500 | (2,003) | (4,248) |
| දැවි තෙල් - 800 | (904) | (1,790) |
| කර්මාන්ත භූමිතෙල් | (364) | (832) |
| **අංශයේ මුළු පාඩුව** | **(3,271)** | **(6,870)** |
| **දේශීය** | | |
| LP ගෑස් (K.G) | (377) | (224) |
| භූමිතෙල් | (3,525) | (6,886) |
| **අංශයේ මුළු පාඩුව** | **(3,902)** | **(7,110)** |

| | | |
|---|---|---|
| **ගොවීන්** | | |
| කෘෂි රසායන | (2) | (5) |
| **අංශයේ මුළු පාඩුව** | **(2)** | **(5)** |
| | | |
| **අපනයන** | | |
| නැප්තා අපනයන | (43) | (675) |
| දැවි තෙල් -1500 අපනයන | (70) | (329) |
| **අංශයේ මුළු පාඩුව** | **(113)** | **(1,004)** |
| | ------------ | ------------ |
| **මුළු පාඩුව** | **(94,342)** | **(111,833)** |
| | ====== | ====== |

ඉහත වගුව අනුව ප්‍රවාහන අංශයේ පෙට්‍රල් ඔක්ටේන් 90 හා විදුලිබල උත්පාදන අංශයේ ලංකා ඔටෝ ඩීසල් හැර අනෙකුත් සියලු නිෂ්පාදන 2011 හා 2012 වර්ෂයන්හිදී අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) මුළු කොටස්වලින් 2/3 ක් සංස්ථාව සතු බැවින්, එය 2010 වර්ෂයට සහ ඉන් ඉදිරියට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගමේ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සංස්ථාව විසින් 2011 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 01 (SLFRS 1) අනුව සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිතාවය පිළිබඳ විශාල සැකසහිත බවකට යොමු වී තිබුණි.

(ආ) 2012 ජනවාරි 01 දිනට පෙර අනුගමනය කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංගිප්‍ර) අනුව CPSTL (පරිපාලිතය) අත්පත් කර ගැනීමේ ලාභය සමූහයේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී එසැනින් හඳුනාගත යුතුව තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත (SLFRS 1) අනුව ව්‍යාපාර පවරා ගැනීම මත වූ රු. මිලියන 2,485.6 ක ලාභය, සමූහයේ ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී හඳුනාගෙන නොතිබුණු අතර එය 2012, 2011 හා 2010 වර්ෂවල සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංචිත වශයෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සටහන් අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 (ශ්‍රීලංගිප්‍ර 16) හි නිර්දේශ අනුව ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතයෙන් ගණනය කරන ලද විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභය හෙළිදරව් කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සඳහා පමණක් අවසර දෙනු ලැබූ මෘදුකාංගය භාවිතයෙන් සංස්ථාව විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභය ගණනය කර තිබූ බව අනාවරණය විය. ඒ අනුව, **ශ්‍රීලංගිප්‍ර 19 - සේවක වරප්‍රසාද ප්‍රමිතිය** පරිදි පාරිතෝෂික වෙන් කිරීමේ අවශ්‍යතාවය අනුගමනය කර නොතිබුණි.

(ඈ) ලබා දී තිබූ තොරතුරු අනුව මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන කාල පරිච්ඡේදයට පසු නමුත් නිකුත් කිරීමට අවසර ලබා දෙන දිනයට පෙර රු. මිලියන 347.43ක වටිනාකමින් යුත් සංස්ථාවට අවාසි සහගත නඩු 08 ක් බෙරුම් කර තිබූ බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට නොවිසඳුන ප්‍රධාන නඩු කිහිපයක් තිබුණි. කෙසේ වුවද, **ශ්‍රීලංගිප්‍ර 37 - වෙන් කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්** ප්‍රමිතියට අනුකූල වන පරිදි නීතිමය වගකීම් වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීම් හෝ හෙළිදරව් කිරීම් සමාලෝචිත වර්ෂය අවසාන දිනයට මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2012 වර්ෂය අවසාන දිනට සංස්ථාවේ දීර්ඝ කාලීනව ලැබිය යුතු හිඟ ශේෂ ඉකුත් වර්ෂය සමඟ සංසන්දනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු හිඟය** | |
|---|---|---|
| | **2012** | **2011** |
| | රු. | රු. |
| 1. බෙදුම්කරුවන් | 947,723,789 | 790,349,862 |
| 2. ගුවන්සේවා | 29,887,871,353 | 14,710,932,214 |
| 3. විදුලි ජනක පිරියත | 17,064,591,449 | 8,974,762,742 |
| 4. රජයේ පාරිභෝගිකයින් | 48,600,291,544 | 90,024,815,525 |
| 5. පුද්ගලික පාරිභෝගිකයින් | 574,893,541 | 263,130,856 |
| 6. කෘෂි රසායනික | 26,534,377 | 22,917,925 |
| 7. ලිහිසි තෙල් | 535,322,865 | 196,153,207 |
| 8. වෙනත් | 74 ,544 | 87,773,021 |
| **එකතුව** | **97,637,303,460** | **115,070,835,353** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු හිඟය වූ රු.97,637,303,460න් වර්ෂ 3 ඉක්මවූ හිඟ ශේෂය රු.236,070,922ක් වූ අතර 2013 වර්ෂයේදී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මඟින් ඉන් රු.158,526,585ක් පියවා තිබුණි. (වැඩි විස්තර ඇමුණුම 01 හි ඇත.)

(i) රු.20,162,906ක් හිඟ හිට තිබූ හා ඛණිජ තෙල් නිෂ්පාදන සැපයුමද අත්හිටුවා තිබූ ණය ගැතියන් 28 දෙනෙකුට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබූ අතර රු.6,928,864ක ලැබිය යුතු ශේෂයන්ගෙන් යුත් ඉහත සඳහන් ගනුදෙනුකරුවන් 13 දෙනෙකුගේ බෙදුම්කාරධූරත්වය අවලංගු කර තිබුණි.

(ii) තවද, වර්ෂ 05 ඉක්මවූ රු.322,760ක් වූ ලැබිය යුතු හිඟ ශේෂයකින් යුත් ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් රු.134,165 ක බොල් ණය ප්‍රතිපාදනය කර තිබුණි. එම හිඟ මුදල් හා බොල් ණය ප්‍රතිපාදන නොසලකා ඛණිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව එම ගනුදෙනුකරු හට සපයා තිබුණි.

(iii) රු.13,958,506ක වටිනාකමක් සඳහා මග නැහුම - පැළියගොඩ සමඟ මතභේදයක් ඇති වී තිබුණි.

(ආ) විද්‍යුත් බැංකු සහ දින 05 ණය බෙදුම්කරුවන් දහතුන්දෙනෙකුට, ගුවන්සේවා ගනුදෙනුකරුවන් හයදෙනෙකුට සහ විදුලි ජනක පිරියත ගනුදෙනුකරුවන් දෙදෙනෙකුට ණය පහසුකම් ඔවුන්ගේ බැංකු ඇපකරයන් ඉක්මවමින් ලබාදී තිබූ බව විගණන පරීක්ෂාවේදී තවදුරටත් නිරීක්ෂණය විය. (ඇමුණුම 02)

(ඇ) 2012 වර්ෂයේදී සංස්ථාව විසින් බෙදුම්කරුවන් දෙදෙනෙකුට, විදුලිජනක පිරියත ගනුදෙනුකරුවෙකුට සහ ගුවන්සේවා ගනුදෙනුකරුවන් දෙදෙනෙකුට එකතුව රු. මිලියන 33,981.1ක ණය පහසුකම් බැංකු ඇපකරයන් නොමැතිව ලබාදී තිබූ බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) 2006 අගෝස්තු 08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මූල්‍ය කළමණාකරු (ආදායම්) ගේ 2008 මාර්තු 24 දිනැති ලිපිය අනුව, සියයට 24 ක වාර්ෂික පොළී අනුපාතයක් ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂය මත අය කර ගත යුතුවේ. කෙසේ වුවද, සංස්ථාවේ කළමණාකරණය මෙම තීරණය විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දත්ත සැකසීම සහ තොග මට්ටම් සුපරීක්ෂණය වෙනුවෙන් සංස්ථාව විසින් භාවිතා කර තිබූ ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) මගින් හඳුන්වා දුන් හා ක්‍රියාත්මක කරන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) සඳහා වන පද්ධති යොදා ගැනීම සහ දත්ත ක්‍රියාවලි පද්ධතිය (SAP) මගින් ණය කාලය ඉක්මවූ නොපියවූ ඉන්වොයිස් මත පොළී ගණනය කිරීමේ පහසුකම සපයා නොතිබුණි. එම නිසා සංස්ථාව නොපියවූ ඉන්වොයිස් මත පොළිය අතින් ගණනය කර SAP පද්ධතිය යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව හිඟ හිටි ශේෂ මත අය කරනු ලබන පොළියෙහි නිවැරදිභාවය හා සම්පූර්ණභාවය පිළිබඳ සහතික වීමට හැකි වන පරිදි විධිමත් පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබූ බවට නිරීක්ෂණය විය.

(ii) 2011 වර්ෂයේ ගුවන්සේවා ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂයන් මත එකතුව රු.154,156ක් වූ පොළී ගාස්තු 2012 වර්ෂයේදී ආදායමක් වශයෙන් හඳුනාගෙන තිබුණි. එවැනි සිද්ධීන් ඇමුණුම 03 හි දැක්වේ.

(ඉ) හිඟ මුදල් එකතු කිරීම සඳහා විධිමත් පාලනයන්ගේ දුර්වලතාවය නිසා ලැබිය යුතු වටිනාකම් එකතු කර ගැනීමකින් තොරව භාරදීම මත චෙක්පත් පදනමින් වූ ගනුදෙනුකරුවන් (Cheque on Delivery - COD) සඳහා මුදල් පදනම මත (Hard Cash basis) අඛණ්ඩව සේවා සපයා තිබුණි. උදාහරණ වශයෙන් චෙක්පත් අගරු වීම මත හිඟ හිට තිබූ රු.58,399,795ක් වූ භාරදීම මත චෙක්පත් පදනමින් වූ ගනුදෙනුකරුවන්ගෙන් (COD) හිඟ හිට තිබූ මුදල් එකතු කිරීමකින් තොරව මුදල් පදනම මත අඛණ්ඩව සේවා සපයා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබිය යුතු මුදල් නොගෙවීමේ අවදානමක් පැවතුනි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) අධික වට්නාකමක් ලෙස දක්නට ලැබුණු රු.1,388,713,962ක චෙක්පත් අගරු වූ අවස්ථා 1,579ක් 2012 වර්ෂය තුලදී තිබුණි.

(ii) මේ සම්බන්ධයෙන් විධිමත් පාලනයක් නොමැති වීම හේතුවෙන් ගනුදෙනුකරුවන් ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය කර ගැනීම සඳහා මෙය පුරුද්දක් වශයෙන් යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුල චෙක්පත් අගරු වීම් සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවට අනුව රු.මිලියන 147.7 ක හිඟ හිටි ශේෂ ඇති ගනුදෙනුකරුවන් 11 දෙනෙකුගේ මෙවැනි සිද්ධීන් 213ක් නිරීක්ෂණය විය.

### 2.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් උපයා ගන්නා ලාභයෙන් සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවිය හැකිය. එසේ වුවද, අදාළ වර්ෂයන්හි සංස්ථාව පාඩු දරා තිබියදීත් 2008, 2009, 2010, 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 147ක් රු. මිලියන 148ක්, රු. මිලියන 179ක්, රු. මිලියන 175.6ක් හා රු. මිලියන 220.9ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ගෙවා තිබුණි.

### 2.2.5 හෙජින් ගනුදෙනුව

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ හෙජින් ගනුදෙනුවට අනුව වාණිජ බැංකු කිපයක් සමග එළඹ තිබුණු හෙජින් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ විශ්වසන ස්ථාපන ඔප්පුව යටතේ එ.ජ.ඩො මිලියන 60ක් (රු. මිලියන 7,612) ස්ටැන්ඩඩ් චාටඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබුණි. තවද, නීති හා වෙනත් වියදම් ලෙස එ.ජ.ඩො. මිලියන 15.3ක මුදලක් සංස්ථාව දරා තිබුණි. එම අවස්ථාවේදී සිටි බැංකුව සම්බන්ධයෙන් බේරුම්කරණ තීන්දුව සංස්ථාවට වාසිදායක ලෙස ඇ.ඩො.මිලියන 1.3ක (රු. මිලියන 153) මුදලක් ලැබී ඇත.

### 2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය. | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවම වශයෙන් ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින එක් සාමාජිකයෙකු හෝ ඇතුළත්ව නොතිබුණි. |
| (ආ) | 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය. | පුරප්පාඩු තනතුරක රාජකාරි ආවරණය කිරීමේ කාලය මාස තුනක කාලයකට සීමා විය යුතු වුවත් සේවකයන් 16 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාස 2 සිට වසර 2 ක කාලයක් පුරප්පාඩු තනතුරුවල රාජකාරි ආවරණය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින් ප්‍රතිඵලය රු. මිලියන 97,308ක ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු. මිලියන 94,503ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 2,805ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

එම අඛණ්ඩ මූල්‍ය පාඩු හා ප්‍රාග්ධන බාදනය සඳහා හේතු වූ ප්‍රධාන කරුණු ලෙස ඉතා අඩු ආන්තිකය, අඩු ප්‍රතිලාභ හා පිරිපහදුවේ නිතර සිදුවන වැඩ නැවැත්වීම් සමඟ අකාර්යක්ෂම මෙහෙයුම් හේතුවෙන් ඌනතාවයන් මඟහැර ගැනීම සඳහා පිරිපහදු කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයනයන් හේතුවෙන්, නැප්තා සහ දැවි තෙල් - 1500 අපනයනය, ගිවිසුම්ගත ගනුදෙනුකරුවන්ගේ මිලට වඩා අඩු සහන මිලකට ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හා මිහින් ලංකා සමාගමට ඉන්ධන සැපයීම, හෙජින් ගනුදෙනු තුලින් ඇති වූ අධික අලාභ, ඉන්ධන තෙල් සඳහා මූල්‍යායනය කිරීමට බැංකු අංශයෙන් ලබාගන්නා ණය සංස්ථාව විසින් වැඩි කිරීම, ඛණිජතෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාවයන්, ලංකා විදුලිබල මණ්ඩලයට සහනදායී රේටයකට දැවිතෙල් සැපයීම, විධිමත් තොග මට්ටම් පවත්වා ගැනීමේ වැඩසටහනක් හා ගබඩා පහසුකම් නොමැතිවීම හා ප්‍රමාද ගාස්තු ආදිය අනාවරණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) පිරිපහදු ක්‍රියාකාරීත්වයේ අකාර්යක්ෂමතාවය

රටේ වර්තමාන ඛණිජ තෙල් නිෂ්පාදිත අවශ්‍යතාවයෙන් දළ වශයෙන් 1/3ක් ආනයනය කෙරෙන බොරතෙල්වලින් දේශීයව පිරිපහදු ක්‍රියාවලිය සිදුකරන සපුගස්කන්ද පිහිටි ලංකා ඛණිජ තෙල් සංස්ථාවට අයත් පිරිපහදුවෙන් සපයා ගැනීමට අපේක්ෂිතය. කෙසේ වුවද, තෙල් පිරිපහදු නිෂ්පාදන ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ආනයනය කරන ලද බොරතෙල් ප්‍රමාණය ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 1,930,069 සිට මෙට්‍රික් ටොන් 1,619,078ක් දක්වා එනම්, සියයට 16.1කින් අඩුවී තිබුණි.

2012 වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 09ක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වර්ෂයකට යොදාගත් බොරතෙල් ප්‍රමාණය ඇස්තමේන්තුගත ප්‍රමාණය සමඟ සසඳා පහත දැක්වේ.

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

| වර්ෂය | නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගත් බොරතෙල් ප්‍රමාණය (ක්‍රියාත්මක කළ) | | වෙනස | |
|---|---|---|---|---|
| | අයවැය | සත්‍ය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| | (මෙට්‍රික් ටොන්) | (මෙට්‍රික් ටොන්) | (මෙට්‍රික් ටොන්) | (%) |
| 2012 | 2,242,500 | 1,596,058 | 646,442 | 28.83 |
| 2011 | 2,415,000 | 2,003,607 | 411,393 | 17.03 |
| 2010 | 2,242,500 | 1,752,716 | 489,784 | 21.84 |
| 2009 | 2,415,000 | 2,005,915 | 409,085 | 16.94 |
| 2008 | 2,242,500 | 1,870,237 | 372,263 | 16.60 |
| 2007 | 2,415,000 | 1,899,079 | 515,921 | 21.36 |
| 2006 | 2,415,000 | 2,140,132 | 274,868 | 11.38 |
| 2005 | 2,277,000 | 1,977,751 | 299,249 | 13.14 |
| 2004 | 2,415,000 | 2,216,646 | 198,354 | 08.21 |
| 2003 | 2,242,500 | 2,023,605 | 218,895 | 09.76 |

1969 වර්ෂයේදී ස්ථාපිත වර්ෂ 45 ක් පැරණි වූ මෙම පවත්නා පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛණිජ තෙල් නිෂ්පාදිත අවශ්‍යතාවයට සරිලන සේ සැපයීමට නොහැකි වී ඇති අතර, අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇතුළත් හා එමඟින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජතෙල් නිෂ්පාදිත වෙළඳ පොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. "*සංස්ථාවේ සභාපතිට අනුව පිරිපහදුවේ මුල් ධාරිතා සැලැස්ම දිනකට ටොන් 6,900ක් වුවත් බොර තෙල් වර්ග, සීමා කිරීම් (downstream restrictions), හා තදබල නිෂ්පාදන පිරිවිතර හේතුවෙන් එම ධාරිතාවය ළඟා කර ගැනීමට නොහැකි වී තිබේ. පිරිපහදුව ලාභදායී අයුරින් ක්‍රියාත්මක කිරීමට SOREM ව්‍යාපෘතියේ සඳහන් පරිදි පහළ මට්ටම්වල අඩු වටිනාකම්වලින් ඉහළ වටිනාකමින් යුත් නිෂ්පාදනවලට උසස් කිරීම කළ යුතුය.*"

**(ආ) ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගමට හා මිහින් ලංකා (පුද්ගලික) සමාගමට සහනාධාර මිලට ඉන්ධන සැපයීම**

ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම සහ මිහින් ලංකා පුද්ගලික සමාගම කොන්ත්‍රාත් පාරිභෝගිකයන් වුවද, කොන්ත්‍රාත් පාරිභෝගිකයන්ට නිකුත්කරන මිලට වඩා අඩු සහනදායී මිල මත ඉන්ධන නිකුත් කෙරෙන බැවින් කොන්ත්‍රාත් පාරිභෝගික මිල හා සැසඳීමේදී සංස්ථාව අතිවිශේෂ සහනදායී මිල ගණන්වලට ඉහත සමාගම් සඳහා ගුවන් සේවා ටර්බයින් ඉන්ධන අලෙවියෙන් 2011 හා 2012 වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 669.8ක් සහ රු. මිලියන 456.6ක් පාඩු දරා ඇත. විස්තර පහත පරිදි වේ.

| සමාගමේ නම | වර්ෂය සඳහා දරා ඇති පාඩු ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | 2012 | | 2011 | |
| | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 3.29 | 423.97 | 5.47 | 627.16 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 0.25 | 32.58 | 0.38 | 42.61 |
| **එකතුව** | **3.54** | **456.55** | **5.85** | **669.77** |

සහනදායී මිල යටතේ මෙම සමාගම් දෙකට ඉන්ධන සපයා තිබියදීත් හිඟ හිටි ඉන්ධන බිල් පියවීම ඉතා දුර්වල තත්ත්වයක තිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් හිඟ හිටි ශේෂය අනුමත ණය සීමාව ඉක්මවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ දෙකක හිඟ හිටි ශේෂයන් පහත දැක්වේ.

| සමාගමේ නම | දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය | | |
|---|---|---|---|
| | 2012 | 2011 | 2010 |
| | රු. | රු. | රු. |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 25,890,118,810 | 12,351,426,871 | 541,542,674 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 3,416,102,041 | 1,227,020,419 | 361,235,191 |

මිහින් ලංකා පුද්ගලික සමාගම විසින් සපයා තිබූ ණයට විකුණුම් සඳහා වන බැංකු ඇපකරයේ වටිනාකම ඇ.ඩො. 200,000ක් (රු.21,900,000) හා ඒ අනුව අවදානම අඩු කර ගැනීම සඳහා ලබා දිය යුතු ණය සීමාව ඒ හා සමාන හෝ ඊට අඩු අගයක් විය යුතුය. කෙසේ වුවද, සංස්ථාව විසින් එම සමාගම වෙත ලබා දී තිබූ ණය සීමාව 2012 දෙසැම්බර් 31 දිනට රු.3,200,000,000ක් හා සංස්ථාව විසින් සපයන ලද ණය පහසුකම රු.3,416,102,041ක් විය. ඒ අනුව සංස්ථාව විසින් ලබා දී තිබූ ණය සීමාව, බැංකු ඇපකරය (රු.21,900,000), රු.3,178,100,000කින් ඉක්මවා තිබුණි. මේ අවස්ථාවේදී සංස්ථාව විසින් එම සමාගම වෙත ලබා දී තිබූ ණය පහසුකම, ණය සීමාව රු.216,102,041කින්ද, බැංකු ඇපකරය රු.3,394,202,041කින්ද ඉක්මවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ හිටි ශේෂයන්ගේ එකතුව වන රු.3,416,102,041ක් බැංකු ඇපකරය මගින් ආවරණය නොවී අනාරක්ෂිතව පැවතුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම සහ මිහින් ලංකා (පුද්ගලික) සමාගම පිළිවෙලින් රු. බිලියන 18.8 ක් සහ රු. බිලියන 4.9ක් වූ මුදල් 2013 වර්ෂය තුළ භාණ්ඩාගාර බැඳුම්කර යොදාගෙන පියවා තිබුණි.

**(ඇ) බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් ඉහළ දැමීම**

සංස්ථාව විසින් ඛණිජ තෙල් බිල්පත් පියවීම සඳහා බැංකු වලින් ණය ලබා ගැනීම වැඩි කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැනට පවතින අලාභය වැඩිවී තිබූ අතර සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය තවදුරටත් අඩුවී තිබුණි. තවද, ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේදී සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධික මූල්‍ය පිරිවැයක් දරා තිබූ බව නිරීක්ෂණය වූ අතර එය පහත විස්තර වන පරිදි වැඩි වන උපනතියක් පෙන්නුම් කෙරේ.

| වර්ෂය | බැංකු ණය දෙසැම්බර් 31 දිනට | මූල්‍ය පිරිවැය | මෙහෙයුම් කටයුතු මත වාර්ෂික පාඩුව | මූල්‍ය පිරිවැය, මෙහෙයුම් කටයුතු මත වාර්ෂික පාඩුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| 2012 | 399.52 | 18,359.68 | 89,569.18 | 20.5 |
| 2011 | 310.06 | 9,000.57 | 94,503.45 | 9.5 |
| 2010 | 168.02 | 6,858.90 | 26,922.82 | 25.5 |

පහත පරිදි සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විදේශ ණය ගැනීම් සඳහා සංස්ථාව වෙනුවෙන් මහා භාණ්ඩාගාරය බැංකු සඳහා ලබාදී තිබුණු ඇප සීමාවන් සංස්ථාව විසින් ඉක්මවා තිබුණි.

| බැංකුවේ නම | 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය | | මහා භාණ්ඩාගාරය ලබා දුන් ඇප සීමාවන් | | ඇප සීමාවන් ඉක්මවීම් | |
|---|---|---|---|---|---|---|
| | ඇ.ඩො.මි. | රු.මිලියන | ඇ.ඩො.මි. | රු.මිලියන | ඇ.ඩො.මි. | රු.මිලියන |
| ලංකා බැංකුව | 1,789.39 | 230,741 | 900 | 115,938 | 889.39 | 114,803 |
| මහජන බැංකුව | 1,274.79 | 164,384 | 200 | 25,764 | 1,074.79 | 138,620 |

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සංස්ථාවේ ප්‍රධාන කර්මාන්ත තරඟකරු වන ඉන්දියානු තෙල් සමාගමේ (මව් සමාගම) සහාය ඇතිව ශ්‍රී ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් සංවර්ධනය කරන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියට (ERP) සංස්ථා දත්ත පදනම සම්බන්ධ කිරීමෙන් ඇතිවන අවදානම පිළිබඳ විධිමත් ඇගයීමක් සංස්ථාව විසින් සිදුකර නොතිබුණි. සංස්ථාවට මෙම කාර්යය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක එහි සම්පත් (ප්‍රාග්ධන හා මානව සම්පත්) යෙදවීමට සිදුව ඇති බැවින් ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණයන්ගේ සහාය ඇතිව මෙම පද්ධති ඒකාබද්ධ කිරීම මඟින් පැන නගින බලපෑම් පිළිබඳ විධිමත් හා ගැඹුරු විශ්ලේෂණයක් සිදු කළ යුතුව තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ පාර්ශවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියට අනුකූලවන පරිදි සංස්ථාව විසින් එහි උපකරණ ආදිය වැඩිදියුණු කිරීම සඳහා යොදවන ලද ප්‍රාග්ධනය හා මානව සම්පත් වෙනුවෙන් වැය කරන මුදල් පිළිබඳ සැලකිල්ලට ගනිමින් පූර්ව ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස ගිවිසුමක්/සිහිපතක් තිබීමද ඉතා වැදගත් වේ.

## 4.3 ඛනිජතෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදනය

රාජ්‍ය ව්‍යවසාය කමිටු සභාපති විසින් කරන ලද විධානය යටතේ 2011 ජූනි 01 සිට 2012 ජූනි 30 දක්වා කාල පරිච්ඡේදය තුළ සංස්ථාව විසින් සිදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදනයන් පිළිබඳ විශේෂ විගණනයක් මා විසින් සිදු කරන ලද අතර එම වාර්තාව 2013 ජූනි මාසයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ඒ අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් නොමැති වීම, ප්‍රසම්පාදන පරිපාටියේ දුර්වලතා, විශ්වසනීය රසායනාගාර පරීක්ෂණ නියමිත අවස්ථාවන්හි සිදු නොකිරීම, පැහැදිලි සන්නිවේදනයක් හා වෙනස්වන වෙළඳපොළ අභියෝග සඳහා සූදානම් වීමක් නොමැති වීම, වැඩිපුර ගෙවීම්, ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදනය සඳහා සැලසුම් නියෝග ප්‍රමාදවීම, ඉහළ හා පහළ ඔක්ටේන් පෙට්‍රල් අනාර්ථිකව මිශ්‍ර කිරීම ආදිය හේතුවෙන් 2012 ජනවාරි 01 සිට ජූනි 30 දක්වා මාස 06ක කෙටි කාලපරිච්ඡේදය තුළ සංස්ථාව රු. බිලියන 3.2ක ඇස්තමේන්තුගත පාඩුවක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ගැටළු සංස්ථාවේ කීර්තියට මෙන්ම රටේ ආර්ථිකයටද සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් ඉහත වාර්තාවෙන් පෙන්වා දෙන ලද ප්‍රධාන කරුණු පිළිබඳ කෙටි සාරාංශයක් පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම | | |
| --- | --- | --- | --- |
| | එජඩො | විනිමය අනුපාතය[1]/ තථ්‍ය රේටයන්[2] | රුපියල් |
| ලියාපදිංචි ගාස්තු අය කිරීමෙන් තොරව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම. | 7,200.00 | 130.0000[2] | 936,000 |
| නැව්ගත කරන මාසයේ ඕනෑම දින 5ක් සඳහා "platts" මිල ගණන් යොදා ගැනීමට සැපයුම්කරුට (සිංගප්පූරු තෙල් සමාගම) ඉඩ දීමේ ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව දරන ලද පාඩුව. (බීකේ/52/2011, බීකේ/53/2011, බීකේ/56/2011, බීකේ/58/2011, බීකේ/59/2011) | 2,284,459.61 | 114.6035[2] | 261,807,074 |
| සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකමින් (outturn) පාඩු අඩු කිරීම හේතුවෙන් ඛනිජ තෙල් සංස්ථාව විසින් දරන ලද පාඩුව. (බීකේ /10/2011) | - | - | 16,438,314 |
| සංස්ථාවේ මෙහෙයුම් අකාර්යක්ෂමතා හා පර්යන්ත සීමා හේතුවෙන් සැපයුම්කරුවන් විසින් ප්‍රමාද ගාස්තු ඉල්ලුම් කිරීම. | 726,867.31 | 127.1608[1] | 92,429,029 |
| වෙනත් නැව් නියමිත වෙලාවට පැමිණි නමුත් සංස්ථාවේ නෞභාරය නිදහස් කර ගැනීම ප්‍රමාද වීම නිසා එම නැව්වලින් බඩු තොග මුදා හැරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු එම නැව් විසින් ඉල්ලුම් කිරීම. | 136,644.10 | 127.1608[1] | 17,375,773 |

| | | | |
|---|---|---|---|
| ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු. | 31,366.67 | 127.1608[1] | 3,988,611 |
| ඉන්ධන තෙල් ආනයනය කිරීම සඳහා තෝරා ගත් සැපයුම්කරු සමඟ ගිවිසුම් අත්සන් කිරීමේදී වූ ප්‍රමාදයන් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් විදුලිය කපා හැරීම වැළැක්වීම සඳහා වෙනත් සැපයුම්කරුවන්ගෙන් ඉතා හදිසි පදනම මත ඉහළ මිලකට ප්‍රසම්පාදනයන් සිදු කිරීම හේතුවෙන් සංස්ථාව දරන ලද පාඩුව. (බීකේ/49/2011) | 1,995,000.00 | 127.1608[1] | 253,685,796 |
| "එයාර්" පදනම සිට "වැකියුම්" පදනමට ප්‍රමාණය වෙනස්වීම හේතුවෙන් සංස්ථාව දරන ලද පාඩුව. (බීකේ /011/062) | 18,013.24 | 127.1608[1] | 2,290,578 |
| සල්ෆර් අඩු ඉන්ධන තෙල් වෙනුවට ඔටෝ ඩීසල් විකිණීම හේතුවෙන් සංස්ථාව විසින් දරන ලද පාඩුව. | - | - | 1,614,148,800 |
| විකුණුම්කරුට වාසි වන පරිදි ඩීසල් සඳහා ඩීර්එස් කොළඹ මිල ගණනය කිරීමේ පදනම වෙනස් කිරීමට හා මාසය (නැව්ගත කරන මාසය හෝ බෙදාහැරීම් මාසය) තෝරා ගැනීමට විකුණුම්කරුවන්ට ඉඩදීම හේතුවෙන් සංස්ථාව දරන ලද ඇස්තමේන්තුගත පාඩුව. | 5,499,781.67 | 127.1608 | 699,356,637 |
| **එකතුව** | | | **3,224,514,929** |

වි

**නිමය අනුපාතය[1]**

*2012 දෙසැම්බර් 31 දිනට මහ බැංකු වාර්තාවට අනුව විනිමය අනුපාත (විදේශ මුදල් පිළිබඳ දිනපතා දැක්වෙන රේටයන් 31.12.2012)*

| *රට* | *මුදල් වර්ගය* | *දැක්වෙන රේටය (රු.)* |
|---|---|---|
| *එක්සත් රාජධානිය* | *ස්ටර්ලින් පවුම* | *205.4728* |
| *ඇමෙරිකා එක්සත් ජනපදය* | *ඩොලර්* | *127.1608* |

### 4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් වත්කම් එම වත්කම් අත්කරගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

| වත්කමේ ස්වභාවය | නිරීක්ෂණය |
|---|---|
| (අ) වනාතමුල්ල හල්ගහකුඹුර ඉඩම - | එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා මෙම ඉඩම රු.මිලියන 10.6 කට අත්කර ගෙන තිබුණි. කෙසේ වුවද, එම අරමුණ සඳහා මෙම ඉඩම මෙතෙක් උපයෝජනය කර නොතිබුණි. |
| (ආ) මාහේන ඉඩම | ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා රු. මිලියන 0.625 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම් ගත කර නොතිබූ අතර 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි. |

### 4.5 මානව සම්පත් කළමනාකරණය

2012 දෙසැම්බර් 31 දින වන විට විධායක මට්ටමේ තනතුරු 72ක් (අභ්‍යන්තර විගණන කළමනාකරු, වානිජ කළමනාකරු, නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (අලෙවි) ) සහ පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු සේවක මණ්ඩල තනතුරු 277ක් ඇතුළුව විවිධ වර්ගයේ තනතුරු 349ක් පුරප්පාඩුවද, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල තනතුරු 2ක් අතිරික්තවද පැවැති බව නිරීක්ෂණය වූ අතර අනෙකුත් තනතුරු 29ක් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන තිබුණි. මේ අතරින් 2011 වසර මැද සිට ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරේ වැඩ ආවරණය කරමින් පැවැතුණි. මූල්‍ය පාලක තනතුර ඇතුළුව අනෙකුත් සේවක මණ්ඩල කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගන්නා ලෙස භාණ්ඩාගාරයේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2011 වසරේදී ලැබී තිබූ නමුත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරණය විසින් මෙතෙක් එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි.

2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ.

| වර්ගය | අනුමත කාර්ය මණ්ඩල | තථ්‍ය කාර්ය මණ්ඩල | | | පුරප්පාඩු/ (අතිරික්ත) ගණන |
|---|---|---|---|---|---|
| | | ස්ථිර සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම යටතේ සේවක සංඛ්‍යාව | මුළු සේවක සංඛ්‍යාව | |
| විධායක ශ්‍රේණිය | 372 | 300 | 01 | 301 | 71 |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | 1,286 | 1,277 | 11 | 1,288 | (2) |
| පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු | 1,347 | 1,060 | 10 | 1,070 | 277 |
| **එකතුව** | **3,005** | **2,637** | **22** | **2,659** | **346** |

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී තිබුණේ 2014 මාර්තු මස 28 වන දිනදීය.

### 5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

- (අ) දේපල, පිරියත හා උපකරණ
- (ආ) ණය ගැතියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ
- (ඇ) ණය හිමියෝ සහ වෙනත් ගෙවිය යුතු දෑ
- (ඈ) ගිණුම්කරණය
- (ඉ) නීති, රීති ආදියට අනුකූල වීම
- (ඊ) ප්‍රසම්පාදන
- (උ) සම්පත් උපයෝජනය
- (ඌ) මානව සම්පත් කළමනාකරණය
- (එ) වත්කම් කළමනාකරණය
- (ඒ) ප්‍රසාද දීමනා ගෙවීම

**එච්.ඒ.එස්.සමරවීර**
**විගණකාධිපති**

*ඇමුණුම 1*

**2012 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන හිඟ හිටි ණය ගැති ශේෂ**

| ගනුදෙනුකරු වර්ගය | එකතුව | වසර 1ට අඩු | වසර 1 සිට 2 දක්වා | වසර 2 සිට 3 දක්වා | වසර 3 සිට 4 දක්වා | වසර 4 සිට 5 දක්වා | වසර 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| බෙදුම්කරුවන් | 947,723,789 | 921,264,713 | 6,732,321 | 5,147,824 | 20,140 | 36,770 | 14,522,021 |
| කෘෂි රසායනික | 26,534,377 | 17,949,328 | 239,809 | 0 | 1,660,066 | 58,379 | 6,626,795 |
| විදුලි ජනක පිරියත - ලංවිම | 27,823,749,142 | 21,680,771,075 | 6,142,978,067 | 0 | 0 | 0 | 0 |
| වෙනත් විදුලි ජනක පිරියත | 17,064,591,449 | 17,064,591,449 | 0 | 0 | 0 | 0 | 0 |
| ගුවන් සේවා | 29,887,871,353 | 28,880,881,294 | 746,710,853 | 260,279,206 | 0 | 0 | 0 |
| රජයේ පාරිභෝගිකයින් | 20,776,542,402 | 13,666,157,354 | 4,633,923,912 | 2,285,017,899 | 154,018,504 | 28,610,886 | 8,813,847 |
| පුද්ගලික පාරිභෝගිකයින් | 574,893,541 | 318,430,503 | 34,035,329 | 200,724,194 | 14,090,475 | 0 | 7,613,039 |
| ලිහිසි තෙල් | 535,322,865 | 491,957,482 | 15,775,077 | 27,590,306 | 0 | 0 | 0 |
| වෙනත් | 74,544 | 74,544 | 0 | 0 | 0 | 0 | 0 |
| මුළු එකතුව | **97,637,303,460** | **83,042,077,741** | **11,580,395,369** | **2,778,759,429** | **169,789,185** | **28,706,036** | **37,575,701** |

<u>*ඇමුණුම 2*</u>

**බැංකු ඇපකර හා ණය සීමාව ඉක්ම වූ හිඟ හිටි ණය ශේෂ**

**(i) ඊ බැංකු සහ දින 5 ණය බෙදුම්කරුවන්**

| ගිණුම් අංකය | බැංකු ඇපකර වටිනාකම | ණය සීමාව | හිඟ හිටි ණය ශේෂය | | බැංකු ඇපකර ඉක්මවූ වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | දිනය | වටිනාකම | |
| | රු. | රු. | | රු. | රු. |
| 100570 | 3,700,000 | 3,750,000 | 14/04/2012 | 3,853,519 | 153,519 |
| | | | 06/05/2012 | 4,384,967 | 684,967 |
| | | | 06/05/2012 | 5,340,308 | 1,640,308 |
| | | | 07/05/2012 | 4,384,967 | 684,967 |
| 100170 | නැත | විශේෂ ණය | 08/11/2012 | 12,077,416 | 12,077,416 |
| | | | 03/12/2012 | 12,097,026 | 12,097,026 |
| | | | 05/12/2012 | 7,716,050 | 7,716,050 |
| | | | 07/12/2012 | 8,673,517 | 8,673,517 |
| 100322 | 3,000,000 | 3,500,000 | 13/02/2012 | 3,594,132 | 594,132 |
| | | | 15/02/2012 | 4,469,136 | 1,469,136 |
| | | | 22/02/2012 | 5,156,400 | 2,156,400 |
| | | | 24/07/2012 | 4,477,317 | 1,477,317 |
| | | | 09/10/2012 | 4,449,328 | 1,449,328 |
| | | | 15/12/2012 | 4,451,419 | 1,451,419 |
| 100228 | නැත | විශේෂ ණය | 24/02/2012 | 8,534,743 | 8,534,743 |
| | | | 31/12/2012 | 6,565,809 | 6,565,809 |
| 100499 | 4,050,000 | 4,050,000 | 22/08/2012 | 4,114,480 | 64,480 |
| | | | 02/10/2012 | 4,120,952 | 70,952 |
| | | | 10/11/2012 | 4,175,389 | 125,389 |
| | | | 23/11/2012 | 4,858,341 | 808,341 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 100413 | 2,500,000 | 2,500,000 | 28/04/2012 | 3,422,259 | 922,259 |
| | | | 06/05/2012 | 3,532,991 | 1,032,991 |
| | | | 12/05/2012 | 3,823,723 | 1,323,723 |
| | | | 21/05/2012 | 3,378,540 | 878,540 |
| 100465 | 9,000,000 | 9,000,000 | 08/04/2012 | 10,202,499 | 1,202,499 |
| | | | 16/04/2012 | 9,816,169 | 816,169 |
| | | | 21/04/2012 | 9,819,174 | 819,174 |
| | | | 12/05/2012 | 10,134,921 | 1,134,921 |
| 100470 | 12,000,000 | 12,000,000 | 01/12/2012 | 13,333,063 | 1,333,063 |
| | | | 05/12/2012 | 13,213,162 | 1,213,162 |
| | | | 10/12/2012 | 14,475,690 | 2,475,690 |
| | | | 14/12/2012 | 14,805,945 | 2,805,945 |
| | | | 15/12/2012 | 13,664,948 | 1,664,948 |
| | | | 20/12/2012 | 16,142,007 | 4,142,007 |
| | | | 22/12/2012 | 16,847,812 | 4,847,812 |
| | | | 24/12/2012 | 16,379,924 | 4,379,924 |
| 100486 | 3,800,000 | 3,800,000 | 07/04/2012 | 4,638,705 | 838,705 |
| | | | 14/04/2012 | 4,798,056 | 998,056 |
| | | | 04/04/2012 | 5,538,741 | 1,738,741 |
| | | | 14/04/2012 | 6,221,511 | 2,421,511 |
| | | | 23/09/2012 | 6,953,453 | 3,153,453 |
| 100627 | 6,500,000 | 6,500,000 | 21/02/2012 | 6,527,489 | 27,489 |
| | | | 11/07/2012 | 8,259,243 | 1,759,243 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 100641 | 8,350,000 | 8,350,000 | 21/04/2012 | 8,819,628 | 469,628 |
| | | | 21/04/2012 | 9,560,313 | 1,210,313 |
| | | | 23/04/2012 | 8,630,787 | 280,787 |
| | | | 24/04/2012 | 8,559,657 | 209,657 |
| | | | 04/05/2012 | 9,282,732 | 932,732 |
| | | | 21/05/2012 | 8,618,372 | 268,372 |
| | | | 29/12/2012 | 8,714,253 | 364,253 |
| 100649 | | 8,500,000 | 12/03/2012 | 12,000,531 | 3,500,531 |
| | | | 16/03/2012 | 12,342,201 | 3,842,201 |
| | | | 17/03/2012 | 12,789,571 | 4,289,571 |
| | | | 20/03/2012 | 13,405,045 | 4,905,045 |
| | | | 21/03/2012 | 15,113,775 | 6,613,775 |
| | | | 24/03/2012 | 16,195,135 | 7,695,135 |
| | | 7,000,000 | 17/04/2012 | 16,305,404 | 9,305,404 |
| | | | 26/04/2012 | 17,448,706 | 10,448,706 |
| | | | 04/05/2012 | 19,208,571 | 12,208,571 |
| 100042 | 16,000,000 | 16,000,000 | 12/12/2012 | 16,011,046 | 11,046 |
| | | | 14/12/2012 | 16,011,046 | 11,046 |
| | | | 15/12/2012 | 17,495,056 | 1,495,056 |

**(ii)** ගුවන්සේවා ගනුදෙනුකරුවන්

| ගිණුම් අංකය | බැංකු ඇපකර වටිනාකම | | ණය සීමාව | හිඟ හිටි ණය ශේෂය | | බැංකු ඇපකර ඉක්මවූ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | | දිනය | වටිනාකම | |
| | ඇ.ඩො. | රු. | රු. | | රු. | රු. |
| 101111 | 1,200,000 | 152,400,000 | 150,000,000 | 08/10/2012 | 169,979,077 | 17,579,077 |
| | | | | 09/10/2012 | 186,277,677 | 33,877,677 |
| | | | | 15/10/2012 | 189,382,875 | 36,982,875 |
| | | | | 22/10/2012 | 174,675,600 | 22,275,600 |
| | | | | 24/12/2012 | 155,635,106 | 3,235,106 |
| | | | | 25/12/2012 | 167,907,863 | 15,507,863 |
| | | | | 26/12/2012 | 159,936,810 | 7,536,810 |
| 101115 | | 5,000,000 | 44,075,000 | 05/01/2012 | 62,676,239 | 15,451,239 |
| | | 10,000,000 | 44,075,000 | 09/01/2012 | 69,506,634 | 22,281,634 |
| | 175,000 | 22,225,000 | 44,075,000 | 23/01/2012 | 76,858,684 | 29,633,684 |
| | | 10,000,000 | 44,075,000 | 02/02/2012 | 83,428,580 | 36,203,580 |
| | | | 44,075,000 | 03/05/2012 | 77,861,285 | 30,636,285 |
| | | | 46,875,000 | 13/12/2012 | 64,134,559 | 16,909,559 |
| | | | 46,875,000 | 27/12/2012 | 71,954,789 | 24,729,789 |
| | | | 46,875,000 | 31/12/2012 | 67,279,933 | 20,054,933 |
| 103135 | 100,000 | 12,700,000 | 12,500,000 | 14/11/2012 | 13,783,373 | 1,083,373 |
| | | | | 15/11/2012 | 14,498,435 | 1,798,435 |
| | | | | 18/11/2012 | 15,187,219 | 2,487,219 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 103261 | 65,000 | 8,255,000 | 8,125,000 | 17/07/2012 | 9,201,616 | 946,616 |
| | | | | 01/11/2012 | 11,766,876 | 3,511,876 |
| | | | | 03/11/2012 | 12,330,675 | 4,075,675 |
| | | | | 11/11/2012 | 22,599,988 | 14,344,988 |
| 103488 | 400,000 | 50,800,000 | 50,000,000 | 03/05/2012 | 53,366,559 | 2,566,559 |
| | | | | 11/06/2012 | 53,578,947 | 2,778,947 |
| 101142 | 200,000 | 21,900,000 | 3,200,000,000 | 31/12/2012 | 3,416,102,041 | 3,394,202,041 |

*(2012 දෙසැම්බර් 31 දිනට ඇ.ඩො. 1 = රු. 127)*

**(iii)** විදුලි ජනක පිරියත ගනුදෙනුකරුවන්

| ගිණුම් අංකය | බැංකු ඇපකර වටිනාකම | ණය සීමාව | හිඟ හිටි ණය ශේෂය | | බැංකු ඇපකර ඉක්ම වූ වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | දිනය | වටිනාකම | |
| | රු. | රු. | | රු. | රු. |
| *102305 | 263,520,000 | 285,341,497 | 03/01/2012 | 285,048,104 | 21,528,104 |
| | | 274,444,503 | 25/02/2012 | 274,922,393 | 10,924,503 |
| | | | 24/03/2012 | 271,947,348 | 8,427,348 |
| 101858 | නැත * | 8,700,000,000 | 31/12/2012 | 8,073,055,528 | 8,073,055,528 |

* සංස්ථාව සහ විදුලි ජනක පිරියත ගනුදෙනුකරුවන් අතර ණය පහසුකම් සම්බන්ධව ගිවිසුමක් තිබුණි.

*ඇමුණුම 3*

2011 වර්ෂයේ ගුවන්සේවා ගනුදෙනුකරුවන්ගේ හිඟ හිටි ශේෂයන් මත පොළී ගාස්තු 2012 වර්ෂයේදී ආදායමක් වශයෙන් හඳුනාගෙන තිබූ අවස්ථා.

| බිල්පත් අංකය | ඉන්වොයිස් දිනය | පියවූ දිනය | ණය කාලය | ඉන්වොයිස් වටිනාකම | හිඟ හිටි දින ගණන | | හිඟ හිටි පොළිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2011 | 2012 | 2011 | 2012 |
| | | -- | | රු. | | | රු. | රු. |
| 600842237 | 19/12/2011 | 6/1/2012 | දින 8 | 5,584,850.24 | 4 | 6 | 14,689 | 21,973 |
| 600848716 | 21/12/2011 | 11/1/2012 | දින 8 | 4,458,819.93 | 2 | 11 | 5,864 | 32,162 |
| 600848718 | 22/12/2011 | 11/1/2012 | දින 8 | 5,284,362.80 | 1 | 11 | 3,475 | 38,117 |
| 600843073 | 20/12/2011 | 6/1/2012 | දින 8 | 855,618.03 | 3 | 6 | 1,688 | 3,366 |
| 600841718 | 19/12/2011 | 6/1/2012 | දින 8 | 1,097,857.31 | 4 | 6 | 2,888 | 4,319 |
| 600839938 | 18/12/2011 | 6/1/2012 | දින 8 | 792,280.26 | 5 | 6 | 2,605 | 3,117 |
| 600839537 | 17/12/2011 | 6/1/2012 | දින 8 | 1,111,192.61 | 6 | 6 | 4,384 | 4,372 |
| 600846875 | 22/12/2011 | 13/1/2012 | දින 8 | 793,320.95 | 1 | 13 | 522 | 6,763 |
| 600845172 | 21/12/2011 | 13/1/2012 | දින 8 | 712,211.47 | 2 | 13 | 937 | 6,071 |
| 600841729 | 19/12/2011 | 2/1/2012 | දින 8 | 604,488.17 | 4 | 2 | 1,590 | 793 |
| 600843087 | 20/12/2011 | 2/1/2012 | දින 8 | 588,931.67 | 3 | 2 | 1,162 | 772 |
| 600845187 | 21/12/2011 | 2/1/2012 | දින 8 | 235,552.60 | 2 | 2 | 310 | 309 |
| 600846913 | 22/12/2011 | 2/1/2012 | දින 8 | 322,216.91 | 1 | 2 | 212 | 423 |
| 600841733 | 19/12/2011 | 9/1/2012 | දින 8 | 916,733.44 | 4 | 9 | 2,411 | 5,410 |
| 600846939 | 22/12/2011 | 10/1/2012 | දින 8 | 788,876.63 | 1 | 10 | 519 | 5,173 |
| 600838628 | 16/12/2011 | 12/1/2012 | දින 8 | 644,491.76 | 7 | 12 | 2,967 | 5,071 |
| 600839903 | 18/12/2011 | 12/1/2012 | දින 8 | 466,700.85 | 5 | 12 | 1,534 | 3,672 |
| 600839945 | 18/12/2011 | 12/1/2012 | දින 8 | 492,257.39 | 5 | 12 | 1,618 | 3,874 |
| 600845184 | 21/12/2011 | 12/1/2012 | දින 8 | 666,656.58 | 2 | 12 | 877 | 5,246 |
| 600824302 | 7/12/2011 | 13/1/2012 | දින 8 | 291,132.30 | 16 | 13 | 3,063 | 2,482 |
| 600826733 | 8/12/2011 | 13/1/2012 | දින 8 | 315,578.23 | 15 | 13 | 3,113 | 2,690 |
| 600828726 | 9/12/2011 | 13/1/2012 | දින 8 | 1,073,411.38 | 14 | 13 | 9,881 | 9,150 |
| 600829345 | 10/12/2011 | 13/1/2012 | දින 8 | 1,206,753.99 | 13 | 13 | 10,315 | 10,287 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 600829869 | 11/12/2011 | 13/1/2012 | දින 8 | 1,045,631.33 | 12 | 13 | 8,250 | 8,914 |
| 600831931 | 12/12/2011 | 13/1/2012 | දින 8 | 980,071.21 | 11 | 13 | 7,089 | 8,355 |
| 600832745 | 13/12/2011 | 13/1/2012 | දින 8 | 983,405.32 | 10 | 13 | 6,466 | 8,383 |
| 600835130 | 14/12/2011 | 13/1/2012 | දින 8 | 882,286.32 | 9 | 13 | 5,221 | 7,521 |
| 600836756 | 15/12/2011 | 13/01/2012 | දින 8 | 1,154,529.15 | 8 | 13 | 6,073 | 9,842 |
| 600836986 | 15/12/2011 | 13/01/2012 | දින 8 | 4,499,216.47 | 8 | 13 | 23,667 | 38,354 |
| 600838582 | 16/12/2011 | 13/01/2012 | දින 8 | 1,085,634.92 | 7 | 13 | 4,997 | 9,255 |
| 600839496 | 17/12/2011 | 13/01/2012 | දින 8 | 1,163,417.44 | 6 | 13 | 4,590 | 9,918 |
| 600839904 | 18/12/2011 | 13/01/2012 | දින 8 | 136,749.15 | 5 | 13 | 3,737 | 9,690 |
| 600841675 | 19/12/2011 | 13/01/2012 | දින 8 | 1,127,859.72 | 4 | 13 | 2,966 | 9,615 |
| 600843044 | 20/12/2011 | 13/01/2012 | දින 8 | 1,130,082.07 | 3 | 13 | 2,229 | 9,633 |
| 600845133 | 21/12/2011 | 13/01/2012 | දින 8 | 1,147,759.78 | 2 | 13 | 1,509 | 9,784 |
| 600846766 | 22/12/2011 | 13/01/2012 | දින 8 | 1,125,538.16 | 1 | 13 | 740 | 9,595 |
| එකතුව | | | | | | | **154,156** | **324,471** |

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| Avn | - | ගුවන්තෙල් අංශය |
| Bbl | - | බැරලය (ජාත්‍යන්තර ඛනිජතෙල් විකිණීමේ ඒකකය) |
| bps | - | සාමාන්‍ය ලකුණු |
| BTR | - | තොග චලනය |
| CEB | - | ලංකා විදුලිබල මණ්ඩලය |
| CIF | - | පිරිවැය රක්‍ෂණ හා නැව් ගාස්තු |
| CPC | - | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| CPSTL | - | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම |
| EPF | - | සේවක අර්ථසාධක අරමුදල |
| ETF | - | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල |
| FIFO | - | ප්‍රථම ලැබීම් හා ප්‍රථම නිකුත් කිරීම් |
| FOB | - | නැවතෙක් නොමිලේ |
| FOREX | - | විනිමය අනුපාතය |
| GOSL | - | ශ්‍රී ලංකා අණ්ඩුව |
| ICPA | - | ජාත්‍යන්තර සමුපකාර ඛනිජ තෙල් සංගමය |
| Int | - | පොළිය |
| LIOC | - | ලංකා ඉන්දියානු තෙල් සමාගම |
| LMS | - | ලංකා මැරයින් සමාගම |
| LPG | - | සම්පිඩිත දියර වායු |
| Ltr | - | ලිටරය |
| MOU | - | අවබෝධතා ගිවිසුම |
| NDB | - | ජාතික සංවර්ධන බැංකුව |
| NSL | - | ජාතික ආරක්‍ෂක බද්ද |
| OPEC | - | තෙල් නිෂ්පාදනය හා ආපනයනය කරන රටවල් සංවිධානය |
| SPBM | - | ඒකස්ථාන පාවෙන බෝයාව |
| TT | - | පිරිවැටුම් බදු |
| VAT | - | වටිනාකම් එකතුකළ අගය මත බද්ද |